









# රට
# ප්‍රථමයෙන්

**ජාතික රක්ෂණ භාර අරමුදල**
**වාර්ෂික වාර්තාව 2017**







# පටුන


| | |
|---|---|
| අපගේ දැක්ම සහ අපගේ මෙහෙවර | 1 |
| ආයතනික තොරතුරු | 2 |
| මූල්‍ය තත්ත්වය පිළිබඳ වැදගත් කරුණු | 3 |
| හිමිකාරිත්වය සහ ව්‍යවස්ථාපිත විධිනියෝගය | 6 |
| ආයතනික ඉලක්ක | 7 |
| ඉතිහාසය සැකෙවින් | 10 |
| වර්ෂයේ සමාලෝචනය | 11 |
| අධ්‍යක්ෂක මණ්ඩලය | 14 |
| අධ්‍යක්ෂක මණ්ඩලයේ පැතිකඩ | 16 |
| ආයතනික සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම | 18 |
| ණය ශ්‍රේණිගත කිරීම සහ ස්ථාවරත්වය | 20 |
| නිෂ්පාදන සහ සේවා | 21 |
| සේවා බෙදාහැරීමේ ජාලය | 22 |
| සභාපතිතුමාගේ පණිවිඩය | 24 |
| ප්‍රධාන විධායක නිලධාරියාගේ මෙහෙයුම් සමාලෝචනය | 28 |
| රට වෙනුවෙන් දායකත්වය | 30 |
| 2017 වර්ෂයේ ආයතනික සමාජ වගකීම් ක්‍රියාකාරකම් | 31 |
| මෙහෙයුම් පරිසරය | 32 |
| මෙහෙයුම් සමාලෝචනය | 36 |
| ව්‍යවසාය පාලනය | 45 |
| ව්‍යවසාය අවදානම් කළමනාකරණය | 49 |
| අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව | 52 |
| විගණන කමිටු වාර්තාව | 53 |


## මූල්‍ය ප්‍රකාශන


| | |
|---|---|
| IBNR සහ LAT සහතික | 57 |
| විගණකාධිපතිවරයාගේ වාර්තාව | 58 |
| මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය | 82 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | 83 |
| ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය | 84 |
| මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය | 86 |
| මූල්‍ය ප්‍රකාශ පිළබඳ සටහන් | 88 |
| දෙළොස් වසරක සංඛ්‍යාත්මක සාරාංශය | 116 |

# අපගේ දැක්ම

**ආරක්ෂාව අවැසි සියලු අංශයන්ට**
**රැකවරණය හා ආරක්ෂණ ජාලයක්**

# අපගේ මෙහෙවර

ශ්‍රී ලංකාවේ සමාජමය හා ආර්ථික සංවර්ධනයට දායක වීම සඳහා:

සමාජයෙහි අවශ්‍යතා සහිත සියලුම අංශයන් අරඹයා දැරිය හැකි, ඵලදායී, කාර්යක්ෂම හා ප්‍රගතිශීලී රක්ෂණ ක්‍රම ලබාදීම.

වෙනස් වන අවශ්‍යතාවන් තුළින් පැන නඟින ඉහළ අවදානම් ආවරණය කරනු පිණිස සම්පත් ඒකරාශී කිරීමෙන් හා වෙනත් වැඩ පිළිවෙල තුළින් දේශීය වෙළෙඳපොලට විසඳුම් සලසාලීම.

දේශීය රක්ෂණ වෙළෙඳපොළට අතිරේක ධාරිතාවය සැපයීම සඳහා ශ්‍රී ලංකාව තුළ ප්‍රතිරක්ෂණ වෙළෙඳපොලක් නිර්මාණය කිරීම.

# රටට මුල්තැන දෙමින්

පසුගිය වර්ෂ කිහිපය අපට ඉගැන්වූ යමක් වී නම්, ඒ ජීවිතය අවිනිශ්චිත බවයි. රූපකාර්ථයෙන් මෙන්ම වචනාර්ථයෙන් ද කුණාටු වැනි වූ දුෂ්කරතා වලින් රට ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකිකයන් මහත් පරිශ්‍රමයක් දරමින්, එහෙත් සාමූහිකව පෙළ ගැසී සිටියහ. එය ප්‍රජාව තුළ අපගේ භූමිකාවේ වැදගත්කම අපට නැවත මතක් කරවීමට සමත් විය. ඔවුන්ගේ අවශ්‍යතාවයන් සපුරාලීම සහතික කිරීම සඳහා අප හැකි උපරිමයෙන් කටයුතු කළෙමු.  එසේ පැමිණි අභියෝගයන් අතරතුර අපව ශක්තිමත් කර ගැනීමටද ක්‍රියා කරමින් අප ද සෙමෙන් නමුත් නිසැකවම ප්‍රගතියක් ලැබූවෙමු. සමාජයේ බොහෝ විට නොසලකා හැරීමට ලක්වූ කොටස් ආරක්ෂා කිරීමේ අපගේ මෙහෙවර සමඟ අපගේ ක්‍රියාවන් ඉතා උනන්දුවෙන් හසුරුවමින්, සමාලෝචනයට භාජනය වූ අපගේ වර්ෂය අපි ඔබට ඉදිරිපත් කරන්නෙමු. එය ජාතික රක්‍ෂණ භාර අරමුදල වන අප විසින් රටට මුල් තැන දුන් වර්ෂයකි.

# ආයතනික තොරතුරු

### ආයතනයේ නම
ජාතික රක්ෂණ භාර අරමුදල

### නීතිමය ආකෘතිය
ජාතික රක්ෂණය යටතේ ස්ථාපනය කරන ලද
ව්‍යවස්ථාපිත මණ්ඩලය
භාරකාර අරමුදල් පනත. 2006 අංක 28

### ලියාපදිංචි කාර්යාලය
අංක 95, UPTO ගොඩනැගිල්ල
සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත
කොළඹ 02,
ශ්‍රී ලංකාව.

### සබඳතා තොරතුරු
පොදු දුරකතන අංකය :+94 11 2026600
ෆැක්ස් : +94 112 338 778 / +94 114 366 003
විද්‍යුත් තැපෑල: mail@nitf.lk හෝ
විද්‍යුත් තැපෑල: mails@nitf.lk
වෙබ් අඩවිය: http:// www.nitf.lk

### මණ්ඩලයේ සාමාජිකයින් (2019.01.11 දිනට)
මංජුල ද සිල්වා මහතා (සභාපති)
ට්‍රෙවීන් ප්‍රනාන්දුපුල්ලේ මහතා
අසේන්ද්‍ර සිරිවර්ධන මහතා
චන්දන කුමාරසිංහ මහතා
රෝහන ද සිල්වා මහතා
ඩී. පී. ජී. ප්‍රදීප් මහතා
සී. ජයසූරිය මහතා

මවාහිබ් මොව්ජුඩ් මහතා (2019.01.11 දින සිට මේ
වන තෙක් සභාපති)

### මණ්ඩලයේ ලේකම්
උදාරි රන්හොට්ගමගේ මිය

### බාහිර විගණකවරුන්
විගණකාධිපතිවරයා
ජාතික විගණන කාර්යාලය
නො. 306/72, පොල්දූව පාර
බත්තරමුල්ල

### බැංකුකරුවන්
- මහජන බැංකුව
- ලංකා බැංකුව
- ජාතික ඉතිරිකිරීමේ බැංකුව

# මූල්‍ය තත්ත්වය පිළිබඳ වැදගත් කරුණු

| | 2016 | 2017 | වෙනස |
|---|---|---|---|
| දළ ලිඛිත වාරිකය (රු. මිලියන) | 6,845 | 9,071 | 33% |
| ශුද්ධ ඉපැයූ වාරිකය (රු. මිලියන) | 8,851 | 11,614 | 31% |
| ශුද්ධ ප්‍රතිලාභ හා හිමිකම් (රු. මිලියන) | 5,543 | 9,901 | 79% |
| බදු වලට පෙර ලාභය (රු. මිලියන) | 2,840 | 1,077 | -62% |
| ආයෝජන හා වෙනත් ආදායම (රු. මිලියන) | 984 | 1,143 | 16% |
| බදු වලින් පසු ලාභය (රු. මිලියන) | 2,839 | 976 | -66% |
| සමස්ථ වත්කම් (රු. මිලියන) | 19,516 | 18,553 | -5% |

## දළ ලිඛිත වාරිකය

(රු. මිලියන)




## ශුද්ධ ඉපැයූ වාරිකය

(රු. මිලියන)




## ශුද්ධ ප්‍රතිලාභ හා හිමිකම්

(රු. මිලියන)




## බදු වලින් පසු ලාභය

(රු. මිලියන)




## සමස්ථ වත්කම්

(රු. මිලියන)




## ආයෝජන හා වෙනත් ආදායම

(රු. මිලියන)




ඔබගේ මහන්සිය
කිසිවිටකත් අපතේ
නොයන බව
සහතික කරමින්


ඔබට ආරක්ෂාව
හා රැකවරණය
සලසමින්

# හිමිකාරීත්වය සහ ව්‍යවස්ථාපිත විධිනියෝගය

ජා.ර.භා.අ යනු 2006 අංක 28 දරණ ජාතික රක්ෂණ භාර අරමුදල් පනත මගින් පිහිටුවන ලද පූර්ණ වශයෙන් ශ්‍රී ලංකා රජය සතු ව්‍යාපාරයකි.

## ව්‍යවස්ථාපිත විධිනියෝගය

ජා.ර.භා.අ හි විධිනියෝගය ජා.ර.භා.අ පනත මගින් පහත අයුරින් අර්ථ දැක්වේ:

- වාණිජ රක්ෂණ සංවිධාන විසින් මෙහෙයවනු ලබන දායක රක්ෂණ යෝජනා ක්‍රමයක් සහ එවැනි අරමුණක් සඳහා පිහිටුවා ඇති වෙනත් අරමුදල් මගින් සෞඛ්‍යය, පෞද්ගලික අනතුරු සහ දේපළ වලට හානිවීම වැනි අනපේක්ෂිත අවදානම් වලට එරෙහිව රාජ්‍ය සේවයේ සහ පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් හට රජය විසින් ප්‍රතිලාභ සහ ආරක්ෂාව ලබා දේ.

- සමෘද්ධි ප්‍රතිලාභීන්, ගොවීන්, ධීවරයින් සහ ස්වයං රැකියාවල නියුතු පුද්ගලයින් ඇතුළුව සමාජයේ වඩාත් අවදානමට ලක්විය හැකි කොටස්වල යහපත සඳහා ද රජය විසින් ප්‍රතිලාභ යෝජනාක්‍රම සහ රක්ෂණ යෝජනාක්‍රම ක්‍රියාත්මක කරයි.

- එවන් රක්ෂණයක් සහ වෙනත් ප්‍රතිලාභ යෝජනාක්‍රම විධිමත් කිරීමට රජය අපේක්ෂා කරන අතර, ඒ සඳහා ඉහත පහසුකම් වඩාත් ඵලදායී හා සම්බන්ධීකරණය වූ ආකාරයකින් ලබා දීමට හැකිවන පරිදි ජාතික රක්ෂණ භාර අරමුදලක් පිහිටුවීමට රජය අදහස් කරනු ලබයි. මෙම පනත ප්‍රකාරව ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ඇති සියලුම පුද්ගලයින්ට උපරිම ප්‍රතිලාභ හිමි වන බව මෙයින් බලාපොරොත්තුවේ.

# ආයතනික ඉලක්ක

01

වෘත්තීය හා පාරිභෝගික හිතකාමී ප්‍රතිරක්ෂණකරුවෙකු ලෙස සහ ජාත්‍යන්තර හොඳම භාවිතයන්ට අනුකූලව ඉහළම සේවා ප්‍රමිතීන් සපුරාලමින් ශ්‍රී ලංකා රක්ෂණ වෙළඳපොළේ ප්‍රතිරක්ෂණ අවශ්‍යතා සඳහා සම්පූර්ණ විසඳුම් ලබා දීම.

02

ජාත්‍යන්තර ප්‍රතිරක්ෂණ වෙළඳපොලේ පිළිගත් ප්‍රතිරක්ෂණකරුවෙක් වීම සඳහා සංවිධානයේ නෛතික ව්‍යුහය ශක්තිමත් කරමින් වසර පහක් ඇතුළත ජාත්‍යන්තර ප්‍රතිරක්ෂණ සැපයුම්කරුවෙකු බවට පත් වීම.

03

2017 වන විට ශ්‍රී ලංකාවේ වඩාත්ම ජනප්‍රිය ප්‍රතිරක්ෂණ සමාගම සහ 2019 වන විට රු. බිලියන 50 ක ශුද්ධ වටිනාකමක් සහිතව ආසියානු කලාපයේ ප්‍රමුඛ ප්‍රතිරක්ෂණ සමාගම බවට පත්වීම.

04

සමාජයේ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් / අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ රක්ෂණ අවශ්‍යතා සපුරාලීම සහ සාමාන්‍ය වාණිජ රක්ෂණකරුවෙකු රක්ෂණ විසඳුම් ලබා නොදෙන අවදානම් ප්‍රදේශ කෙරෙහි අවධානය යොමු කිරීම.

05

ශ්‍රී ලංකාවේ ගොවීන්ගේ ජීවන තත්ත්වයන් සහ කෘෂිකාර්මික ව්‍යාපාරයෙහි වාණිජමය ශක්‍යතාව ඉහළ නැංවීම සඳහා කෘෂිකාර්මික කර්මාන්තයට සහ එහි පාර්ශවකරුවන්ට රක්ෂණ විසඳුම් ලබා දීම.

06

රජයේ සේවකයින් සහ අනෙකුත් අවශ්‍යතා ඇති කණ්ඩායම් යන දෙපිරිසටම සේවය කරමින් රටේ වඩාත්ම කාර්යක්ෂම හා ඵලදායී සෞඛ්‍ය රක්ෂණ සැපයුම්කරුවා සහ හිමිකම් ප්‍රදායකයා බවට පත් වීම.

# ආයතනික ඉලක්ක

**07**

ශ්‍රී ලංකාවේ තොරතුරු කේන්ද්‍රස්ථානය සහ වෘත්තීය රක්ෂණ දැනුම් මධ්‍යස්ථානය ලෙස ජාතික රක්ෂණ භාර අරමුදල ස්ථානගත කිරීම.

**08**

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ උපරිම ඵල නෙලා ගැනීම සඳහා රජයේ ආයතන සමඟ ඇති සම්බන්ධතාවය ශක්තිමත් කරමින් සියලුම රාජ්‍ය ආයතනයන්හි වඩාත්ම වරණීය රක්ෂණ සැපයුම්කරු බවට පත්වීම.

**09**

ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීම සඳහා තමන්ගේම ප්‍රාග්ධනයක් සහිතව වෙනම වාණිජ ආයතන දෙකක් (රජය සතු සීමිත වගකීම් සමාගම්) ස්ථාපිත කිරීමෙන් භාරකාර අරමුදල් මණ්ඩල ව්‍යුහය තිරසාර ආයතනික ව්‍යුහයක් බවට පරිවර්තනය කිරීම. සාමාන්‍ය රක්ෂණ සමාගම ප්‍රතිරක්ෂණ සමාගමේ අනුබද්ධ ආයතනයක් විය හැකිය. ජීවිත රක්ෂණ ව්‍යාපාරයට අවතීර්ණ වීමට අවශ්‍ය නම් දෙවන අනුබද්ධිත ආයතනයක් පිහිටුවිය යුතුය.

**10**

පරිසර ආරක්ෂාව සඳහා පැහැදිලි කැපවීමක් සහිතව හරිත ආයතනයක් බවට පත්වීමෙන් සමාජයීය වශයෙන් වගකීම් සහගත වීම.

**11**

සාමාන්‍ය රක්ෂණය සහ ප්‍රතිරක්ෂණය යන දෙකෙහිම පාරිභෝගික තෘප්තිය ලබා දෙමින් කඩිනම් හිමිකම් පියවීම සඳහා පහසුකම් සපයන ගතික පද්ධතියක් ස්ථාපනය කිරීම.

**12**

ජා.ර.භා.අ හි මූල්‍ය ශක්තිය හා ස්ථාවරත්වය නිරූපණය කරන ජාත්‍යන්තර මූල්‍ය ශ්‍රේණිගත කිරීමක් ලබා ගැනීම.

**13**

විනිවිදභාවය තහවුරු කිරීම සඳහා වෘත්තීය ගිණුම්කරණ සහ වාර්තාකරණ පද්ධතියක් සහ විගණන කාර්යයක් ඇති කිරීම.

**14**

විවිධාංගීකරණය වූ ආයෝජන විකල්පයන්හි නිරත වීමට අවසර ලබා ගැනීමෙන් පසු සීමිත ආයෝජන ශ්‍රිතය ගතික මෙහෙයුම් ශ්‍රිතයක් බවට පරිවර්තනය කිරීම.

**15**

වර්තමානයේ අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ භුක්ති විඳින රජයේ සේවකයින්ට උසස් සේවාවක් සැපයීම සඳහා සෞඛ්‍ය සේවා ක්ෂේත්‍රය සමඟ උපායමාර්ගික හවුල්කාරිත්වයකට එළඹීම.

**16**

දිස්ත්‍රික් ලේකම් කාර්යාල වැනි රජයේ මෙහෙයුම් ව්‍යුහයන් භාවිත කරමින් ජා.ර.භා.අ හි පැතිරීම සහ දෘශ්‍යතාව ඉහළ නැංවීම.

**17**

රාජ්‍ය අංශය යටතේ පවතින සමාන ආයතන සමඟ ඒකාබද්ධව කටයුතු කිරීම.

**18**

ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්ත වෘත්තිකයන් අතර සේවය කිරීමට වඩාත්ම ප්‍රියතම ආයතනය බවට ජා.ර.භා.අ පත් කිරීම සඳහා කුසලතා කළමනාකරණ ප්‍රතිපත්තියක් සහ මානව ප්‍රාග්ධනය වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලියක් ඇති කිරීම.

# ඉතිහාසය සැකවින්

## 2006

ජා.ර.භා.අ මඟින් මෙහෙයවනු ලබන දායකත්ව රක්ෂණ යෝජනාක්‍රම හරහා අනපේක්ෂිත සෞඛ්‍ය අවදානම්, පුද්ගල අනතුරු හා දේපල හානි වලට එරෙහිව ප්‍රතිලාභ ලබාදීම හා ආරක්ෂාව සැලසීම සඳහා 2006 අංක 28 දරණ ජාතික රක්ෂණ භාර අරමුදල් පනත මගින් ජාතික රක්ෂණ භාර අරමුදල (ජා.ර.භා.අ) ස්ථාපිත කරන ලදි.

## 2007

- ජා.ර.භා.අ විසින් වැඩ වර්ජන, කැරළි කෝලහාල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී රක්ෂණ අරමුදල (SRCC & Tr) පවරාගන්නා ලදි.
- 20% අනිවාර්ය ප්‍රතිරක්ෂණ වැඩසටහන යටතේ ජා.ර.භා.අ විසින් ප්‍රතිරක්ෂණ ව්‍යාපාරික කටයුතු ආරම්භ කරන ලදි.

## 2009

ජා.ර.භා.අ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය දක්වා ව්‍යාප්ත කරන ලදි.

## 2013

- 2012 අයවැය යෝජනාවට අනුව වගා රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කරන ලදි.
- 20% අනිවාර්ය ප්‍රතිරක්ෂණ (නැවත ප්‍රතිරක්ෂණය) වැඩසටහන 30% දක්වා වැඩි කරන ලදි.

## 2016

- ජාතික ස්වභාවික ආපදා රක්ෂණ යෝජනාක්‍රමය (NNDS) පිහිටුවීම මඟින් ජා.ර.භා.අ සිය ව්‍යාපාර පෙළගැස්ම තවදුරටත් පුළුල් කරන ලදි.
- රන් හා රිදී සාමාජිකත්ව විකල්පයන් හඳුන්වාදීමත් සමඟ අග්‍රහාර යෝජනාක්‍රමය පුළුල් විය.

# වර්ෂයේ සමාලෝචනය

## ජා.ර.භා.අ නව වසර සැමරුම (2017 ජනවාරි 02)

ජා.ර.භා.අ හි සභාපති මංජුල ද සිල්වා මහතා සහ ප්‍රධාන විධායක නිලධාරී සනත් සී ද සිල්වා මහතාගේ සහභාගීත්වයෙන් ජා.ර.භා.අ කාර්ය මණ්ඩලය විසින් කාර්යාල පරිශ්‍රයේ දී නව වසර සමරනු ලැබීය.





## ජා.ර.භා.අ සහ ලංකා හොස්පිට්ල්ස් අග්‍රහාර යටතේ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම (2017 ජනවාරි 05)

අග්‍රහාර වෛද්‍ය යෝජනාක්‍රමයේ සාමාජිකයින්ට ප්‍රතිලාභ ලබා දීම සඳහා ජා.ර.භා.අ සහ ලංකා හොස්පිට්ල්ස් අතර අවබෝධතා ගිවිසුමක් ජා.ර.භා.අ පරිශ්‍රයේදී අත්සන් කරන ලදී. මෙම අවබෝධතා ගිවිසුමට ජා.ර.භා.අ හි ප්‍රධාන විධායක නිලධාරී සනත් සී ද සිල්වා මහතා සහ ලංකා හොස්පිට්ල්ස් හි ප්‍රධාන විධායක නිලධාරී වෛද්‍ය ප්‍රසාද් මැදවත්ත මහතා අත්සන් තැබීය. ජා.ර.භා.අ සභාපති මංජුල ද සිල්වා මහතා, ලංකා හොස්පිට්ල්ස් ප්‍රධාන අලෙවිකරණ නිලධාරී ආර්.එම්.එන්.එස්. රත්නායක මහතා සහ සහකාර අලෙවිකරණ කළමනාකරු තනුජය ගුණසේකර මහතා මෙම අත්සන් තැබීම සඳහා සහභාගී වූහ.



## ජා.ර.භා.අ සහ හේමාස් හොස්පිට්ල්ස් අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම (2017 ජනවාරි 05)

ජා.ර.භා.අ හා හේමාස් හොස්පිට්ල්ස් අතර අවබෝධතා ගිවිසුමක් ජා.ර.භා.අ හි ප්‍රධාන විධායක නිලධාරී සනත් සී ද සිල්වා මහතා සහ හේමාස් හොස්පිට්ල්ස් අධ්‍යක්ෂක ලකිත් පීරිස් යන මහත්වරුන් විසින් ජා.ර.භා.අ සභාපති මංජුල ද සිල්වා මහතා සහ හේමාස් හොස්පිට්ල්ස් මෙහෙයුම් ප්‍රධානී ප්‍රභාත් ගුණවර්ධන මහතා ඉදිරියේ දී අත්සන් කරන ලදී.





## ආපදා අවදානම් මූල්‍යකරණ වැඩමුළුව (2017 ජනවාරි)

ජා.ර.භා.අ හි ප්‍රධාන විධායක නිලධාරී සනත් සී ද සිල්වා මහතා 2017 ජනවාරි මස කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේදී පැවති ආපදා අවදානම් මූල්‍යකරණ වැඩමුළුවකට සම්පත් දායකයෙකු ලෙස සහභාගී විය. මෙම උත්සවය ආසියානු සංවර්ධන බැංකුව විසින් සංවිධානය කරන ලදී.



## ජා.ර.භා.අ හි මාතර දිස්ත්‍රික් ශාඛාව විවෘත කිරීම (2017 ජනවාරි 30)

ජා.ර.භා.අ හි මාතර දිස්ත්‍රික් ශාඛාව 2017 ජනවාරි 30 වන දින මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේදී විවෘත කරන ලදී. සමාරම්භක උත්සවයට ජා.ර.භා.අ හි සභාපති මංජුල ද සිල්වා මහතා, ජා.ර.භා.අ හි ප්‍රධාන විධායක නිලධාරී සනත් සී ද සිල්වා මහතා, මාතර දිස්ත්‍රික් ලේකම් ප්‍රදීප් රත්නායක මහතා, දිස්ත්‍රික් ලේකම් කාර්යාල නිලධාරීන් හා ජා.ර.භා.අ සේවක මණ්ඩලය සහභාගී විය.



# වර්ෂයේ සමාලෝචනය



**ජා.ර.භා.අ සහ නවලෝක හොස්පිට්ල් පීඑල්සී අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම (2017 පෙබරවාරි 23)**

ජා.ර.භා.අ සහ නවලෝක හොස්පිට්ල් පී.එල්.සී. අතර අවබෝධතා ගිවිසුමක් ජා.ර.භා.අ පරිශ්‍රයේදී ප්‍රධාන විධායක නිලධාරී සනත් සී ද සිල්වා මහතා සහ නවලෝක හොස්පිට්ල් පීඑල්සී හි විධායක අධ්‍යක්ෂක උදය හර්සිත් ධර්මදාස මහතා විසින් ජා.ර.භා.අ හි සභාපති මංජුල ද සිල්වා මහතා සහ නවලෝක හොස්පිට්ල් පීඑල්සී හි මූල්‍ය හා ආයතනික සැලසුම් අංශ ප්‍රධානී නාලක නිරෝෂන මහතා ඉදිරියේ දී අත්සන් කරන ලදී.





**ජා.ර.භා.අ ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ලෝක බැංකුව සහයෝගය දැක්වීම (2017 පෙබරවාරි 23)**

2017-2022 කාලය තුළ මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතියක් සඳහා ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් (IDA) ඇමරිකානු ඩොලර් මිලියන 75 ක ණයක් ලබා ගැනීමට කැබිනට් අනුමැතිය ලබා දී ඇති අතර, සාමාන්‍ය රක්ෂණ හා ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය වෙන් කිරීමෙන් ජා.ර.භා.අ ප්‍රතිව්‍යුහගත කිරීම ද ඊට ඇතුළත් ය.

**ජා.ර.භා.අ සහ බාලසූරිය හොස්පිල්ස් අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම (2017 මාර්තු 10)**

ජා.ර.භා.අ ප්‍රධාන විධායක නිලධාරී සනත් සී. ද සිල්වා මහතා සහ බාලසූරිය හොස්පිල්ස් සභාපති බී.එම්.ඒ.පී.ජී.බාලසූරිය මහතා විසින් ජා.ර.භා.අ සහ බාලසූරිය හොස්පිට්ල්ස් (පුද්ගලික) සමාගම අතර අවබෝධතා ගිවිසුමක් ජා.ර.භා.අ හි සභාපති මංජුල ද සිල්වා මහතා සහ එස්. කාර්ති කෙස්වරර් මහතා ඉදිරියේ දී අත්සන් කරන ලදී.



**ජා.ර.භා.අ සහ ප්‍රභෝධා හොස්පිටල් (පුද්ගලික) සමාගම අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම (2017 මාර්තු 24)**

ජා.ර.භා.අ සහ ප්‍රභෝධා රෝහල් පෞද්ගලික සමාගම අතර අවබෝධතා ගිවිසුමක් ජා.ර.භා.අ පරිශ්‍රයේදී ජා.ර.භා.අ ප්‍රධාන විධායක නිලධාරී සනත් සී ද සිල්වා මහතා සහ ප්‍රභෝධා රෝහලේ සභාපති වෛද්‍ය ආසිරි දිසානායක මහතා විසින් අත්සන් කරන ලදී



**ජා.ර.භා.අ සහ සිලෝන් හොස්පිට්ලස් අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම (2017 ජූනි 28)**

ජා.ර.භා.අ සහ සිලෝන් හොස්පිට්ල්ස් පීඑල්සී අතර අවබෝධතා ගිවිසුමක් ජා.ර.භා.අ පරිශ්‍රයේදී ජා.ර.භා.අ ප්‍රධාන විධායක නිලධාරී සනත් සී ද සිල්වා මහතා සහ  සිලෝන් හොස්පිට්ල්ස් ප්‍රධාන මෙහෙයුම් නිලධාරී / වෛද්‍ය සේවා අධ්‍යක්ෂක වෛද්‍ය විමල් කරන්දගොඩ මහතා විසින් අත්සන් කරන ලදී.



## ජා.ර.භා.අ සහ රුහුණු හොස්පිටල් අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම (2017 අගෝස්තු 17)

ජා.ර.භා.අ සහ රුහුණු හොස්පිටල් පුද්ගලික සමාගම අතර අවබෝධතා ගිවිසුමක් ජා.ර.භා.අ පරිශ්‍රයේදී ජා.ර.භා.අ ප්‍රධාන විධායක නිලධාරී සනත් සී ද සිල්වා මහතා සහ රුහුණු හොස්පිටල් හි පරිපාලන අධ්‍යක්ෂක ජනිත් කේ. ලියනගේ මහතා විසින් අත්සන් කරන ලදී.



# අධ්‍යක්ෂක මණ්ඩලය



**මංජුල ද සිල්වා මහතා**
සභාපති



**ට්‍රෙවින් ප්‍රනාන්දුපුල්ලේ මහතා**
අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික



**අසේන්ද්‍ර සිරිවර්ධන මහතා**
අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික



**රෝහන ද සිල්වා මහතා**
අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික



**චන්දන කුමාරසිංහ මහතා**
අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික



**ඩී. පී. විමලසේන මහතා**
අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික

# අධ්‍යක්ෂක මණ්ඩලයේ පැතිකඩ

## මංජුල ද සිල්වා මහතා

(සභාපති)

මංජුල ද සිල්වා මහතා 2015 අප්‍රේල් 06 දින ජා.ර.භා.අ සභාපතිවරයා වශයෙන් පත් කරන ලදි. මීට ප්‍රථම හැටන් නැෂනල් බැංකුව ඇෂුවරන්ස් පීඑල්සී සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂකවරයා වශයෙන් ඔහු සේවය කලේය. කොළඹ විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යා ප්‍රථම ගෞරව උපාධියක් (පළමු පංතියේ) ලබා ගත් මංජුල ද සිල්වා මහතා එක්සත් රාජධානියේ බිස්නස් ස්කූල් ආයතනයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති (MBA) උපාධියක් ද ලබා ඇත. වරලත් කළමනාකරණ ගණකාධිකාරී අධිසාමාජිකත්වය (FCMA) (එක්සත් රාජධානිය) ලබා ඇති ඒ මහතා වරලත් ගෝලීය කළමනාකරණ ගණකාධිකාරීවරයෙකු ද (CGMA) වේ.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යංශයේ උපදේශකයකු ලෙසද සේවය කළ ද සිල්වා මහතා 2015 ට පෙර HNB ඇෂුවරන්ස් පීඑල්සී සමාග මේ කළමනාකරණ අධ්‍යක්ෂක ලෙස පුරා වසර 09 ක්ද එහි ප්‍රධාන විධායක නිලධාරියා ලෙස තවත් වසර දෙකක්ද කටයුතු කර ඇත. ඔහු ඊගල් NDB Fund මැනේජ්මන්ට් පුද්ගලික ආයතනයේ (NDB වෙල්ත් මැනේජ්මන්ට් යනුවෙන් දැන් හදුන්වන) සාමාන්‍යාධිකාරී  ලෙස ද සීමාසහිත ඊගල් ඉන්ෂුවරන්ස් සමාගමේ AIA ඉන්ෂුවරන්ස් යනුවෙන් දැන් හදුන්වන) සංයුක්ත ව්‍යාපාර හා මානව සම්පත් සාමාන්‍යාධිකාරී ලෙසද රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිසමේ (PERC). අධ්‍යක්ෂක ජෙනරාල්වරයා වශයෙන්ද සේවය කර ඇත.

2016 යේ දී වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CIMA) ශ්‍රී ලංකා කමිටු සභාපති ලෙස කටයුතු කර ඇති ඔහු පසුව එහි MESANA කලාපය සඳහා එම කලාපීය මණ්ඩලයේ ද කටයුතු කර ඇත. ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ (Ceylon Chamber of Commerce) හි කමිටු සාමාජිකයෙක් වශයෙන් ක්‍රියාකල අතර එම මණ්ඩලයේ රක්ෂණ මෙහෙයුම් කමිටු සභාපතිවරයා වශයෙන් ද ක්‍රියා කලේ ය.

## කේ. ඩී. එස් රුවන්චන්ද්‍ර මහතා

(අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික)

සිය ධුරයෙන් ඉල්ලා අස්වූ ඩී. ආර්. දේශප්‍රිය මහතා වෙනුවට කේ. ඩී. එස්. රුවන්චන්ද්‍ර මහතා 2016.08.12 දින අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයකු ලෙස පත් කරන ලද අතර 2016 ආගෝස්තු මාසයේ සිට අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වලට සහභාගී විය. ඒ මහතා 2017 වර්ෂය තුල ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජෙනරාල්වරයා ලෙස ද කටයුතු කලේය.

## රෝහණ ද සිල්වා මහතා

(අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික)

රෝහණ ද සිල්වා මහතා 2016.05.05 දින අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයකු ලෙස පත් කරන ලද අතර 2016 මැයි මාසයේ සිට අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වලට සහභාගී විය. වර්ෂය තුල ඒ මහතා සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙක් ලෙස ද සේවය කලේය.

## ඩී. පී. විමලසේන මහතා

(අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික)

ඩී. පී. විමලසේන මහතා (ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවය - පළමු පන්තිය) 2015.12.14 දින අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයකු ලෙස පත් කරන ලද අතර 2017 වර්ෂය අතර තුර 2017 ජුනි මාසය දක්වා අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වලට සහභාගී වී ඇත. 2017 වර්ෂයේ ජුනි මාසය දක්වා මුදල් අමාත්‍යංශයේ ප්‍රධාන ගණකාධිකාරී ලෙස සේවය කර ඇති ඩී. පී. විමලසේන මහතා කොළඹ විශ්වවිද්‍යාලයේ වාණිජවේදී (විශේෂ) උපාධිධාරියෙක් වන අතර කැළණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධියද හිමිකරගෙන සිටී. ගණකාධිකරණ හා විගණන ක්ෂේත්‍ර වල වසර 25 ක් ඉක්මවූ පළපුරුද්දක් ඔහු සතු වේ.

## අසේන්ද්‍ර සිරිවර්ධන මහතා

(අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික)

අසේන්ද්‍ර සිරිවර්ධන මහතා 2015.04.02 දින අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයකු ලෙස පත් කරන ලදී. ඒ මහතා නීතිවේදී උපාධිධාරියෙක් වන අතර දැනට නීතීඥයෙකු ලෙස සේවය කරයි.

## චන්දන කුමාරසිංහ මහතා

(අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික)

චන්දන කුමාරසිංහ මහතා 2015.12.14 දින අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයකු ලෙස පත් කරන ලදී. 2017 වර්ෂයේදී රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශයේ අධ්‍යක්ෂවරයෙක් ලෙස සේවය කලේය.

### ට්‍රෙවින් ප්‍රනාන්දුපුල්ලේ මහතා

(අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික)

ට්‍රෙවින් ප්‍රනාන්දුපුල්ලේ මහතා 2015.04.08 දින අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයකු ලෙස පත් කරන ලද අතර 2015 සිට අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වලට සහභාගී විය. ඒ මහතා එච්.එස්.බී.සී (HSBC) බැංකුවේ සේවයෙන් විශ්‍රාම ගන්නා අවස්ථාව වන විට එහි නියෝජ්‍ය ප්‍රධාන විධායක නිලධාරි ලෙස සේවය කලේය. තවද ඒ.එම්.ඩබ්. (AMW) කැපිටල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සමාගමේ (ඩුබායි හි පිහිටා ඇති අල් ෆුටායිම් (Al Futtaim) ව්‍යාපාර සමූහයේ සාමාජික) සභාපතිවරයා ලෙසද, යූනියන් බෑන්ක් පීඑල්සී හි විධායක නොවන අධ්‍යක්ෂකවරයෙකු ලෙස හා ඩව් ලංකා ට්‍රේලර් මැනුෆැක්චරින් ලිමිටඩ් (ඉන්දියාවේ ටාටා සමූහයේ සාමාජික) හි විධායක නොවන අධ්‍යක්ෂකවරයෙකු ලෙසද ප්‍රනාන්දුපුල්ලේ මහතා සේවය කරයි.

### එන්. එම්. ඩී. නවරත්න මහතා

(අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික)

ඩී. පී. විමලසේන මහතා වෙනුවට එන්. එම්. ඩී. නවරත්න මහතා 2017.07.31 දින අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයකු ලෙස පත් කරන ලද අතර ඩී. පී. විමලසේන මහතාගෙන් පසුව 2017 වර්ෂයේ මුදල් අමාත්‍යංශයේ ප්‍රධාන ගණකාධිකාරී ලෙස ද සේවය කර ඇත.

# ආයතනික සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම



**සනත් සී. ද සිල්වා මහතා**
- ප්‍රධාන විධායක නිලධාරී

**ජේ. ඒ. ඩී. සිරිවර්ධන මහතා**
- සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය

**නිමාලි පතිරණ මිය**
- සහකාර සාමාන්‍යාධිකාරී - රක්ෂණ

**පී. ආර්. ඒ. ලසන්ත යූ. කුමාර මහතා**
- මානව සම්පත් හා පරිපාලන දෙපාර්තමේන්තු ප්‍රධානී

**නිමාලි පෙරේරා මිය**
- ශාඛා අධීක්ෂණ දෙපාර්තමේන්තු ප්‍රධානී



**ධම්මිකා වීරකෝන් මිය**
- මූල්‍ය අංශ ප්‍රධානී

**ආර්. එස්. ගුණසේකර මහතා**
- පර්යේෂණ හා විශ්ලේෂණ දෙපාර්තමේන්තු ප්‍රධානී

**උපේක්ෂා ඒකනායක මිය**
- මෝටර් රථ ප්‍රාරක්ෂණ දෙපාර්තමේන්තු ප්‍රධානී

**කාවින්ද්‍ර ජයසිංහ මහතා**
- තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තු ප්‍රධානී

**සිතාර අසංක ජයලත් මහතා**
- පරිපාලන අංශ ප්‍රධානී

**නාමල් කාංචන මහතා**
- ආයෝජන අංශ ප්‍රධානී



**සිසිත චන්ද්‍ර කුමාර මහතා**
- මූල්‍ය වාර්තාකරණ අංශ ප්‍රධානී

**ටී. ජී. ලකෂ්මන් මහතා**
- මොටර් රථ හිමිකම් දෙපාර්තමේන්තු ප්‍රධානී

**රන්දිමා ඩී. එම්. මාන්නගේ මෙනවිය**
- සාමාන්‍ය හිමිකම් දෙපාර්තමේන්තු ප්‍රධානී

**දේශානි නානායක්කාර මිය**
- ප්‍රතිරක්ෂණ හා SRCC දෙපාර්තමේන්තු ප්‍රධානී

**එම්. එන්. කේ. පඬිගමගේ මහතා**
- මාතර ශාඛා ප්‍රධානී

**එස්. ආර්. ජී. උදාරි පියභාෂිනී මිය**
- නීති දෙපාර්තමේන්තු ප්‍රධානී



**අනුර සමරකෝන් මහතා**
- අග්‍රහාර දෙපාර්තමේන්තු ප්‍රධානී

**නිමේෂා සහබන්දු මිය**
- ක්ෂුද්‍ර රක්ෂණ දෙපාර්තමේන්තු ප්‍රධානී

**ගයනි සියඹලාගොඩ මිය**
- විධායක ලේකම්

**ගයත්‍රි සොයිසා මිය**
- අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තු ප්‍රධානී

**ශාමල් සුමුදු සේනාරත්න මහතා**
- අනුරාධපුර ශාඛා ප්‍රධානී

## 2017 සඳහා ෆිච් ශ්‍රේණිගත කිරීම (Fitch rating for 2017)

AA- (lka)

Fitch Ratings



# නිෂ්පාදන හා සේවා

| |
|---|
| **ප්‍රතිරක්ෂණය**<br>ජා.ර.භා.අ යනු ජාතික ප්‍රතිරක්ෂණකරු වන අතර ශ්‍රී ලංකාවේ අනෙකුත් සාමාන්‍ය රක්ෂණ ආයතන සඳහා ප්‍රතිරක්ෂණ ආවරණය සපයයි. |
| **ජා.ර.භා.අ අග්‍රහාර**<br>රාජ්‍ය සේවකයින්ට සහ ඔවුන්ගේ යැපෙන්නන්ට අදාළ වන අග්‍රහාර වෛද්‍ය රක්ෂණ යෝජනාක්‍රමය රාජ්‍ය පරිපාලන අමාත්‍යංශයේ අංකඃ 5/1997 චක්‍රලේඛය මගින් හඳුනවා දෙන ලද අතර එය 2006 ජනවාරි 1 වන දින සිට ජා.ර.භා.අ යටතට ගෙන එන ලදී. |
| **වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී රක්‍ෂණාවරණය (වැ.ව.කැ.කෝ.සි.අ.ත්‍ර.ර)**<br>වැ.ව.කැ.කෝ.සි.අ.ත්‍ර.ර ශ්‍රී ලංකාවේ භූගෝලීය සීමාවන් තුල අදාළ වන අතර, ලියාපදිංචි සාමාන්‍ය රක්ෂණ ආයතන හරහා රක්ෂණාවරණය සපයනු ලැබේ.<br>2017 දෙසැම්බර් අවසාන වන විට ලියාපදිංචි සාමාන්‍ය රක්ෂණ ආයතන,<br><br>1. ෆෙයාර්ෆස්ට් ඉන්ෂුරන්ස් ලිමිටඩ්<br>2. සණස ඉන්ෂුරන්ස් කම්පැණි ලිමිටඩ්<br>3. අමානා තකාෆුල් පීඑල්සී<br>4. සමූපකාර ඉන්ෂුරන්ස් කම්පැණි ලිමිටඩ්<br>5. සෙලින්කෝ ජෙනරල් ඉන්ෂුරන්ස් ලිමිටඩ්<br>6. එච්.එන්.බී (HNB) ජෙනරල් ඉන්ෂුරන්ස් ලිමිටඩ්<br>7. ජනශක්ති ජෙනරල් ඉන්ෂුරන්ස් ලිමිටඩ්<br>8. එම්.බී.එස්.එල් (MBSL) ඉන්ෂුරන්ස් කම්පැණි ලිමිටඩ්<br>9. අලියාන්ස් ඉන්ෂුරන්ස් ලංකා ලිමිටඩ්<br>10. ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ්<br>11. කොන්ටිනෙන්ටල් ඉන්ෂුරන්ස් ලංකා ලිමිටඩ්<br>12. පීපල්ස් ඉන්ෂුරන්ස් පීඑල්සී<br>13. එල්.ඕ.එල්.සී (LOLC) ඉන්ෂුරන්ස් කම්පැණි ලිමිටඩ්<br>14. ඔරියන්ට් ඉන්ෂුරනස් ලිමිටඩ් |
| **ජාතික ස්වභාවික ආපදා රක්ෂණ යෝජනාක්‍රමය (ජ.ස්.ආ.ර.යෝ)**<br>ජ.ස්.ආ.ර.යෝ 2016.04.01 දින හඳුන්වා දුන් අතර විශේෂයෙන්ම සියලු ගෘහ හා කුඩා ව්‍යාපාර ආයතනවල ජීවිත හා දේපල මෙම ක්‍රමය මඟින් ආවරණය කරයි. සුළිසුලං, කුණාටු, චණ්ඩ මාරුත, ජලගැලීම්, නායයෑම්, සැඩසුලං, භූමි කම්පා, සුනාමි සහ එවන් ස්වභාවික ආපදා (නියඟය හැර) හේතුවෙන් ඔවුන්ගේ දේපල හා අන්තර්ගතයට සිදු වන හානි සම්බන්ධයෙන් වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන 10 නොඉක්මවන ඕනෑම ව්‍යාපාරයක් රුපියල් මිලියන 2.5 දක්වා ආවරණය කෙරේ.<br><br>ධීවර දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී ඇති සියලුම ධීවරයින් සඳහා රුපියල් මිලියනය බැගින් වටිනා රක්ෂණාවරණයක් ලැබේ. |
| **මෝටර් රථ රක්ෂණය**<br>2008 සිට ජා.ර.භා.අ රජයේ ආයතන සඳහා මෝටර් රථ රක්ෂණාවරණ ලබා දෙයි.<br><br>අග්‍රහාර මෝටර් රථ රක්ෂණය හඳුන්වාදීම සමඟ ජා.ර.භා.අ රාජ්‍ය සේවකයන්ගේ පෞද්ගලික වාහන රක්ෂණය කිරීම දක්වා සේවය ව්‍යාප්ත කර ඇත. |
| **මෝටර් රථ නොවන රක්ෂණය**<br>ජා.ර.භා.අ විසින් රජයේ ආයතන සඳහා සාමාන්‍ය රක්ෂණාවරණ ද ලබා දෙයි. |

# සේවා සැපයුම් ජාලය


යාපනය
කිලිනොච්චි
මුලතිව්
මන්නාරම
වව්නියාව
ත්‍රිකුණාමලය
ඉපලෝගම
පොළොන්නරුව
මඩකලපුව
කුරුණෑගල
මාතලේ
වෙන්නප්පුව
මහියංගනය
කෑගල්ල
මහනුවර
අම්පාර
ගම්පහ
හඟුරන්කෙත
සීතාවක
නුවරඑළිය
බදුල්ල
මොණරාගල
බණ්ඩාරවෙල
රත්නපුර
කලුතර
අකුරැස්ස
හම්බන්තොට
ගාල්ල

**ජා.ර.භා.අ සේවා සැපයුම් ජාලය සේවා ස්ථාන 31 කින් සමන්විත වේ.**

- ජා.ර.භා.අ කොළඹ ප්‍රධාන කාර්යාලය
- මාතර සහ අනුරාධපුර පිහිටි කලාපීය ශාඛා 02
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල පිහිටා ඇති කාර්යාල - 19
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පිහිටා ඇති කාර්යාල - 07
- ප්‍රධාන ලේකම් කාර්යාලවල පිහිටා ඇති කාර්යාල - 01 (කුරුණෑගල)
- පෞද්ගලික පරිශ්‍ර - 01 (මහනුවර)

මහනුවර
කෑගල්ල
නුවරඑළිය
ගම්පහ
බදුල්ල
සීතාවක
මාතලේ
හඟුරන්කෙත
බණ්ඩාරවෙල
මහියංගනය
කුරුණෑගල
වෙන්නප්පුව
ත්‍රිකුණාමලය
යාපනය
මඩකලපුව
පොළොන්නරුව
වව්නියාව
කිලිනොච්චි
මුලතිව්
ඉපලෝගම
මන්නාරම

හම්බන්තොට
ගාල්ල
මොණරාගල
අම්පාර
රත්නපුර
කළුතර
අකුරැස්ස

# සභාපතිතුමාගේ පණිවිඩය

2017 දෙසැම්බර් 31 අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ (ජා.ර.භා.අ) වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශය ඔබ හමුවේ ඉදිරිපත් කිරීමට ලැබීම සතුටට කරුණකි. ශ්‍රී ලංකාවේ එකම දේශීය ප්‍රතිරක්ෂණ සැපයුම්කරු ලෙස මෙන්ම රටේ විශාලතම මහජන සුබසාධනය අරමුණු කරගත් රක්ෂණ වැඩසටහන් වල පරිපාලකයා ලෙස ජා.ර.භා.අ රටේ රක්ෂණ ආරක්ෂණ ජාලය ලෙස කටයුතු කරයි. මෙම සන්දර්භය තුල, ජා.ර.භා.අ හි මූල්‍ය තත්වය අනාගතයේ දී අනපේක්ෂිත හා විශාල කම්පනයන් ගෙන් මිදීමට රටට ඇති හැකියාව පිළිඹිබු කෙරෙන ප්‍රධාන දර්ශකයකි. එබැවින් ජා.ර.භා.අ හි මූල්‍ය තත්වය මහජන සුබසාධනය පිළිබඳ කාරණයක් වන අතර 2017 දී එහි විධිනියෝග ගත ඉලක්කයන් ඉටුකර ගැනීමේදී ජා.ර.භා.අ ප්‍රශංසනීය ප්‍රත්‍යාස්ථිතියක් පෙන්නුම් කර ඇති බව වාර්තා කිරීමට ලැබීම පිළිබඳ මම සතුටු වෙමි.

නැවත වරක්, දිවයින පුරා ඇති වූ ගංවතුර හේතුවෙන් අප ජාතික මට්ටමේ ස්වභාවික විපතකට මුහුණ දුන් අවස්ථාවේ, රට යථා තත්වයට පත් කිරීම සඳහා ජා.ර.භා.අ විසින් මූල්‍යමය භාරයෙන් විශාල කොටසක් භාර ගැනීමට කටයුතු කරන ලදි. 2016 ඇති වූ ව්‍යසනය හා සමානවම 2017 මැයි මාසයේ ඇති වූ ගංවතුර හේතුවෙන්, විශේෂයෙන් දෙවන වටයේ ගංවතුර අවස්ථාවේ ප්‍රතිරක්ෂණ ආවරණ නැවත සක්‍රීය කර නොතිබීම හේතුවෙන් ජා.ර.භා.අ හි මූල්‍ය තත්වය මත විශාල බරක් පැටවිණ. ජා.ර.භා.අ 2017 මූල්‍ය වර්ෂය සඳහා බදු ගෙවීමෙන් පසු ලාභය ලෙස රුපියල් මිලියන 976 ක් උපයා ගැනීමට ජා.ර.භා.අ සමත් වී තිබේ. එමෙන්ම ජා.ර.භා.අ විසින් එහි මූල්‍යම ස්ථාවරත්වය සනාථ කරමින් ෆිච් ශ්‍රේණිගත කිරීම් වල ඒඒ- AA-(lka) තත්වයට පැමිණෙන ලදි.

## රට වෙනුවෙන් දායකත්වය

2017 දී ජා.ර.භා.අ විසින් රටට සහ ජනතාවට ලබා දී ඇති දායකත්වය, වසර තුළ ගෙවා ඇති දළ ප්‍රතිලාභ සහ හිමිකම් වලින් මනාව පෙන්නුම් කෙරෙන අතර එය 2016 දී රුපියල් බිලියන 5.7 ට සාපේක්ෂව 2017 දී රුපියල් බිලියන 11.4 ක් විය. විසර්ජනයන්හි වර්ධනය තුලින් පෙන්නුම් කරන්නේ ස්වභාවික විපත් සහ මහජනතාව මුහුණ දෙන අනපේක්ෂිත දුෂ්කරතා වලදී ජා.ර.භා.අ විසින් සපයනු ලබන අත්‍යාවශ්‍ය ආර්ථික සහයෝගයයි. ජා.ර.භා.අ හි මෙම අත්‍යාවශ්‍ය මූල්‍යමය සහයෝගය නොමැතිව මහා පරිමාණ ව්‍යසනයකින් පසු ආර්ථිකය යථා තත්වයට පත්වීමට බොහෝ කාලයක් ගතවනු ඇති අතර සමාජයේ බොහෝ අවදානමට ලක්විය හැකි කොටස් කිසිසේත් යථා තත්ත්වයට පත් නොවීමෙන් දරිද්‍රතාවය ඉහළ යනු ඇත.

ජා.ර.භා.අ කර්මාන්ත මට්ටමෙන් ප්‍රතිරක්ෂණ ආවණයක් සැපයීම් තුළින් රටේ රක්ෂණ අංශයට අඛණ්ඩව සහයෝගය දැක්විය. ප්‍රාථමික රක්ෂණකරුවන්ට ප්‍රතිරක්ෂණ ආවරණ සපයන රටේ එකම ප්‍රතිරක්ෂණකරු ජා.ර.භා.අ වේ. සියලුම ප්‍රාථමික රක්ෂණකරුවන් ඔවුන්ගේ සමාන්‍ය ප්‍රතිරක්ෂණ වල සමස්ථ වගකීමෙන් 30% ක් ජා.ර.භා.අ වෙත පැවරිය යුතුය.

## පාලනය සහ අනුකූලතාවය

රටේ අවදානම් කළමනාකරණ පද්ධතියේ ප්‍රධාන අංශයක භාරකරුවන් ලෙස අධ්‍යක්ෂක මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය ඔවුන්ගේ විශ්වසනීය රාජකාරි පිළිබඳ පූර්ණ අවබෝධයෙන් සිටින අතර සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුල අධ්‍යක්ෂක මණ්ඩලය නිතිපතා රැස්වී ජා.ර.භා.අ හි මූල්‍ය තත්ත්වය සමාලෝචනය හා සාකච්ඡා කිරීම සිදු කරන ලදි. අරමුදලේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා සෑම විටම ශක්තිමත් විචක්ෂණශීලී ක්‍රියාමාර්ගයන් අනුගමනය කරන අතර යහපාලන භාවිතයන් අවධාරණය කර ගනිමින් අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණ පද්ධති සම්බන්ධයෙන් කර්මාන්තයේ හොඳම භාවිතයන් ක්‍රියාත්මක කිරීමට අපි උත්සාහ ගෙන ඇත්තෙමු. මෙම ක්‍රියාවලියේ කොටසක් ලෙස වර්ෂය තුළ සිදුවූ සියලුම නියාමන වෙනස්කම් වලට ජා.ර.භා.අ අනුකූලවී ඇති අතර අවදානම් පදනම් කරගත් ප්‍රාග්ධන ආකෘතිය (RBC) සහ එහි මූල්‍ය වාර්තාකරණයේ දී සිදු වූ නමුත් වාර්තා නොකල ප්‍රතිපාදන (IBNR) පූර්ණ ලෙස අනුග මනය කර ඇත. තවද සියලුම බදු සහ සේවකයින්ගේ ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත වේලාවට සිදුකර ඇත.

## අනාගත සැලසුම්

ඉදිරියට යමින් ජා.ර.භා.අ මහජනතාවට ලැබෙන ප්‍රතිලාභ වැඩි කිරීම සඳහා පවත්නා රක්ෂණ යෝජනාක්‍රම පුළුල් කිරීම කෙරෙහි අවධානය යොමු කිරීමට සහ ඵලදායීතාව සහ සේවා සැපයීම වර්ධනය කිරීම සඳහා මානව සම්පත් කළමනාකරණය ශක්තිමත් කිරීමට ද බලාපොරොත්තු වේ. මූල්‍ය ප්‍රතිලාභ ඉහළ නැංවීම සඳහා ආයෝජන කළමනාකරණයට ද වැඩි අවධානයක් ලැබෙනු ඇති අතර මෙහෙයුම් හා පිරිවැය කාර්යක්ෂමතාව තුලින් ලාභය ඉහල නැංවීම සඳහා තොරතුරු තාක්ෂණ පද්ධතිය ඒකාබද්ධ කිරීමේ අවස්ථාවන් ද අප ඇගයීමට ලක් කරන්නෙමු.

ජා.ර.භා.අ අරමුදලෙහි අවදානම් පෙළගැස්ම නැවත සමතුලිත කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රතිරක්ෂණ මෙහෙයුම් සිදු කළ හැකිවන පරිදි ජා.ර.භා.අ පනත සංශෝධනය කිරීම සඳහා වන මුල පිරීම් ද අප අඛණ්ඩව සිදු කරන්නෙමු. භාරකාර අරමුදලක් ලෙස

ජා.ර.භා.අ හි වර්තමාන ව්‍යුහය වාණිජ මෙහෙයුම් සඳහා බොහෝ අවහිරතාවයන් ඇති කරයි. එබැවින් ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීම සඳහා ජා.ර.භා.අ යටතේ අනුබද්ධිත වෙනම සීමිත වගකීම් ආයතන ස්ථාපනය කර ජා.ර.භා.අ ප්‍රතිව්‍යුහගත කිරීමට අප යෝජනා කර ඇත්තෙමු. මෙම ඉලක්කය නුදුරේදීම සඵල කර ගත හැකි වන බව මාගේ විශ්වාසයයි.

අවසාන වශයෙන්, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු භාර අමාත්‍යවරයාට, ලේකම් සහ අතිරේක ලේකම්වරුන් හට අභියෝගාත්මක වසරක් තුළ අප වෙත දැක්වූ සහයෝගය වෙනුවෙන් මාගේ හද පිරි ස්තූතිය පුදකර සිටිමි. භාණ්ඩාගාරයේ ලේකම් සහ අනෙකුත් භාණ්ඩාගාර නිලධාරීන් ගේ ද සහයෝගය සෑම විටම හිමි වූ අතර ඔවුන් හට මාගේ කෘතඥතාවය පල කර සිටිමි. අපගේ නියාමකවරයා විසින් වර්ෂය තුළදී අපට මිල කල නොහැකි මග පෙන්වීමක් ලබා දී ඇති අතර රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සභාපති, අධ්‍යක්ෂක ජනරාල් සහ නිලධාරීන් හට මාගේ හදපිරි කෘතඥතාව පළ කර සිටිමි. තවද අධ්‍යක්ෂක මණ්ඩලයේ සාමාජිකයන්, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සහ ප්‍රධාන විධායක නිලධාරීගේ නායකත්වයෙන් යුත් සියලුම සේවකයින් හා ඔවුන්ගේ දායකත්වය අගය කර සිටිමි. එම දායකත්වය හේතුවෙන් ජා.ර.භා.අ වර්ෂය තුල මුහුණ දුන් අභියෝග සාර්ථකව ජය ගැනීමට අපට හැකි වී ඇත.



**මවාහිබ් මොවිජුඩ්**

සභාපති

2020.02.25

# රාජ්‍ය සේවයට කැප වූවන් ආරක්ෂා කරමින්



# ඔබගේ ස්වර්ණමය වර්ෂයන්ට වඩාත් වටිනාකමක් එක් කරමින්



# ප්‍රධාන විධායක නිලධාරියාගේ මෙහෙයුම් සමාලෝචනය

2017 මූල්‍ය වර්ෂය මෙහෙයුම් හා මූල්‍ය දෘෂ්ටි කෝණයෙන් ජා.ර.භා.අ හට අභියෝගාත්මක වසරක් වූ අතර, 2016 ව්‍යසනකාරී ගංවතුරෙන් වසරකට පසුව රට දෙවන මහා පරිමාණ ගංවතුරට ද මුහුණ දෙන ලදි. විශාල හිමිකම් පියවීම් තිබියදීත්, ශ්‍රී ලංකා ජනතාවට සිය සේවාවන් අඛණ්ඩව වැඩිදියුණු කරමින් ජා.ර.භා.අ 2017 වර්ෂය සඳහා ලාභයක් වාර්තා කිරීමට සමත් විය. දැඩි පීඩනය හමුවේ වුවද ජා.ර.භා.අ සිය මූල්‍ය ස්ථායිතාව සහ ඔරොත්තු දීමේ හැකියාව පිළිබිඹු කරමින් සහ ජා.ර.භා.අ හි විශිෂ්ඨත්වය සහතික කරමින් ෆිච් රේටින්ග් ලංකා වෙතින් ඒඒ- (AA-) ණය ශ්‍රේණිගත කිරීමක් ලබා ගැනීම ද සැලකිය යුතු කරුණකි.

## මූල්‍ය ප්‍රගතිය

ගනුදෙනුකරුවන්ට ප්‍රසන්න සේවාවක් සපයමින් 2017 වර්ෂයේ අස්ථාවර කාල පරිච්ඡේදය තුළ රක්ෂණ ක්ෂේත්‍රය තුළ නොනැසී පවතිමින් ජා.ර.භා.අ සිය මූල්‍ය පෙළගැස්ම වටිනාකමක් එක්වන පරිදි කළමනාකරණය කර ඇත. 2016 දී රු.බිලියන 6.845 ක් වූ දළ ලිඛිත වාරිකය 2017 දී රු. බිලියන 9.071 ක් ලෙස 2016 ට සාපේක්ෂව 2017 දී 33% ක වර්ධනයක් පෙන්නුම් කරන ලදි. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ප්‍රතිරක්ෂණ හා වැඩ වර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාදී අරමුදලෙහි දළ ලිඛිත වාරික ඉහළ නැංවීමයි. එසේම, 2017 දී ඉපැයූ ශුද්ධ වාරිකය රු. බිලියන 11.613 ක් වන අතර 2016 දී එය රු. බිලියන 8.850 ක් විය. මෙය සාපේක්ෂව 31% ක වර්ධනයකි.

අනෙක් අතට, ගංවතුර හිමිකම් ගෙවීම හේතුවෙන් 2017 දී ලබාදෙන ලද දළ ප්‍රතිලාභ සහ හිමිකම් පියවීම් (Gross Benefit and Claims incurred) රු. බිලියන 11.455 ක් දක්වා 99% කින් ඉහළ ගොස් ඇති අතර එය 2016 දී රු. බිලියන 5.761 ක අගයට සාපේක්ෂව විශාල වැඩි වීමකි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සමස්ත විස්තීර්ණ ආදායම 2016 දී පැවති රු. බිලියන 2.661 සිට 2017 දී රු. බිලියන 1.176 ක් දක්වා පහත වැටී ඇති අතර එය ප්‍රතිශතයක් ලෙස ගත් විට 56% ක පහළ යාමකි.

මූල්‍ය තත්ත්වය සලකා බැලීමේදී මුළු කොටස් හා මුළු වත්කම් පිළිවෙලින් රු. බිලියන 7.565 සිට රු. බිලියන 7.146 දක්වා සහ රු. බිලියන 19.515 සිට රු. බිලියන 18.553 දක්වා සුළු වශයෙන් අඩු වී ඇත. තවද, වගකීම් 2016 දී රු. බිලියන 11.951 සිට 2017 දී රු. බිලියන 11.406 දක්වා 5% ආන්තික අඩු වීමක් පෙන්වමින් පහල වැටී ඇත.

ජාතික ස්වභාවික ආපදා රක්ෂණය යෝජනාක්‍රමය (NNDIS) යටතේ 2016 යේ මැයි මාසයේ ඇති වූ ගංවතුර තත්වය හේතුවෙන් සිදුකල හිමිකම් පියවීම හේතුවෙන් මූල්‍ය වත්කම් වල 2016 දී රු. බිලියන 11.188 සිට 2017 දී රු. බිලියන 8.161 දක්වා 27% ක මධ්‍යස්ථ පහත වැටීමක් වාර්තා විය. තවද, 2016 දී රු. බිලියන 43.058 ක් වූ දේපළ, පිරියත සහ උපකරණ 2017 දී රු. බිලියන 39.471 ක් වූ අතර එය අතර එය 8% ක අඩු වීමකි.

සමස්තයක් ලෙස ගත් කල මූල්‍ය ප්‍රගතිය සහ ෆිච් ශ්‍රේණිගත කිරීම් වල ඒඒ- (AA-) ශ්‍රේණිය සැලකිල්ලට ගනිමින්, ජාතික රක්ෂණ භාර අරමුදල, පසුගිය කාල පරිච්ඡේදය තුළ දී ඇති වූ ස්වභාවික ආපදා අභියෝගයන්ට නැවත මුහුණ දීමට වුවද හැකි ශක්තිමත් මූල්‍ය තත්වයක් පෙන්නුම් කරයි.

## මෙහෙයුම් ප්‍රගතිය

රටේ සමාජ ආරක්ෂණ පද්ධතියේ ජා.ර.භා.අ හි ප්‍රමුඛ කාර්යභාරය අනුව දිස්ත්‍රික්ක 25 ම නියෝජනය වන පරිදි නියෝජිත ජාලයක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල පිහිටුවා ඇත. මෙම රටපුරා වන නියෝජනය මඟින් දේශීය ප්‍රජාවන් ශක්තිමත් කිරීමට සහ, ඉහළ වේගයකින් හා නිරවද්‍යතාවයකින් ප්‍රතිචාර දැක්වීමට හැකි වීම හරහා හොඳ සේවා මට්ටමක් ලබා දීමට අවස්ථාව සලසයි.

අග්‍රහාර රන් හා රිදී සාමාජිකත්ව යෝජනාක්‍රම මුලපිරීම් පුළුල් කරමින් 2017 දී අර්ධ රාජ්‍ය අංශය සඳහා කාණ්ඩ දෙකක් හඳුන්වා දුන් අතර එම කාණ්ඩ දෙකේ සියලුම සාමාජිකයින් හට වෙනම ක්‍රියාත්මක කරනු ලබන විද්‍යුත් කාඩ්පත් ලබා ගැනීමේ ප්‍රතිලාභය ලබා දී ඇත. ජා.ර.භා.අ විසින් වාහනයක් හිමි රජයේ සේවකයින්ට විශේෂ ආවරණ විශේෂාංග ලබා දෙමින් අග්‍රහාර මෝටර් රථ රක්ෂණ නිපැයුම දියත් කරන ලද අතර මෙය ජා.ර.භා.අ හි ප්‍රධාන මුලපිරීමකි. තවද, රටේ ගොවි ප්‍රජාවට සහයෝගය දැක්වීම පිණිස ගොවීන්ගේ සෞඛ්‍ය රක්ෂණය සඳහා ජා.ර.භා.අ විසින් රටේ සියලුම අංශ ආවරණය කිරීමේ අරමුණ සහිතව අනුරාධපුරයේදී නියමු ව්‍යාපෘතියක් දියත් කරන ලදී.

නව නිපැයුම් හා පවත්නා නිෂ්පාදන තවදුරටත් වැඩිදියුණු කරගනිමින් ජා.ර.භා.අ 2017 වසරේදී ද සිය සේවාව අඛණ්ඩව පවත්වාගෙන යන ලදී.

## මානව සම්පත් හා පරිපාලන ප්‍රගතිය

අපගේ ගනුදෙනුකරුවන්ට අමතරව ජා.ර.භා.අ හි සාර්ථකත්වයේ පළමු ආධාරකය, ශක්තිය අපගේ කාර්ය මණ්ඩලය බව නිසැකය. 2017 අවසානය වන විට, ජා.ර.භා.අ හි සේවක මණ්ඩලය 285 දෙනෙකුගෙන් සමන්විත වූ අතර ඔවුන්ගෙන් බහුතරය වූ 210 දෙනෙකු ස්ථිර සේවකයින් සහ කොන්ත්‍රාත් සේවකයින් වේ. 2017 වර්ෂය තුළ ජා.ර.භා.අ විසින් දෛනික වැටුප් ගෙවන සේවකයින් 25 දෙනෙකු සේවයේ යොදවා තිබුණි. 2016 දී ආරම්භ කරන ලද mintHRM පද්ධතිය 2017 දී සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කරන ලද අතර එය ආයතනයේ පරිපාලනයේ ඵලදායීතාවය සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමෙන් ඉදිරි වසර කිහිපය තුළදී ජා.ර.භා.අ හි ප්‍රත්‍යාස්ථාවය වැඩි වනු ඇත.

## අගය කිරීම

සෑම පාර්ශවකරුවෙකු විසින්ම කණ්ඩායමක් වශයෙන් කැපවීම් සහගතව කටයුතු කිරීම තුළින් ජා.ර.භා.අ ජයග්‍රාහී මාවත කරා රැගෙන යන ලදි. එබැවින්, 2017 වසරේ ලබාගත් ජයග්‍රහණයන් සඳහා ජා.ර.භා.අ කණ්ඩායම දැක්වූ ප්‍රශංසනීය දායකත්වය පිළිබඳව මාගේ අවංක කෘතඥතාව පළ කරමි. අපගේ සාර්ථකත්වය පිටුපස සිටින මහජනතාවට සහ ජා.ර.භා.අ හි ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ විශ්වාසය හා අවංක සහයෝගය වෙනුවෙන් මම ස්තූතිවන්ත වෙමි. තවද, 2017 වර්ෂය තුළ දී දැක්වූ සහයෝගය වෙනුවෙන් සභාපති සහ අධ්‍යක්ෂක මණ්ඩලය, මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන් සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ නිලධාරීන් වෙත මාගේ අවංක ස්තුතිය පිරිනමන අතර අනාගතයේදී වඩාත් හොඳ සමාජ සුරක්ෂිතතාවයක් ගොඩ නැඟීමට දායක වෙමින් මහජනතාවට සේවය කිරීමට අප කැපවී සිටින්නෙමු.



**ගීතා විමලවීර**
ප්‍රධාන විධායක නිලධාරී (වැඩ බලන)
2020.05.09

# රට වෙනුවෙන් දායකත්වය

## ඒකාබද්ධ අරමුදලට දායක වීම

**2017 වර්ෂයේ ඒකාබද්ධ අරමුදල සඳහා දායකත්වය: රු. මිලියන 1,500**

| වර්ෂය | රු.මිලියන |
|---|---:|
| 2016 | 3200 |
| 2015 | 3000 |
| 2014 | 4000 |
| 2013 | 3200 |
| 2012 | 4200 |
| 2011 | 3495 |

## දළ ප්‍රතිලාභ සහ හිමිකම් ගෙවීම්

**දළ ප්‍රතිලාභ සහ හිමිකම් ගෙවීම් : 2017 දී රු. බිලියන 11,455 සහ 2016 දී රු. බිලියන 5.761 ක්**

| (අ) දළ ප්‍රතිලාභ සහ හිමිකම් ගෙවීම් | 2017 | 2016 |
|---|---:|---:|
| ප්‍රතිරක්ෂණ | (2,039,286,678) | (2,882,078,138) |
| SRCC & Tr | (12,314,131) | 250,927 |
| සාමාන්‍ය රක්ෂණ - මෝටර් රථ | (202,402,854) | (142,640,392) |
| සාමාන්‍ය රක්ෂණ - වෛද්‍ය හා අනෙකුත් | (151,205,332) | (49,937,952) |
| වගා රක්ෂණය | (1,593,396,750) | (68,646,391) |
| ආපදා | (4,699,472,888) | (757,620,458) |
| අග්‍රහාර වෛද්‍ය රක්ෂණ යෝජනාක්‍රමය | (2,757,161,073) | (1,860,745,461) |
| එකතුව | (11,455,239,706) | (5,761,417,865) |

# 2017 වර්ෂය තුළ ආයතනික සමාජයීය වගකීම් ක්‍රියාකාරකම්

## ලේ දන්දීමේ වැඩසටහන

ජා.ර.භා.අ හි සුභසාධක සමිතිය විසින් 2017 ඔක්තෝම්බර් 12 වන දින ජා.ර.භා.අ පරිශ්‍රයේදී ලේ දන් දීමේ වැඩසටහනක් සංවිධාන කරන ලදී.



# මෙහෙයුම් පරිසරය

අමතර ආදායම අඩු මට්ටමක පැවතීම සහ ඇතැම් සමාජ සුරක්ෂිතතා ප්‍රතිලාභ සහ ප්‍රජා පාදක සමාජයක් පිළිබඳ දැනුවත්භාවය, අවබෝධය මඳබව මෙන්ම ඒවායේ පැවතීම මදිකම හේතුවෙන් ශ්‍රී ලංකාවේ රක්ෂණය සඳහා ඇති ඉල්ලුම සාපේක්ෂව අඩු වේ. එබැවින්, පසුගිය දශකය තුළ රක්ෂණ පැතිරයාම 1% ක් පමණ සීමාවක රැඳී පැවතිනි. රක්ෂණ ඝනත්වය මුළු ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස මුළු වාර්ක ආදායම මගින් ප්‍රකාශ වේ. 2016 දී රු.6,747 ක් වූ රක්ෂණ ඝනත්වය 2017 දී රු.7,677 ක් දක්වා සුළු වශයෙන් වර්ධනය විය.

කෙසේ වෙතත්, පැතිරයාමේ මට්ටම කාලයත් සමඟ වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මධ්‍යම හෝ දිගු කාලීනව රට මධ්‍යම ආදායම් මට්ටමට පිවිසෙතැයි අපේක්ෂා කරන අතර වැඩි වන අමතර ආදායමෙහි ප්‍රතිඵලයක් ලෙස රක්ෂණ පැතිරයාම වැඩි වනු ඇත. තවද, අඩු ආදායම්ලාභීන්ගේ අවශ්‍යතා ඉලක්ක කරගනිමින් ක්ෂුද්‍ර රක්ෂණයට අදාලව මධ්‍ය කාලීනව අපේක්ෂිත නියාමන වර්ධනයන් රටේ රක්ෂණ පැතිරීම ඉහළ නැංවීමට හැකියාව ඇත. ශ්‍රී ලංකාවේ ජනවිකාශ සංක්‍රමණයේදී වයස්ගත ජනගහනය වැඩි වනු ඇතැයි අපේක්ෂා කරන අතර, තවත් දශක දෙකක කාලයක් තුළ සෑම පුද්ගලයින් හතර දෙනෙකුගෙන් එක් අයෙකු වයස්ගත පුද්ගලයකු වනු ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස විශේෂයෙන් සෞඛ්‍ය හා විශ්‍රාම වැටුප් සඳහා වන රක්ෂණ නිෂ්පාදන සඳහා ඉල්ලුමක් නිර්මාණය වනු ඇත. තවද, පැමිණීමට නියමිත අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 17 **(IFRS 17)** මධ්‍ය කාලීනව ක්‍රියාත්මක කරනු ලබන අතර එමගින් රක්ෂණ පද්ධති, ක්‍රියාවලීන්, ප්‍රාග්ධනය සහ අවදානම් කළමනාකරණය යනාදියෙහි සාකල්‍ය වෙනස්කම් ඇති කළ හැකිය.

## රක්ෂණ ක්ෂේත්‍රය

රක්ෂණ ආයතන සඳහා විවිධ වූ බලපෑම් ඇති කළ හැකි බදු ක්‍රමයේ වෙනස්කම් සඳහා රක්ෂණ ආයතන 2017 දී සූදානම් වූහ. 2018 අප්‍රේල් 01 වන දින සිට බලපැවැත්වෙන බදුකරණ නීති සංශෝධනය කිරීමත් සමඟ සමහර අංශයන්ට සැළකිය යුතු බලපෑමක් සිදුවිය. ජීවිත රක්ෂණකරුවන් විසින් ඔවුන්ගේ අතිරික්තය කොටස් හිමියන්ට සහ රක්ෂණ ඔප්පු හිමියන්ට බෙදා හැරීම, බදු අය කළ හැකි ලාභය ගණනය කිරීම වැනි අංශ එසේ බලපෑමට ලක් විය. ඒ අනුව, 2017 දී, ඇතැම් ජීවිත රක්ෂණකරුවන් විසින් පත් කරන ලද ආයුගණකයන්ගේ නිර්දේශයන් සමඟ අදාළ අතිරික්තයන් ජීවිත අරමුදලෙන් කොටස් හිමියන්ගේ අරමුදලට මාරු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස 2017 වර්ෂයේ ලාභය සැලකිය යුතු ලෙස වැඩිදියුණු වී තිබේ. 2017 දී දිවයිනේ ඇතැම් දිස්ත්‍රික්කවල ගංවතුර හා නායයෑම් ඇතිවීමට හේතු වූ අධික මෝසම් වැසි ඇතුළු රට පුරා පැතිර ගිය ස්වභාවික ආපදා, රක්ෂණ අංශයේ ක්‍රියාකාරිත්වයට හා විශේෂයෙන් ජා.ර.භා.අ හි ක්‍රියාකාරිත්වයට දැඩි බලපෑමක් එල්ල කිරීමට හේතු විය.

රක්ෂණ අංශයේ මුළු වත්කම් රු. 2017 දෙසැම්බර් 31 වන විට රු. මිලියන 582,417 ක් වූ අතර එය 2016 දී 12.61% ක වර්ධන වේගයට සාපේක්ෂව බලන කල 10.87% ක මධ්‍යස්ථ වර්ධනයක් පෙන්නුම් කරයි. ජීවිත රක්ෂණ ආයතන විසින් වාර්තා කරන ලද මුළු වත්කම්වල වටිනාකම 2017 දී රු. මිලියන 392,400 ක් වන අතර සාමාන්‍ය රක්ෂණ ආයතන විසින් වාර්තා කරන ලද මුළු වත්කම්වල ප්‍රමාණය රු. මිලියන 185,767 කි.

### රක්ෂණ ආයතන වල මුළු වත්කම්

| | 2013 | 2014 | 2015 | 2016(a) | 2017(b) |
|---|---|---|---|---|---|
| දිගු කාලීන රක්ෂණ (රු.මිලියන) | 216,275 | 247,061 | 312,713 | 345,589 | 392,400 |
| සාමාන්‍ය රක්ෂණ (රු.මිලියන) | 155,636 | 174,588 | 151,177 | 173,985 | 185,767 |
| ප්‍රතිරක්ෂණ (රු.මිලියන) | 1,453 | 3,065 | 3,417 | 5,755 | 4,250 |
| එකතුව (රු.මිලියන) | *356,760 | *422,031 | *466,519 | 525,329 | 582,417 |

*අන්තර් බණ්ඩ ගනුදෙනු ඉවත් කර ඇත.

ජීවිත රක්ෂණ ආයතන විසින් රු. මිලියන 23,401 ක බදු වලට පෙර ලාභයක් 2017 වර්ෂය තුල වාර්තා කර ඇත. සාමාන්‍ය රක්ෂණ ආයතන විසින් වාර්තා කරන ලද බදු වලට පෙර ලාභය 2017 දී රු. මිලියන 8,543 ක් වූ අතර එය 2016 දී රු. මිලියන 13,236 ක් ලෙස වාර්තා විය. එක් ආයතනයක් හැරුණු විට 2016 වසරට සාපේක්ෂව සැළකිය යුතු වෙනසක් පෙන්නුම් කරමින් ලාභ ලබා ගැනීමට අනෙක් සියලුම සාමාන්‍ය රක්ෂණ ආයතන සමත් වී ඇති අතර ආයතන හතරක් පමණක් ව්‍යාපාරයෙන් පාඩු පෙන්නුම් කර තිබේ.

2017 දී රක්ෂණ කර්මාන්තයේ සමස්ත දළ ලිඛිත වාරිකය (GWP) රු.මිලියන 164,623 ක් දක්වා 15.07% කින් වර්ධනය වී ඇත.(එය 2016 දී රු. මිලියන 143,067 කි). වාරිකයේ වර්ධනයට බොහෝ දුරට හේතු වූයේ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර, ප්‍රධාන වශයෙන් මෝටර් රථ සහ සෞඛ්‍ය රක්ෂණ උප පංති වේ. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ GWP මුළු අගය 2016 දී රු.මිලියන 79,590 ක් වූ අතර 2017 දී එම අගය රු. මිලියන 93,119 ක් දක්වා 17% ක වර්ධනයක් පෙන්නුම් කරයි. 12.65% ක වර්ධන වේගයක් වාර්තා කරමින් ජීවිත රක්ෂණ කර්මාන්තය ද වාරික ආදායමට ධනාත්මක දායකත්වයක් ලබා දී ඇත. ආයෝජන ආකාරයේ නිෂ්පාදන විකිණීම සහ කාල සහතික කිරීමේ නිෂ්පාදන අඩුවීම 2016 ට සාපේක්ෂව 2017 දී ජීවිත රක්ෂණ වාරිකයේ වර්ධනයට හේතු වී තිබේ. ඒ අනුව, 2017 දී ජීවිත රක්ෂණ ආයතන විසින් වාර්තා කරන ලද මුළු GWP අගය රු. මිලියන 71,504 ක් විය. (එය 2016 දී රු. මිලියන 63,477 කි)

නව අවදානම් පදනම් කරගත් ප්‍රාග්ධන නීති යටතේ, රක්ෂණ ආයතන විසින් දැනට පවතින මුළු ප්‍රාග්ධනය (TAC) ලෙස අවම වශයෙන් රුපියල් මිලියන 500 ක් සහ අවම වශයෙන් 120% ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතයක් පවත්වා ගත යුතුය. දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයන් පවත්වාගෙන යන බොහෝ ආයතන වලට 2016 සහ 2017 වසර සඳහා රු. මිලියන 500 ක අවම TAC අවශ්‍යතාවය සපුරාලීමට හැකි විය. කර්මාන්තයේ සමස්ත TAC අගය 2017 වර්ෂයේදී 9.17% කින් වර්ධනයව රුපියල් මිලියන 191,175 ක් ලෙස සටහන් විය. CAR සම්බන්ධයෙන් ගත් කල, එක් සමාග මක් හැරුණු විට 2016 සහ 2017 වසර සඳහා 160% ක් ලෙස සකසා තිබූ CAR හි බලාත්මක කිරීමේ මට්ටම සපුරාලීමට සියලුම ආයතන වලට හැකි විය. කෙසේ වෙතත් ඔවුන්ගේ CAR අගය අවශ්‍ය අවම මට්ටමට වඩා වැඩි විය. කර්මාන්තයේ සාමාන්‍ය CAR අගය 2017 දී 302% සිට 321% දක්වා වර්ධනය විය.


ජීවන ගමනේ ඔබ
සුරක්ෂිතව තබා
ගනිමින්



# රටෙහි සංවර්ධනයට උපකාරී වන මූලයන් රැකබලා ගනිමින්

# මෙහෙයුම් සමාලෝචනය

2017 වන විට සේවා ස්ථාන 31 කින් සමන්විත දිවයින පුරා පැතිරුනු සේවා ජාලයක් ජා.ර.භා.අ සතුව ඇත. මීට කොළඹ ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කළමනාකරුවන්ගේ විෂය පථයට අයත් වන මාතර සහ අනුරාධපුර යන ශාඛා කාර්යාල දෙක සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පිහිටි ජා.ර.භා.අ ඒකක 28 ක් ඇතුළත් වේ.

කොළඹින් පිටත පිහිටා ඇති ජාලය ජා.ර.භා.අ රක්ෂණ සේවා සැපයීමේ ප්‍රධාන නාලිකාවක් වන අතර විශේෂයෙන් ජාතික ස්වභාවික ආපදා වලින් පසුව සැපයිය යුතු රක්ෂණ සේවා වර්ග සහ මට්ටම පිළිබඳ බිම් මට්ටමේ තොරතුරු ලබා ගැනීමට ද උපකාරී වේ.

2017 මූල්‍ය වර්ෂය තුළ, ගංවතුරට ගොදුරු වූ සැබෑ පුද්ගලයින් හඳුනා ගැනීමට සහ එමඟින් සම්පත් අහිසි ලෙස භාවිත කිරීම අවම කිරීම සඳහා කොළඹින් පිටත පුළුල් ජා.ර.භා.අ ජාලය වඩාත් ඵලදායී ලෙස භාවිත කරන ලදී.

## ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන්

වර්ෂය තුළදී, ප්‍රාදේශීය රැස්වීම් පැවැත්වීම මගින් ප්‍රාදේශීය කාර්යාලවල සේවකයින් දිරිගැන්වීම සඳහා ජා.ර.භා.අ විසින් වැඩසටහනක් ආරම්භ කරන ලදි.

අදාළ විෂය කරුණු පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම සඳහා ප්‍රාදේශීය කාර්යාලවල තාක්ෂණික පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

## නිෂ්පාදන වල කාර්යසාධනය

දෙවන වසරටත් එක පිට එක පැමිණි ස්වභාවික විපත් වලට විශාල වශයෙන් නිරාවරණය වීම හේතුවෙන් 2017 වර්ෂය ජා.ර.භා.අ හට අනපේක්ෂිත ලෙස අභියෝගාත්මක වසරක් විය. මේ හේතුවෙන්, හිමිකම් සහ ප්‍රතිලාභ පියවීමේ භාරය 2016 දී රුපියල් බිලියන 5.5 සිට 2017 දී බිලියන 9.9 දක්වා දෙගුණයකට ආසන්න අගයක් ගත් අතර එමඟින් ලාභය මත විශාල බලපෑමක් එල්ල කරන ලදි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2016 දී රුපියල් බිලියන 6.9 ක් වූ සමස්ත වියදම් රුපියල් බිලියන 11.6 දක්වා ඉහළ ගියේය. කෙසේ වෙතත්, 2016 දී ලැබූ රුපියල් බිලියන 2.8 ක ලාභයට සාපේක්ෂව 2017 වර්ෂයේදී බදු ගෙවීමෙන් පසු ලාභය ලෙස රුපියල් මිලියන 976.2 ක් ප්‍රකාශයට පත් කිරීමට  ජා.ර.භා.අ සමත් වූ අතර එය වර්ෂය තුළදී පිටතට ගලායෑම් වල විශාල වැඩිවීම හමුවේ ප්‍රශංසනීය ජයග්‍රහණයකි.

අප ඉතිරිකරගත් ලාභයට මුළුමුනින්ම හේතු වූයේ දළ ලිඛිත වාරික (GWP) රුපියල් බිලියන 6.8 සිට රුපියල් බිලියන 9.0 දක්වා වැඩිවීම සමඟ අපගේ නිෂ්පාදනවල ශක්තිමත් කාර්යසාධනයයි. මීට අමතරව, අග්‍රහාර සඳහා දායකත්වය රුපියල් බිලියන 2.0 සිට රුපියල් බිලියන 2.7 දක්වා වැඩි වී ඇති අතර අප විසින් වගා රක්ෂණ බද්ද ද රුපියල් බිලියන 1.5 සිට රුපියල් බිලියන 1.8 දක්වා වැඩි කරන ලදි.

**2016 වර්ෂයට සාපේක්ෂව 2017 දී රක්ෂණ නිෂ්පාදන වලින් ජා.ර.භා.අ ලැබූ ආදායම**

| | 2017 | 2016 |
|---|---:|---:|
| ප්‍රතිරක්ෂණයෙන් ලද වාරික | 3,683,389,120 | 2,397,372,589 |
| SRCC & Tr වාරික | 4,036,282,848 | 3,533,324,423 |
| සාමාන්‍ය රක්ෂණය - මෝටර් රථ | 417,885,956 | 382,196,410 |
| සාමාන්‍ය රක්ෂණය - මෝටර් රථ නොවන | 413,720,543 | 182,864,533 |
| ජාතික ස්වභාවික ආපදා වාරික | 500,000,000 | 300,000,000 |
| පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන වෛද්‍ය රක්ෂණ යෝජනාක්‍රමය | 20,000,000 | 18,000,000 |
| අග්‍රහාර සඳහා ලද දායකත්වය | 2,726,522,599 | 2,004,436,602 |
| රැස්කළ වගා රක්ෂණ බදු | 1,878,361,459 | 1,511,302,032 |

**ශුද්ධ ප්‍රතිලාභ සහ හිමිකම්**

| | 2017 | 2016 |
|---|---:|---:|
| | රු. | රු |
| ශුද්ධ ප්‍රතිලාභ සහ හිමිකම් | (9,900,699,368) | (5,543,154,699) |

## 2016 වර්ෂයට සාපේක්ෂව 2017 දී රක්ෂණ නිෂ්පාදන වලින් ජා.ර.භා.අ ලැබූ ආදායම



# මෙහෙයුම් සමාලෝචනය

## අග්‍රහාර වෛද්‍ය රක්ෂණ යෝජනාක්‍රමය

'අග්‍රහාර' යනු දැනට ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන විශාලතම වෛද්‍ය රක්ෂණ යෝජනාක්‍රමය වන අතර එහි සාමාජික සංඛ්‍යාව 825,000 ඉක්මවයි. මෙම යෝජනාක්‍රමය සාමාජිකයින් සහ ඔවුන්ගේ පවුල් සඳහා ද විහිදෙන අතර එමගින් ආවරණය වන ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව මිලියන 2.2 කට ආසන්න වේ. මෙය දායක යෝජනාක්‍රමයක් වන අතර විශ්‍රාම වැටුප් හිමි සියලුම රජයේ නිලධාරීන්ගේ වැටුපෙන් නාමික මාසික දායකත්වයක් අඩු කරනු ලැබේ.

2017 මූල්‍ය වර්ෂය තුළ අග්‍රහාර වෙත රු. මිලියන 500 ක දායකත්වයක් භාණ්ඩාගාරයෙන් ලැබී ඇති අතර සාමාජික දායකත්වයෙන් රුපියල් බිලියන 2.2 ක් එකරැස් වී ඇත. වර්ෂය තුළ වෛද්‍ය රක්ෂණ වන්දි හිමිකම් සඳහා රුපියල් බිලියන 2.8 ක මුළු මුදලක් ගෙවා ඇත.

| | 2017 රු. | 2016 රු. |
|---|---|---|
| සාමාජිකයන්ගේ දායකත්වය | 2,154,586,499 | 1,450,866,802 |
| මහා භාණ්ඩාගාරයේ දායකත්වය | 500,000,000 | 550,000,000 |
| අග්‍රහාර විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමය | 58,785,600 | 3,569,800 |
| අර්ධ රාජ්‍ය යෝජනාක්‍රමය | 13,150,500 | - |
| මුළු දායකත්වය | 2,726,522,599 | 2,004,436,602 |
| හිමිකම් වියදම් | 2,873,715,118 | 1,860,745,461 |
| හිඟය/අතිරික්තය | (30,638,474) | (43,146,974) |

**හිමිකම් විස්තරය**

| හිමිකම් විස්තරය | මුළු හිමිකම් | | ගෙවූ හිමිකම් | | ගෙවියයුතු හිමිකම් | |
|---|---|---|---|---|---|---|
| | 2017 | 2016 | 2017 | 2016 | 2017 | 2016 |
| මරණ | 1,986 | 1,954 | 1,867 | 1,834 | 53 | 77 |
| දුබලතා | 246 | 209 | 186 | 182 | 28 | 20 |
| දරු උපත් | 13,916 | 10,668 | 13,039 | 9,934 | 687 | 492 |
| පිළිකා | 1,003 | 670 | 923 | 617 | 57 | 38 |
| හෘද රෝග | 841 | 932 | 828 | 920 | 8 | 6 |
| ඇස්කණ්නාඩි | 71,522 | 68,512 | 66,187 | 62,303 | 1,746 | 1,409 |
| වෙනත් රෝගාබාධ සඳහා රජයේ රෝහල් ගාස්තු | 48,388 | 32,525 | 44,858 | 30,269 | 1,186 | 1,331 |
| වෙනත් රෝගාබාධ සඳහා පෞද්ගලික රෝහල් ගාස්තු | 27,440 | 21,688 | 23,147 | 18,361 | 1,422 | 1,305 |
| වකුගඩු | 35 | 10 | 35 | 10 | 0 | 0 |
| අංශබාග | 2 | 2 | 2 | 2 | 0 | 0 |
| එකතුව | 165,379 | 137,170 | 151,072 | 124,432 | 5,187 | 4,678 |

### රාජ්‍ය අංශය සඳහා අග්‍රහාර රන් හා රිදී යෝජනාක්‍රම

2016 දී රාජ්‍ය අංශය සඳහා අග්‍රහාර රන් හා රිදී යෝජනාක්‍රම හඳුන්වා දෙන ලදී. සිය දායකත්වය රු. 300 කින් සහ රු. 600 කින් ඉහළ දැමීමට අනුමැතිය ලබා දුන් ප්‍රතිලාභීන් හට පිළිවෙලින් රිදී සහ රන් යෝජනාක්‍රම යටතේ ප්‍රතිලාභ ලැබීම සඳහා සුදුසුකම් ලබයි.

### අර්ධ රාජ්‍ය අංශය සඳහා අග්‍රහාර රන් හා රිදී යෝජනාක්‍රම

2017 දී අර්ධ රාජ්‍ය අංශය සඳහා අග්‍රහාර රන් හා රිදී යෝජනාක්‍රම හඳුන්වා දෙන ලදී.

### අග්‍රහාර විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමය

අග්‍රහාර විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමය 2016 මැයි මාසයේදී හඳුන්වා දුන් අතර මෙම නිෂ්පාදනය සඳහා වූ දැඩි ඉල්ලුම හේතුවෙන් 2017 දී තවදුරටත් පුළුල් කරන ලදී. විශ්‍රාම වැටුප් ක්‍රමය 2016 ජනවාරි 1 වන දිනෙන් පසු විශ්‍රාම ලබන පූර්ණ රාජ්‍ය සේවකයින් සඳහා පමණක් අදාළ වේ.

### අග්‍රහාර විද්‍යුත් කාඩ්පත්

අග්‍රහාර ප්‍රතිලාභීන් සඳහා සපයනු ලබන සේවාවන්හි කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා 2012 ජනවාරි මාසයේදී සියලුම සාමාජිකයින්ට විද්‍යුත් කාඩ්පත් නිකුත් කිරීම ආරම්භ කරන ලදී.

2017 දී ජා.ර.භා.අ විසින් අග්‍රහාර රන් හා රිදී සාමාජිකයින් වෙත වෙන වෙනම රන් හා රිදී විද්‍යුත් කාඩ්පත් නිකුත් කිරීම ආරම්භ කරන ලදී.

අග්‍රහාර සාමාජිකයින්ට ප්‍රතිලාභ ලබා දීම සම්බන්ධයෙන් ජා.ර.භා.අ පෞද්ගලික රෝහල් ගණනාවක් සමඟ ගිවිසුම් අත්සන් කර තිබෙන අතර එහි එක් ප්‍රතිලාභයක් වන්නේ:

- අදාළ රෝහල් සමඟ ඇති එක් එක් ගිවිසුම මත පදනම්ව අග්‍රහාර කාඩ්පත් හිමියන්ට වට්ටම් ලබා ගත හැකිවීම.










### වැඩ වර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාදී අරමුදල (වැ.ව.කැ.කෝ.සි.අ.ත්‍ර)

වර්තමානයේ දී ජා.ර.භා.අ හි කළමනාකාරීත්වය යටතේ පවතින වැ.ව.කැ.කෝ.සි.අ.ත්‍ර අරමුදල, පළමුව 1987 දී කැබිනට් මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයකට අනුව වෙනම රක්ෂණ අරමුදලක් ලෙස ස්ථාපිත කරන ලද අතර වැඩ වර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාදය හේතුවෙන් සිදුවන අලාභයන් හෝ දේපල හානි සහ තුවාලවීම් සඳහා රක්ෂණ ආවරණය සැලසීම පිණිස ආරම්භ කරන ලදි. ජා.ර.භා.අ සංස්ථාගත කිරීමත් සමඟ SRCC&T අරමුදලට අයත් සියලු අරමුදල් ජා.ර.භා.අ යටත්ට පත්කරන ලදී. අනතුරුව, එම අරමුදල් ජා.ර.භා.අ විසින් පවත්වාගෙන යනු ලබන විශේෂ ගිණුමකට මාරු කරන ලදි. වැඩ වර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාදී ක්‍රියා අවදානම් වලට අදාළව ජා.ර.භා.අ විසින් අන්තර්ජාතික ප්‍රතිරක්ෂකයන්ගෙන් ප්‍රතිරක්ෂණ ආවරණය ලබා ගනියි.

මෙම රක්ෂණ ආවරණය සාමාන්‍ය රක්ෂණ ආයතන හරහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙත ලබා දෙනු ලැබේ. වැඩ වර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාදී ක්‍රියා පිළිබඳ රක්ෂණ ඔප්පු සාමාන්‍ය රක්ෂණ ආයතන විසින් ප්‍රාරක්ෂණය කරන අතර වාරිකයන් ජා.ර.භා.අ වෙත පවරනු ලැබේ. මෙම රක්ෂණ ආවරණය හා සම්බන්ධ හිමිකම් සාමාන්‍ය රක්ෂණ ආයතන වෙත ඉදිරිපත් කරනු ලැබේ. මෙම හිමිකම් පිළිබඳව ක්‍රියාකාරී කමිටු මාසික රැස්වීමේදී විමර්ශනය කර හිමිකම් ගෙවීම සම්බන්ධයෙන් තීරණය කරනු ලැබේ.

## 2017 වර්ෂය අවසාන වන විට වැ.ව.කැ.කෝ.සි.අ.ත්‍ර අරමුදලෙහි තත්වය

| | 2017 රු. | 2016 රු. |
|---|---:|---:|
| දළ ලිඛිත වාරික | 4,036,282,848 | 3,533,324,423 |
| පොලී ආදායම් | 698,165,679 | 596,633,502 |
| වෙනත් ආදායම් | 2,206,357 | 2,909,368 |
| මුළු ආදායම් | 4,736,654,884 | 4,132,867,293 |
| දරන ලද හිමිකම් | (10,519,253) | 33,677,236 |

වැ.ව.කැ.කෝ.සි.අ.ත්‍ර අරමුදලෙහි මුළු ආදායම 2016 වර්ෂයේ වාර්තා වූ රුපියල් බිලියන 4.1 ට සාපේක්ෂව 2017 දී රුපියල් බිලියන 4.7 ක් ලෙස වාර්තා විය. ආදායමේ වර්ධනයට හේතු වී ඇත්තේ 2016 දී රුපියල් බිලියන 3.5 ක් වූ දළ ලිඛිත වාරික 2017 දී රුපියල් බිලියන 4.0 දක්වා ඉහළ යාමයි. ආයෝජන වලින් ලැබෙන පොලී ආදායම ද 2016 දී රුපියල් මිලියන 596.5 සිට රුපියල් මිලියන 698.1 දක්වා ඉහළ ගොස් තිබේ.

## ප්‍රතිරක්ෂණය

ජා.ර.භා.අ ජාතික ප්‍රතිරක්ෂකයා වීම සඳහා අති විශේෂ ගැසට් පත්‍රය මගින් කර ඇත. ශ්‍රී ලංකාවේ සාමාන්‍ය රක්ෂණ සමාගම්වල ප්‍රතිරක්ෂණ අවදානම් භාරගැනීම ජා.ර.භා.අ විසින් වර්ෂ 2008 දී ආරම්භ කරන ලදී.

2013 ජනවාරි මස 1 වන දින සිට සෑම රක්ෂණකරුවෙකු විසින්ම ඇතුළත් වූ දීර්ඝ කාලීන ප්‍රතිරක්ෂණ ගිවිසුම් හැරුණු කොට, සෑම සාමාන්‍ය ප්‍රතිරක්ෂණ ඔප්පුවකින්ම පැන නැගෙන සමස්ථ ප්‍රතිරක්ෂණ වගකීම් වලින් 30% ජා.ර.භා.අ සමඟ ප්‍රතිරක්ෂණය කිරීම අවශ්‍ය වේ. මින් පෙර, මෙම ප්‍රතිශතය 20% ක් විය.

2016 වර්ෂයේදී, ජා.ර.භා.අ හි කළමනාකාරිත්වය විසින් ප්‍රතිරක්ෂණ ආවරණ සිදුවිය හැකි ප්‍රතිරක්ෂණ හිමිකම් ඉල්ලීම් අධික ලෙස ඉහළයාමේ අවදානමට මුහුණ දීමට හැකිවනු පිණිස ඒවා නැවත ප්‍රතිරක්ෂණය කිරීමට පියවර ගන්නා ලදී. 2017 වර්ෂයේදී ද සාමාන්‍ය රක්ෂණයට අදාළ 30%ක අනිවාර්ය වගකීම ආවරණය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිරක්ෂණ සපයා ගැනීමට ජාතික රක්ෂණ භාර අරමුදල කටයුතු කරන ලදී.

| | 2017 | 2016 |
|---|---:|---:|
| දළ ලිඛිත වාරික | 3,683,389,120 | 2,397,372,589 |
| ආයෝජන ආදායම් (රු.) | 143,989,165 | 240,949,250.22 |
| වෙනත් ආදායම් (රු.) | 26,527,702 | 6,144,708.52 |
| මුළු ආදායම් (රු.) | 3,853,905,987 | 2,644,466,548 |
| දරන ලද හිමිකම් (රු.) | 2,326,410,295 | 2,620,738,212 |

## සාමාන්‍ය රක්ෂණය - රථවාහන

ජා.ර.භා.අ හි මෝටර් රථ අංශය රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ වාහන සඳහා පූර්ණ හා තෙවන පාර්ශවීය රක්ෂණ ආවරණ සපයයි.

දිවයින පුරා සිදුවන හදිසි අනතුරු ඉක්මනින් තක්සේරු කිරීම සහ ලේඛන ඉදිරිපත් කිරීමෙන් දින කිහිපයක් ඇතුළත හිමිකම් නිරවුල් කිරීම ඇතුළු අගනා සේවාවක් සැපයීම මගින් ඉහල පාරිභෝගික තෘප්තියක් ලඟා කරදීමට ජා.ර.භා. අරමුදලට හැකි වී තිබේ.

අදාල වර්ෂයේ දී, තරඟකාරී මිල ගනන් පවත්වා ගනිමින්, සේවා සැපයුම් ජාලය ශක්තිමත් කරමින් සහ හොඳින් සම්බන්ධීකරණය කරන ලද අලෙවිකරණ වැඩසටහන් දියත් කිරීම මගින් ඉහළ තරඟකාරී මෝටර් රථ රක්ෂණ වෙළඳපොල තුළ ජා.ර.භා.අ හි මෝටර් රථ රක්ෂණ ව්‍යාපාරය තුල තිරසාර වර්ධනත් පවත්වා ගෙන යන ලදි. වාරික ආදායම් වැඩි කිරීම සඳහා රට පුරා රජයේ ආයතන වලට ගොස් සෘජු අලෙවිකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමද වැඩි කරන ලදි. රජයේ නිලධාරීන් සඳහා වන අග්‍රහාර මෝටර් රථ රක්ෂණ යෝජනා ක්‍රමය වැනි නව නිපැයුම් දියත් කිරීම තුළින් කාර්යසාධනය ශක්තිමත් විය. මෙම අග්‍රහාර මෝටර් රථ රක්ෂණ යෝජනා ක්‍රමය රජයේ සේවකයින් සතු පෞද්ගලික මෝටර් රථ සඳහා විශේෂ ආවරණ ඇතුළත් වන අතර මෙම යෝජනා ක්‍රමය සඳහා වර්ෂය තුළ පාරිභෝගිකයින්ගෙන් උද්‍යෝගිමත් සහයෝගයක් ලැබුණි.

| කාණ්ඩය | 2017 | | 2016 | |
|---|---|---|---|---|
| | හිමිකම් සංඛ්‍යාව | මුදල (රු. මිලියන) | හිමිකම් සංඛ්‍යාව | මුදල (රු. මිලියන) |
| පෞද්ගලික මෝටර් රථ | 587 | 61.38 | 327 | 40.24 |
| යතුරුපැදි | 2176 | 35.80 | 1912 | 29.09 |
| බස්රථ | 189 | 18.10 | 170 | 15.46 |
| ලොරි/ඉඩම් වාහන | 116 | 11.28 | 69 | 3.30 |
| ද්විත්ව කාර්ය වාහන | 514 | 56.21 | 391 | 42.06 |
| එකතුව | 3,582 | 182.77 | 2869 | 130.14 |

මෝටර් රථ ප්‍රාරක්ෂණ දෙපාර්තමේන්තුව ද වර්ෂය තුළ ප්‍රශංසනීය ලෙස ක්‍රියා කළ අතර රජයේ සහ පෞද්ගලික අංශයේ සේවාදායකයින්ගෙන් සැදුම්ලත් අතිශය ශක්තිමත් පාරිභෝගික පදනම ඊට සහාය විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, විශේෂයෙන් රජයේ රක්ෂණ ඔප්පු මගින් උපයන වාරික ආදායම තවදුරටත් වැඩිදියුණු විය.

දළ ලිඛිත වාරික 2016 දී රුපියල් මිලියන 382.1 සිට 2017 දී රුපියල් මිලියන 417.8 දක්වා ඉහළ ගියේය. මෙම අංශයේ සමස්ත ආදායම රුපියල් මිලියන 445.0 සිට රුපියල් මිලියන 464.5 දක්වා වර්ධනය වී ඇති අතර අනෙකුත් ආදායම් හා ආයෝජන ආදායම ද ඉහළ ගොස් තිබේ.

| | 2017 | 2016 |
|---|---|---|
| දළ වාරික (රු.) | 417,885,956 | 382,196,410 |
| ආයෝජන ආදායම් (රු.) | 45,486,114 | 55,729,178 |
| වෙනත් ආදායම් (රු.) | 1,204,881 | 7,111,199 |
| මුළු ආදායම් (රු.) | 464,576,951 | 445,036,786 |

# මෙහෙයුම් සමාලෝචනය

## සාමාන්‍ය රක්ෂණය (මෝටර් රථ නොවන)

2017 දී ජා.ර.භා.අ මෝටර් රථ නොවන රක්ෂණ අංශය පාරිභෝගික පදනම වේගවත් ලෙස පුළුල් කිරීමට කටයුතු කරන ලදි. වර්ෂය තුළදී, තාක්ෂණික නිපුණතාවය සහිත කාර්ය මණ්ඩලය සමඟ අලෙවිකරණ ක්‍රියාවලියේ ඵලදායීතාවය පෙන්නුම් කරමින්, රාජ්‍ය අංශයේ ප්‍රධාන පෙළේ මහා පරිමාණ සේවාදායකයින් ගණනාවක් අත්පත්කර ගැනීමට ජා.ර.භා.අ සමත් විය. ජා.ර.භා.අ හි මිළ නියම කිරීමේ දී තාක්ෂණික දැනුම භාවිතය සහ සේවා ගුණාත්මකභාවයේ තරඟකාරිත්වය මෙම වර්ධනයට හේතු විය. අදාල වර්ෂයේ සේවාදායකයින් කිහිපදෙනෙකු වූයේ;

1. ශ්‍රී ලංකා වරාය අධිකාරිය
2. ආරක්ෂක මූලස්ථානය
3. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
4. රාජ්‍ය දැව සංස්ථාව
5. තේ පර්යේෂණ ආයතනය

ජා.ර.භා.අ හි සාමාන්‍ය රක්ෂණ අංශය (මෝටර් රථ නොවන) ඉංජිනේරු අංශය, ගිනි, මුහුදු රක්ෂණය, විවිධ රක්ෂණ සහ සෞඛ්‍ය රක්ෂණ යනාදී අංශ සඳහා රක්ෂණය ආවරණය සපයයි. විවිධ රක්ෂණය යටතේ සේවක වන්දි රක්ෂණය, පුද්ගලික අනතුරු රක්ෂණාවරණය, මුදල් රක්ෂණය, විදේශ ගමන් රක්ෂණාවරණය සොරසතුරු රක්ෂණාවරණය විද්‍යුත් උපකරණ රක්ෂණය, මාර්ගස්ථ කරන භාණ්ඩ රක්ෂණය සහ බැංකු ආශ්‍රිත පූර්ණ හානි රක්ෂණය යනාදිය ඇතුළු විවිධ රක්ෂණාවරණ රැසක් අන්තර්ගතවේ.

| | 2017 | 2016 |
|---|---|---|
| දළ වාරික (රු.) | 413,720,543 | 182,864,533 |
| ආයෝජන ආදායම් (රු.) | 17,330,808 | 8,196,862 |
| වෙනත් ආදායම් (රු.) | 11,017 | - |
| මුළු ආදායම් (රු.) | 431,062,368 | 191,061,395 |

## ජාතික ස්වභාවික ආපදා රක්ෂණ යෝජනාක්‍රමය

ජතික රක්ෂණභාර අරමුදල විසින් ජාතික ස්වභාවික ආපදා රක්ෂණ යෝජනාක්‍රමය (NNDIS) 2016 වර්ෂයේදී අයවැය යෝජනාවකින් ආරම්භ කරන ලද අතර රක්ෂණය නොකළ ජීවිත හා දේපළ සඳහා පූර්ණ ආවරණයක් සපයයි. 2017 අප්‍රේල් 1 සිට 2018 මාර්තු 31 දක්වා කාලය තුළ මෙම රක්ෂණ යෝජනාක්‍රමයේ රක්ෂණ ඔප්පුහිමියා වන මුදල් අමාත්‍යාංශයෙන් රුපියල් මිලියන 500 ක වාර්ෂික වාරිකයක් ජා.ර.භා.අ වෙත ලැබුණි.

මෙම යෝජනාක්‍රමය යටතේ ජීවිත මෙන්ම රක්ෂණය නොකළ නිවාස හා වාර්ෂික පිරිවැටුම රු. මිලියන 10 නොඉක්මවන හා මධ්‍ය පරිමාන සුළු ව්‍යාපාර ආයතන සඳහා නියඟ හැර සුළි සුළං, කුණාටු, චන්ඩ මාරුත, ජලගැලීම්, නායයෑම්, සැඩ සුළං, භූමිකම්පා, සුනාමි, අධික සුළං හේතුවෙන් ගස් කඩා වැටීම්, පැති බැම් කඩා වැටීම් සහ එවැනි ස්වභාවික ආපදා වර්ෂයකට රු. බිලියන 10 ක සමස්ථ සීමාවක් දක්වා ආවරණය කෙරේ. රක්ෂණ සමාගමක් යටතේ රක්ෂණය වී ඇති නම් හෝ මහා පරිමාණ ව්‍යාපාර සඳහා වන දේපළ හානි මෙයට ඇතුළත් නොවේ.

ස්වාභාවික ආපදාවකට ලක්වීමෙන් මියයන පුද්ගලයන් වෙත රු.100,000/- ක වන්දි මුදලක් පිරිනමන අතර ධීවර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති, ධීවර කර්මාන්තයේ යෙදී සිටියදී ස්වාභාවික ආපදාවකට ලක්වීමෙන් මියයන ධීවරයන් සඳහා රු. මිලියන 01 ක වන්දි මුදලක් ලබා දෙනු ලැබේ.

## කෘෂිකාර්මික ණය සුරැකුම් යෝජනාක්‍රමය

2016 දී ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් වී වගාව සඳහා විශේෂිත ජාතික කෘෂිකාර්මික ණය ප්‍රක්ෂේපණ යෝජනාක්‍රමයක් ජා.ර.භා.අ හරහා දියත් කරන ලදී. බැංකු, මූල්‍ය සමාගම් සහ රක්ෂණ ආයතනවල ශුද්ධ ලාභය මත අය කෙරෙන 1% ක වගා බද්දක් මගින් මෙම යෝජනාක්‍රමයට අරමුදල් සපයනු ලැබේ. කෘෂිකාර්මික ණය ලබා දීමේ නිරත බැංකු සහ වෙනත් ණය දෙන ආයතන විසින් හිමිකම් ලබා ගැනීම සිදු කරනු ලැබේ.

ණය ලබා දෙන ආයතනවලට ඔවුන්ගේ කෘෂිකාර්මික ණය ආපසු අයකර ගැනීමට සහාය වීම මෙම යෝජනාක්‍රමයෙන් අපේක්ෂා කරන අතර ගොවීන්ගේ ණය සුදුසුකම් ආරක්ෂා කිරීම සහ ගොවීන්ට ඊළඟ වගා සමයේදී ණය ලබා ගැනීම සහතික කිරීමද මෙමගින් සිදුවේ.

## ගොවි දිවි අරුණ යෝජනාක්‍රමය

රටේ ගොවි ප්‍රජාවට තවදුරටත් සහයෝගය දැක්වීම සඳහා, 2017 දී ජා.ර.භා.අ විසින් ගොවීන් සඳහා වන සෞඛ්‍ය රක්ෂණයක් ඇති කිරීමට අනුරාධපුරයේ නියමු ව්‍යාපෘතියක් දියත් කරන ලදී. ගොවි දිවි අරුණ යනු ගොවීන් සඳහා වන පුද්ගලික අනතුරු රක්ෂණ ආවරණයක් සහිත සෞඛ්‍ය ආවරණයකි. නැවත අලුත් කළ හැකි වාර්ෂික ඔප්පුවක් මඟින් ක්‍රියාත්මක වන නාමික වාරික ගෙවීමක් මඟින් මෙම යෝජනාක්‍රමයට මුදල් සපයනු ලැබේ.

## තොරතුරු තාක්ෂණ / තාක්ෂණයන්

දිවයින පුරා රක්ෂණ මෙහෙයුම් සිදු කිරීම සඳහා ක්ලවුඩ් කම්පියුටින් (Cloud Computing) දත්ත මධ්‍යස්ථානය වැනි නවීන තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ජා.ර.භා.අ සතුව ඇත. ජා.ර.භා.අ හි විශාල පරාසයක මෙහෙයුම් හේතුවෙන්, විශාල දත්ත ප්‍රමාණයක් හැසිරවිය යුතු රක්ෂණ ව්‍යාපාරයට සහාය වීම සඳහා අති නවීන හා ගැලපෙන පරිදි සකස් කරන ලද ඔරකල් (Oracle) පදනම් කරගත් මෘදුකාංග ආයතනය මගින් සංවර්ධනය කර ඇත. මෙම ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ පද්ධතිය (ERP) විසින් සියලුම මෙහෙයුම් කටයුතු ආවරණය කෙරෙන අතර මෙම විසඳුම් ජා.ර.භා.අ විසින් දශකයක් තිස්සේ ක්‍රියාත්මක කරන ලදී.

ගිණුම්කරණ අංශවල නිරවද්‍යතාවය වැඩි දියුණු කිරීම සඳහා SAGE ACCPAC ගිණුම්කරණ සහ මූල්‍ය මෘදුකාංග පැකේජයේ නවතම අනුවාදය හඳුන්වා දෙන ලදී.

## මානව සම්පත්

2017 අවසන් වන විට ජා.ර.භා.අ හි පුද්ගලයින් 285 ක් සේවය කරමින් සිටි අතර ඉන් බහුතරය 210 ක් වූ ස්ථිර සේවකයින් සහ කොන්ත්‍රාත් සේවකයින් වේ. ජා.ර.භා.අ විසින් 2017 දී දෛනික වැටුප් සහිත සේවකයින් 25 දෙනෙකු ද සේවයේ යොදවා ඇත. වර්ෂය තුළදී නව විධායක බඳවා ගැනීම් 2 ක් සිදු කරන ලදී. වර්ෂය තුළ සේවක පිරිවැටුම 1% ක අවම මට්ටමක පැවතුනි. මානව සම්පත් කළමනාකරණය විධිමත් කිරීම සඳහා, පවතින මානව සම්පත් පරිපාලන පද්ධතිය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගන්නා ලදී.

## අනුකූලතාවයේ තත්වය

2017 අවසානය වන විට, රාජ්‍ය පරිපාලනයට අදාළව සාප්පු හා කාර්යාල පනතේ සහ රජයේ අනෙකුත් චක්‍රලේඛවල සියලුම විධිවිධානවලට ජා.ර.භා.අ සම්පූර්ණයෙන්ම අනුකූල වී ඇත. ජා.ර.භා.අ කිසිදු සේවකයෙකුට මෙතෙක් ගෙවා නොමැති හිඟ ව්‍යවස්ථාපිත ගෙවීම් කිරීමට නොමැති අතර, 2017 මූල්‍ය වර්ෂය තුළ අදාළ වන කම්කරු නීති සමඟ අනුකූල නොවීම හෝ අනුකූල වීම ප්‍රමාද කිරීම සඳහා කිසිදු දඩයකට හෝ දඬුවමකට මුහුණ දී නැත.

| සේවක කොන්ත්‍රාත්තුවේ වර්ගය | සේවකයින් ගණන |
|---|---|
| ස්ථිර සේවක මණ්ඩලය | 183 |
| කොන්ත්‍රාත් සේවක මණ්ඩලය | 27 |
| දෛනික වැටුප් (අනියම්) | 75 |
| මුළු එකතුව | 285 |

## දුක්ගැනවිලි කළමනාකරණය

සියලුම සේවකයින්ට මානව සම්පත් ප්‍රධානියා වෙත ඕනෑම මොහොතක පැමිණ දුක්ගැනවිලි ඉදිරිපත් කළ හැකි කළමනාකරණ ප්‍රවේශයක් (Open Door) ජා.ර.භා.අ විසින් පවත්වාගෙන යනු ලබන අතර ඕනෑම දුක්ගැනවිල්ලක් සඳහා ප්‍රධාන විධායක නිලධාරියාගේ මට්ටම දක්වා ද පැමිණිය හැකිය.

## කාර්යසාධන ඇගයීම් සහ උසස්වීම්

සියලුම ස්ථිර හා කොන්ත්‍රාත් සේවකයින් 2017 දී කාර්යසාධන ඇගයීමට ලක් කරන ලදි. මීට අමතරව, 2017 දී රක්ෂණ නිලධාරී තනතුරු වල උසස්වීම් 20 ක් ලබා දෙන ලදී.

## පුහුණු හා සංවර්ධන

සියලුම රැකියා ශ්‍රේණිවල නිපුණතාවයන් වැඩි දියුණු කිරීම සඳහා ජා.ර.භා.අ විසින් පුහුණුව අවධාරණය කරනු ලබන අතර වර්ෂය තුළ බොහෝ පුහුණු වැඩසටහන් සංවිධාන කරන ලදී. 2017 සඳහා වූ පුහුණු අයවැයට විවිධ කාණ්ඩවල සේවකයින්ගේ තාක්ෂණික කුසලතා වැඩිදියුණු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා තාක්ෂණික පුහුණු අවස්ථා, සේවකයින් විවිධ වෙළඳපල සංවර්ධනයන් සඳහා නිරාවරණය කිරීමේ සම්මන්ත්‍රණ සහ අවස්ථා මෙන්ම උසස් අධ්‍යාපන සුදුසුකම් සඳහා සේවකයින්ට අනුග්‍රාහකත්වය සැපයීම් ද ඇතුළත් වේ.

## විෂය බාහිර පුහුණුව (Outward Bound Training)

ජා.ර.භා.අ විසින් නොවැම්බර් 24, 25 සහ 26 යන දිනවල සීගිරිය හෝටලයේදී (Hotel Sigiriya) විෂය බාහිර පුහුණු වැඩසටහනක් සංවිධාන කරන ලදි. මෙම වැඩසටහන අවුට්වර්ඩ් බවුන්ඩ් ට්‍රස්ට් ශ්‍රී ලංකා (Outward Bound Trust Sri Lanka) විසින් මෙහෙයවන ලදී. ජා.ර.භා.අ හි ප්‍රධාන විධායක නිලධාරියා ඇතුළු කාර්ය මණ්ඩල සාමාජිකයින් මෙම වැඩසටහනට සහභාගී වූහ.

# ව්‍යවසාය පාලනය

ව්‍යවසාය පාලනය යනු සමාගමක සහ ව්‍යාපෘතියක, නිෂ්පාදන පෙළගැස්මෙහි, යටිතල පහසුකම් වල සහ ක්‍රියා පිළිවෙත් වල කාර්යසාධනය පාලනය කරන, දිශානුගත කරන හෝ නියාමනය කරන ව්‍යුහය සහ සම්බන්ධතාවන් වේ. ව්‍යවසාය පාලනය යනු උපායමාර්ගික මග පෙන්වීම සැපයීම, ඉලක්කයන් සාක්ෂාත් කිරීම සහතික කර ගැනීම, අවදානම් නිසි පරිදි කළමනාකරණය කර ඇත්දැයි නිශ්චය කර ගැනීම සහ ආයතනයේ සම්පත් වගකීමෙන් යුතුව භාවිත කරන බව තහවුරු කිරීම යන අරමුණු වලින් යුතුව මණ්ඩලය සහ විධායක කළමනාකරණය විසින් ඉටු කරනු ලබන වගකීම් සහ භාවිතයන් සමූහයකි.

ජාතික රක්ෂණ භාර අරමුදලේ (ජා.ර.භා.අ) උපායමාර්ගික ඉහළ පෙළ විසින්, හොඳ පාලන පරිසරයක තීරණාත්මක සාර්ථක සාධකය ලෙස ශක්තිමත් ව්‍යවසාය පාලනයක වැදගත්කම හඳුනාගෙන ඇති අතර එමඟින් මෙහෙයුම් ඵලදායීතාව, කාර්යක්ෂමතාව සහ සකසුරුවම වැඩිදියුණු කරනු ඇත. එමෙන්ම එය සන්නාම ප්‍රතිරූපය වැඩි දියුණු කර, විනය, විනිවිදභාවය, ස්වාධීනත්වය, වගවීම, සාධාරණත්වය සහ සමාජ වගකීම වැනි වැදගත් ආයතනික පාලන වටිනාකම් අනුගමනය කරමින් මහජන විශ්වාසය පවත්වා ගැනීමටද උපකාර වේ.

හොඳ ආයතනික පාලනයක් තුළින් කල්පවත්නා දිගුකාලීන වටිනාකමක් ළඟා කර ගත හැකි බව ජා.ර.භා.අ හොඳින් හඳුනාගෙන ඇති අතර එබැවින් එහි හොඳින් ස්ථාපිත ආයතනික පාලන රාමුව අඛණ්ඩව වැඩි දියුණු කිරීම ඉලක්ක කරයි. ආයතනය සිය සියළුම මෙහෙයුම්, ක්‍රියාවලි සහ ව්‍යාපාරික ක්‍රියාකාරකම් වලට අදාළව ඉහළ පාලන ප්‍රමිතීන් පවත්වාගෙන යන අතර ඒවා අඛණ්ඩව ඇගයීමට ලක් කරයි. එමෙන්ම ජා.ර.භා.අ ආයතනික පාලන හොඳම භාවිතයන් සංග්‍රහය, යහපාලනය සඳහා වන රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශයන් ද ඇතුළුව ඒවාට පමණක් සීමා නොවී කර්මාන්තයට සහ සංවිධානයට අදාළ ආයතනික පාලනය සම්බන්ධයෙන් පවතින අනෙකුත් සියලුම මාර්ගෝපදේශයන් හා නිර්දේශිත හොඳම භාවිතයන් ද ඇතුළුව සියලු බාහිර නියාමන අවශ්‍යතා වලට අනුකූල වේ.

මීට අමතරව, ජා.ර.භා.අ හි සේවකයින් සියල්ලන්ම වෘත්තීය හා පෞද්ගලික ආචාර ධර්මවල ඉහළම ප්‍රමිතීන් පවත්වා ගැනීම අවධාරණය කරන දැඩි චර්යාධර්ම සංග්‍රහයකට බැඳී සිටිති. මේ ආකාරයට, සිය සියලු පාර්ශවකරුවන් වන සේවාදායකයින්, සේවකයින්, රජය සහ ශ්‍රී ලාංකික මහජනතාවගේ විශ්වාසය සෑම විටම ආරක්ෂා වී ඇති බව සහතික කෙරෙන රාමුවක් තුළ සිය මෙහෙයුම්වල සමස්ත විෂය පථය කළමනාකරණය කිරීමට ජා.ර.භා.අ කාර්යක්ෂමව කැපවී සිටී.

යහපාලනයේ පූර්ව අවශ්‍යතාවයක් වන අභ්‍යන්තර පාර්ශ්වකරුවන්ගේ කණ්ඩායම් අතර ක්‍රියාශීලී, විනිවිද පෙනෙන හා ඵලදායී සන්නිවේදනයක් පවත්වා ගැනීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය සහ ඒ ආශ්‍රිත කමිටු සියල්ලම ඔවුනොවුන් සහ සේවකයින් අතර ඵලදායී, කාර්යක්ෂම හා පුළුල් සහයෝගීතාවයක් සහ සන්නිවේදනයක් පවත්වා ගෙන යාම සහතික කිරීම සඳහා සෑම උත්සාහයක්ම දරනු ලැබේ.

යහපාලන පියවර සහ අවදානම් කළමනාකරණ පියවර ලෙස, 2017 දී, ජා.ර.භා.අ අවදානම් පදනම් කරගත් ප්‍රාග්ධන (RBC) ප්‍රවේශය සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය (CAR) ගණනය කිරීම අනුග මනය කරන ලදී.

ජා.ර.භා.අ ෆිච් රේටින් ලිමිටඩ් (Fitch Rating Ltd) වෙතින් ඒඒ- AA-(lka) ණය ශ්‍රේණිගත කිරීමක් ලබාගෙන ඇති අතර මෙය ජා.ර.භා.අ හි ශක්තිමත් මූල්‍ය තත්වය පෙන්නුම් කරයි.

## අධ්‍යක්ෂක මණ්ඩලය

ආයතනික පාලන ව්‍යුහයෙහි හරය අධ්‍යක්ෂක මණ්ඩලය වන අතර, ආයතනයේ පුළුල් අරමුණු සාක්ෂාත් කර ගැනීම සහතික වන ආකාරයට අදාළ සියලුම රජයේ ප්‍රතිපත්ති, ව්‍යවස්ථාමය හා නෛතික අවශ්‍යතාවන්ට අනුකූලව ජා.ර.භා.අ කාර්යක්ෂම ලෙස කළමනාකරණය වන බවට එහි සියලුම පාර්ශවකරුවන්ට ජාතික රක්ෂණ භාර අරමුදලේ සියලුම මණ්ඩල සාමාජිකයින් සම්පූර්ණයෙන්ම වගකිව යුතු වේ.

ජා.ර.භා.අ හි නිසි පාලන ක්‍රමයක් ක්‍රියාත්මක වන බව සහතික කිරීම මෙයට ඇතුළත් ය. 2006 අංක 28 දරණ ජාතික රක්ෂණ භාර අරමුදල් පනතට අනුව, මණ්ඩලයේ සභාපතිවරයා පත් කරනු ලැබුවේ ජා.ර.භා.අ ක්‍රියාත්මක වන රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍යවරයා විසිනි.

දීර්ඝ කාලීන තිරසාර වටිනාකමක් නිර්මාණය කිරීම සහ ලබා දීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ පාර්ශවකරුවන්ට වගකිව යුතු අතර අධ්‍යක්ෂකවරුන් ජා.ර.භා.අ හි ව්‍යාපාරික කටයුතු සහ අනෙකුත් ක්‍රියාකාරකම් සදාචාරාත්මකව සහ නියාමන හා නෛතික රාමුව තුළ කළමනාකරණය වන බවට සහතික කරයි. කෙටි කාලීන, මධ්‍යම කාලීන හා දිගු කාලීන අරමුණු සංවර්ධනය කිරීම හා පැනවීම, සමස්ත ව්‍යාපාර සැලැස්ම පිළිබඳ මග පෙන්වීම, පැහැදිලිව ව්‍යුහගත කරන ලද හා අර්ථ දක්වා ඇති මානව සම්පත් පද්ධතියක් සංවර්ධනය කිරීම, ව්‍යවස්ථාපිත අනුකූලතා මාර්ගෝපදේශ, අභ්‍යන්තර විගණනය සහ අවදානම් කළමනාකරණ මාර්ගෝපදේශ ලබාදීම මෙන්ම ව්‍යාපාරයේ ප්‍රධාන ආයෝජන සමාලෝචනය කිරීම සඳහා ව්‍යවසායක නායකත්වය සහ උපායමාර්ගික මාර්ගෝපදේශය සැපයීම ද අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම් අතරට ඇතුළත් වේ.

සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය තුළදී, ජා.ර.භා.අ මණ්ඩල රැස්වීම් 10 ක් පවත්වා ඇති අතර, මණ්ඩලයේ රාජකාරි ඉටුකිරීමට ඇති කැපවීම පෙන්නුම් කරමින් ඒ සියල්ලටම විශිෂ්ට සහභාගීත්වයක් ලැබී තිබුණි. ජා.ර.භා.අ කළමනාකාරීත්වය විසින් මූල්‍ය තත්ත්වය, ව්‍යාපාර සංවර්ධනය, අරමුණු සාක්ෂාත් කර ගැනීම, අවදානම් නිරාවරණ මෙන්ම ව්‍යවස්ථාපිත අනුකූලතාවය ඇතුළු සියලු කාරණා සම්බන්ධයෙන් පුළුල් ලෙස මණ්ඩලයට වාර්තා ඉදිරිපත් කරයි.

## මණ්ඩල රැස්වීම් සහ පැමිණීම -2017

අවශ්‍ය අවස්ථාවන් හිදී ජා.ර.භා.අ හි ව්‍යාපාරය ඉදිරියට පවත්වාගෙන යාම පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ජා.ර.භා.අ මණ්ඩලය නිතිපතා රැස්වේ. සියලුම නොපැමිණීම් කල්තියා දැනුම් දී වාර්තා කර ඇති අතර, නොපැමිණි අය යාවත්කාලීන කිරීමක් මගින් දැනුම්වත් කරනු ලැබේ. කාර්යක්ෂම හා අර්ථකාරී සාකච්ඡාවක් සහතික කිරීම සඳහා මණ්ඩල පත්‍රිකා කල්තියා සාමාජිකයන් අතර බෙදා හරිනු ලැබේ. වර්ෂය තුළ මණ්ඩල රැස්වීම් 10 ක් පවත්වා ඇත.

**පැමිණීමේ සටහන**

| මණ්ඩලය රැස්වූ මාසය (2017) | සභාපතිවරයා ද ඇතුළුව මණ්ඩල සාමාජිකයින් ගණන | සභාපතිවරයා ද ඇතුළුව මණ්ඩල රැස්වීමට සහභාගී වූ මණ්ඩල සාමාජිකයින් ගණන | ගණපූරණය |
|---|---|---|---|
| ජනවාරි | 07 | 07 | 05 |
| පෙබරවාරි | 07 | 07 | 05 |
| මාර්තු | 07 | 06 | 05 |
| මැයි | 07 | 07 | 05 |
| ජූනි | 07 | 06 | 05 |
| ජූලි | 07 | 05 | 05 |
| අගෝස්තු | 07 | 06 | 05 |
| සැප්තැම්බර් | 07 | 06 | 05 |
| ඔක්තෝම්බර් | 07 | 06 | 05 |
| දෙසැම්බර් | 07 | 06 | 05 |

## මණ්ඩල ලේකම්ගේ කාර්යභාරය

මණ්ඩල රැස්වීම් විධිමත් ලෙස සම්බන්ධීකරණය කිරීම සහතික කිරීම සඳහා මණ්ඩලයේ ලේකම් උදාරි පියභාෂිනි මෙනවිය සියළුම අධ්‍යක්ෂක මණ්ඩල තීරණ වාර්තා කොට අදාළ සියලු කරුණු පිළිබඳව අධ්‍යක්ෂවරුන් සමඟ සම්බන්ධීකරණය කරන ලදි.

## මූල්‍ය ප්‍රකාශන

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය (ICASL) විසින් පනවා ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති අතර 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්ත නියාමන පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

## ප්‍රතිසම්පාදනය

ආයතනයේ සියළුම ප්‍රතිසම්පාදන කටයුතු රජයේ නීති හා නියාමන සහ මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලබන ප්‍රතිසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව සිදු කරනු ලැබේ. අදාළ වටිනාකම් මත පදනම්ව කැබිනට් මණ්ඩලය පත් කරන ලද ප්‍රතිසම්පාදන කමිටුව (CAPC) , අමාත්‍යාංශ ප්‍රතිසම්පාදන කමිටුව (MPC) සහ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (DPC) සහාය ඇතිව සියලු වැදගත් ප්‍රතිසම්පාදන සිදු කරනු ලැබේ.

## විගණන කමිටුව

ආයතනයේ සියලුම විගණන කාර්යයන් වල නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වය හා සම්බන්ධ විවිධ කාර්යයන් සම්පාදනය කිරීම සහ බලාත්මක කිරීමේ වගකීම විගණන කමිටුව සතුවේ. මෙම කාර්යයන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද 'විගණන කමිටු සඳහා හොඳම භාවිතයන් සංග්‍රහය' ට අනුකූලව අර්ථ දක්වා ඇත.

2017 වර්ෂය තුළ විගණන කමිටුව පහත සඳහන් කරුණු ඇතුළුව විගණනයේ විෂය පථය අඛණ්ඩව සිදු කරගෙන යන ලදි.

1. අභ්‍යන්තර විගණන ඒකකයේ වගකීම් තීරණය කිරීම සහ වාර්ෂික විගණන සැලසුම් සමාලෝචනය කිරීම
2. ජා.ර.භා.අ හි සියළුම ක්‍රියාකාරකම් සහ ක්‍රියාවලීන් සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත් බව සමාලෝචනය කිරීම සහ ඇගයීම
3. පිරිවැය ඵලදායීතාවය සහ අනවශ්‍ය වියදම් ඉවත් කිරීම යනාදිය සඳහා ක්‍රමානුකූල කාල පරාසයන්හිදී මූල්‍ය කාර්ය සාධනය සමාලෝචනය කිරීම
4. බාහිර විගණකවරයා සමඟ සම්බන්ධ වී විගණකාධිපතිවරයාගේ කළමනාකරණ ලිපි පසු විපරම් කිරීම
5. ආඥාපනත්, නියාමනයන්, නීති සහ චක්‍රලේඛයන්ට අනුකූලද යන්න නිශ්චය කර ගැනීම
6. ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම
7. පිළියම් යෙදීම සඳහා අභ්‍යන්තර /බාහිර විගණන වාර්තා, කළමනාකරණ ලිපි සමාලෝචනය කිරීම
8. රාජ්‍ය ව්‍යවසායන් පිළිබඳ කමිටුවේ නිර්දේශ/නියෝග ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීම

2017 වර්ෂය සඳහා විගණන කමිටු රැස්වීම් තුනක් පවත්වන ලදී. සමාලෝචනයට භාජනය වූ වර්ෂය අභ්‍යන්තර පාලනයන්හි සැලකිය යුතු දියුණුවක් සහිත වර්ෂයක් විය. අභ්‍යන්තර විගණන වාර්තා මාසිකව සකස් කරන ලද අතර සියලු ගැටළු සහ සැළකිය යුතු කරුණු හඳුනා ගැනීම සඳහා පසු විපරම් රැස්වීම් පවත්වන ලදී. හඳුනාගත් දුර්වලතා මඟහරවා ගැනීම සඳහා පාලන සහ මෙහෙයුම් වැඩිදියුණු කළ හැකි ක්‍රම සහ පාලනයේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය වැඩි කළ හැකි විධි හඳුනාගත් අවදානම් මත පදනම්ව තීරණය කරන ලදී. අමතර පියවරක් ලෙස, අභ්‍යන්තර විගණන කණ්ඩායම විසින් රක්ෂණ ආයතන කිහිපයකට ගොස් එම ආයතන ජා.ර.භා.අ නීති හා නියාමනයන්ට අනුකූල වන්නේ දැයි නිරීක්ෂණය කරන ලදී.

## බාහිර විගණනය

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයා විසින් ආයතනයේ මූල්‍ය ප්‍රකාශනයන්හි වාර්ෂික විගණනය සිදු කරන ලදී.

## ආයෝජන කමිටුව

ආයෝජන කමිටුවේ වගකීම් ප්‍රධාන අංශ දෙකකට කාණ්ඩගත කළ හැකිය. ඒවා නම් හොඳ ආයෝජන ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ ආයෝජන ප්‍රතිපත්ති නිර්ණායක හා ජා.ර.භා.අ මාර්ගෝපදේශයන්ට අනුකූලව උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා එය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම වේ. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ජා.ර.භා.අ හි ආයෝජන පෙළගැස්ම  කළමනාකරණය, වත්කම් වෙන් කිරීම සහ වත්කම්-වගකීම් ගැලපීම කළමනාකරණය කිරීම සියුම් ලෙස පරීක්ෂා කරන ලද අතර ආයෝජන සඳහා නව අවස්ථා සෙවීම ද සිදු විය.

## ක්‍රියාකාරී කමිටුව

වැඩ වර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාදී අවදානම් යටතේ වන හිමිකම් ගෙවීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම හා තීරණ ගැනීම සඳහා වැ.ව.කැ.කො.සි.අ.ත්‍ර.අ අරමුදලේ ක්‍රියාකාරී කමිටුව පිහිටුවන ලදී. ක්‍රියාකාරී කමිටුව සාමාන්‍ය රක්ෂණ ආයතන නියෝජනය කරන ජ්‍යෙෂ්ඨ රක්ෂණ නිලධාරීන්ගෙන් සමන්විත වන අතර හිමිකම් ගෙවීම් පිළිබඳ තීරණ ගන්නා රැස්වීම් මාසිකව පවත්වා ඉන් පසුව එම තීරණ වැ.ව.කැ.කො.සි.අ.ත්‍ර.අ අරමුදලේ තාක්ෂණික උපදේශක කමිටුව වෙත යොමු කරනු ලැබේ.

## තාක්ෂණික උපදේශක කමිටුව

වැ.ව.කැ.කො.සි.අ.ත්‍ර.අ අරමුදල සම්බන්ධයෙන් සාමූහික උපායමාර්ගික තීරණ ගැනීම සඳහා වැ.ව.කැ.කො.සි.අ.ත්‍ර.අ අරමුදල සඳහා වන තාක්ෂණික උපදේශක කමිටුව පිහිටුවන ලද අතර සාමාන්‍ය රක්ෂණ ආයතන ප්‍රධානීන් හෝ ඔවුන්ගේ නියෝජිතයින්ගෙන් මෙම කමිටුව සමන්විත වේ.

## මානව සම්පත් පාලනය

මෙවැනි ක්‍රියාශීලී කර්මාන්තයකදී, අපගේ කාර්ය මණ්ඩලයේ දක්ෂතාව, කාර්යසාධනය සහ කැපවීම අපගේ සාර්ථකත්වයේ පදනම බව අපි හඳුනාගෙන තේරුම් ගෙන ඇත්තෙමු. ඔවුන්ගේ වෘත්තීය විශේෂඥතාව සහ නවෝත්පාදනයන් පිළිගැනීමට ඇති සූදානම අපගේ ව්‍යාපාරය ඉදිරියට ගෙනයාමට උපකාරී වූ අතර විශිෂ්ටත්වයේ ඉහළ ප්‍රමිතීන් ළඟා කර ගැනීම සඳහා උපායමාර්ගික මානව සම්පත් සැලසුම් කිරීමේ අවශ්‍යතාව අපි හඳුනා ගනිමු. මේ සම්බන්ධයෙන්, ආයතනය තුළ ප්‍රවීණයන් හා කුසලතාවයන් රඳවා ගැනීමේ අරමුණින් පුද්ගල සංවර්ධනය හා කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා ආකර්ෂණීය පහසුකම් නිර්මාණය කිරීම ජා.ර.භා.අ හි අරමුණයි.

## ව්‍යවසාය පාලනය

මානව සම්පත් අංශය විසින් මේ සඳහා පුළුල් හැකියා සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇති අතර අභ්‍යන්තර හා බාහිර සම්පත් දායකයින් යොදා ගනිමින් අදාළ ක්ෂේත්‍රවල සේවකයින් පුහුණු කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරයි. තාක්ෂණික දැනුම හා නිපුණතා ගොඩනැගීම සඳහා සෑම මට්ටමින්ම කාර්ය මණ්ඩලය අභ්‍යන්තර, දේශීය හා විදේශීය පුහුණුවීම් සඳහා යොමු කරනු ලැබේ. කළමනාකරණ සංවර්ධන වැඩසටහන් තුළින් අපගේ කණිෂ්ඨ කළමනාකරුවන්ට ඔවුන්ගේ වෘත්තීමය හැකියාවන් වර්ධනය කර ගැනීමට හා වෘත්තීය ප්‍රගතියට අවස්ථාවන් සලසා දෙයි. අපගේ ව්‍යාපාරය එහි දැක්ම හා උපායමාර්ගික
අරමුණු සමඟ පෙළගැස්වීමේ උත්සාහයක් ලෙස, ශක්තිමත් නායකත්වයක් ඉදිරියට ගෙන යාම සඳහා මානව සම්පත් අනුප්‍රාප්තික සැලසුම් කෙරෙහි ජා.ර.භා.අ දැඩි අවධානයක් යොමු කරයි. විශිෂ්ඨත්වය අරමුණු කරගනිමින්, සෑම මට්ටමකම සේවකයින් හට තිබිය හැකි දුක්ගැනවිලි රහස්‍යභාවය ආරක්ෂා වන අයුරින් සාකච්ඡා කිරීමට ජා.ර.භා.අ සිය කාර්ය මණ්ඩලය දිරිමත් කරයි.

ආයතනයක් වශයෙන් සමාන අවස්ථා සපයන සේවා යෝජකයෙකු විය යුතු බව අප විශ්වාස කරන අතර අපගේ බඳවා ගැනීම් වලදී ජනවාර්ගිකත්වය, සංස්කෘතිය, ස්ත්‍රී පුරුෂ භාවය සහ ජාතිය සම්බන්ධයෙන් වෙනස් කොට සැලකීමක් සිදු නොකරයි. සියලුම සේවකයින්ට උසස්වීම්, ප්‍රතිලාභ, පුහුණුවීම් සහ වන්දි ගෙවීම් සම්බන්ධයෙන් සේවා ස්ථානය තුළ සමාන අවස්ථා ලබා දී ඇත. සියළුම සේවකයින්ට, ඔවුන්ගේ පවුල් සඳහා ද අදාළ වන පුළුල් රක්ෂණ ඔප්පුවක් ලබා දී ඇති අතර, වර්ෂය තුළ රාජකාර්මය නොවන රැස්වීම් සහ විනෝද චාරිකා සංවිධාන කිරීමට සුහසාධන කමිටුවක් ක්‍රියාත්මක වේ.

මානව සම්පත කෙරෙහි වූ අපගේ අවධානය අපගේ ව්‍යාපාරයෙහි පවත්නා ප්‍රධාන ආයතනික වටිනාකම් වලින් එකකි. එබැවින් අපගේ සේවකයින් අනුකූලතාවයේ සහ තිරසාරභාවයේ  රාමුවක් තුළ ඉහළ කාර්ය සාධනයක් ළඟා කර ගැනීම සඳහා පරිශ්‍රම දරණ බව සහතික කිරීම සඳහා ස්ථාපිත කාර්යසාධන කළමනාකරණ පද්ධතියක් අප සතුව ඇත.

# ව්‍යවසාය අවදානම් කළමනාකරණය

ව්‍යවසාය අවදානම් කළමනාකරණය (ව්‍ය.අ.ක) යනු උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීමට එරෙහිව හෝ තරඟකාරී වාසි ලබා ගැනීමට ඇති අවස්ථාවන්ට එරෙහි වන අවදානම් සහිත සිදු විය හැකි සිදුවීම් ක්‍රමානුකූලව හඳුනාගෙන ඒවාට පිළියම් යෙදීමේ ක්‍රියාවලියයි.

ව්‍ය.අ.ක හි මූලික අංග වන්නේ සැලකිය යුතු අවදානම් තක්සේරු කිරීම සහ සුදුසු අවදානම් ප්‍රතිචාර ක්‍රියාත්මක කිරීමයි. අවදානම් ප්‍රතිචාර අතරට; අවදානමක් පිළිගැනීම හෝ දරාගැනීම, අවදානමක් මග හැරීම හෝ අවදානම නැති කිරීම, රක්ෂණයක්, හවුල් ව්‍යාපාරයක් හෝ වෙනත් ක්‍රමයක් හරහා අවදානම් හුවමාරුව හෝ බෙදාගැනීම සහ අභ්‍යන්තර පාලන ක්‍රියා පටිපාටි හෝ වෙනත් අවදානම් වැළැක්වීමේ ක්‍රියාකාරකම් හරහා අවදානම අවම කිරීම හෝ ලිහිල් කිරීම අයත් වේ.

අවදානම සාර්ථකව අධීක්ෂණය කිරීමට, විශ්ලේෂණය කිරීමට සහ ප්‍රතිචාර දැක්වීමට ජා.ර.භා.අ හි හැකියාව ආයතනයේ සාර්ථකත්වයෙහි කේන්ද්‍රය වේ. අවදානම ලිහිල් කිරීම සඳහා ඵලදායී පියවරයන් සෙවීමෙන්, ජා.ර.භා.අ හට අවිනිශ්චිතතාවයේ ඍණාත්මක ප්‍රතිවිපාක වළක්වා ගැනීමට හැකි වනවා පමණක් නොව, බොහෝ අවස්ථාවන්හිදී, ව්‍යාපාරයට අගය එකතු කිරීම සඳහා නව අවස්ථා නිර්මාණය වේ. ව්‍යාපාරය මෙහෙයවීමේදී ව්‍යාපාරයේ මූල්‍යමය හා මෙහෙයුම් ඉලක්කයන් සම්බන්ධයෙන් ව්‍යාපාරයට ඍජු හා වක්‍ර බලපෑම් මෙන්ම ව්‍යාපාරයේ පාර්ශවකරුවන් වෙත ද බලපෑම් එල්ල කළ හැකි අවස්ථාවන් මතු විය හැකිය. මෙවන් අවස්ථාවන් සැලකිල්ලට ගනිමින් ඵලදායී අවදානම් විශ්ලේෂණයක සහ කළමනාකරණ උපායමාර්ගයක වැදගත්කම වටහා ගෙන, ප්‍රගතිශීලී අවදානම් කළමනාකරණ උපාය මාර්ගයන් අඛණ්ඩව දියුණු කිරීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳව ආයතනය දැඩි අවධානයක් යොමු කරයි. එක් අතකින් ලාභදායිතාවය සහ ව්‍යවසායකත්ව ස්වභාවය සහ අනෙක් පසින් සමාජීය වශයෙන් සවිඥානික ව්‍යවසායයන් තුලිත කිරීම සඳහා ජා.ර.භා.අ හි අඛණ්ඩ උත්සාහය සැලකිල්ලට ගැනීමේදී, ආයතනයේ අඛණ්ඩ සාර්ථකත්වයට පූර්ව ක්‍රියාකාරී, ඵලදායී අවදානම් කළමනාකරණ උපාය මාර්ගයක් පැවතීම තීරණාත්මක වේ.

ජා.ර.භා.අ හි අවදානම් කළමනාකරණය එහි උපායමාර්ගික කළමනාකරණයේ කේන්ද්‍රීය කොටසකි. ජා.ර.භා.අ හි අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය ජා.ර.භා.අ හි ක්‍රියාකාරකම් හා සම්බන්ධ අවදානම් විධිමත් ලෙස ආමන්ත්‍රණය කරයි. ජා.ර.භා.අ හි සාර්ථක අවදානම් කළමනාකරණ මූලපිරීම ජා.ර.භා.අ හි අවදානම් මට්ටමට සමතල කිරීම සඳහා සැලසුම් කර ඇති අතර එය ආයතනයේ අනෙකුත් ආයතනික ක්‍රියාකාරකම් සමඟ සමපාත වේ. එමෙන්ම එහි විෂය පථය පුළුල් වන අතර වෙනස්වන තත්වයන්ට ප්‍රතිචාර දැක්වීමෙන් එදිනෙදා කටයුතු වලදී හා ගතිකතාවයන් සමඟ සම්බන්ධ වේ. ජා.ර.භා.අ හි අවදානම් කළමනාකරණයේ කේන්ද්‍රය වන්නේ සැලකිය යුතු අවදානම් තක්සේරු කිරීම සහ සුදුසු අවදානම් ප්‍රතිචාර ක්‍රියාත්මක කිරීමයි. ජා.ර.භා.අ හි අරමුණ වන්නේ ආයතනයේ සියලු ක්‍රියාකාරකම් වලින් උපරිම තිරසාර වටිනාකමක් ලබා ගැනීමයි.

අපගේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය, ආයතනය සහ එහි ක්‍රියාකාරකම් පිළිබඳ සමස්ථයක් ලෙස නිරීක්ෂණය කිරීමට අමතරව සියලු තනි ව්‍යාපාරික ඒකක වෙත ද යොමු වන අතර එක් එක් තනි අංශයේ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ අවදානම් හඳුනා ගැනීම සහ අවම කිරීම ඉලක්ක කරයි. මෙම ක්‍රියාවලිය අනාගත ව්‍යාපාර අවස්ථා සංවර්ධනය කිරීම සඳහා ඇති අවස්ථාවන් කල් තියා හඳුනා ගැනීමට උත්සාහ කරන අතර විශේෂයෙන් එය ආයතනයේ ඍජු හා වක්‍ර සේවාදායක පදනම සහ අනෙකුත් සියලුම පාර්ශවකරුවන්ගේ කණ්ඩායම් සවිබල ගැන්වීම හා සම්බන්ධ වේ.

අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය ආයතනයේ සෑම මට්ටමකම කාවැදී ඇති අතර, ඇගයීමේ සහ ක්‍රියාත්මක වීමේ අවසාන වගකීම ජා.ර.භා.අ හි අධ්‍යක්ෂක මණ්ඩලයට භාර වේ. නිතිපතා ඇගයීම් අවසන් වූ පසු, කළමනාකරණයේ මැදිහත්වීම ඇතිව අධ්‍යක්ෂක මණ්ඩලය වෙත අදාළ සියලු අවදානම් සාධක කරගනිමින් ව්‍යාපාර සැලසුම් සකස් කිරීමේ වගකීම පැවරේ. ප්‍රධාන අවදානම් ප්‍රතිපත්ති, අධිකාරීත්වය සහ දරාගැනීම් හඳුනා ගැනීමෙන් සහ අනුමත කිරීමෙන් මෙන්ම නිතිපතා ඇගයීම් පසු විපරම් කිරීමෙන් ව්‍යාපාර උපායමාර්ග ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම ජා.ර.භා.අ හි විගණන කමිටුවට පැවරී ඇත.

විගණන කමිටුවේ විධිනියෝගය, ලැබී ඇති සියලු අවදානම් තොරතුරු වල අදාළත්වය සහතික කිරීම සඳහා යටිතල පහසුකම්, නිපුණතා, තාක්ෂණයන් සහ සන්නිවේදනය ඇගයීමට ලක් කිරීමේ ක්‍රමවේදයන් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම දක්වා ද විහිදේ. පිළිගත හැකි අවදානම් රාමුවක් තුළ කාර්යක්ෂම හා සුරක්ෂිත මෙහෙයුම් ප්‍රවර්ධනය කරන අයුරින් සියළුම අවදානම් මූලලේඛයන් යොදා ඇති බව සහ ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා ස්වාධීන විගණනයන් නියමිත කාල පරාසයන්හිදී සිදු කරනු ලැබේ.

ආයතනය මුහුණ දෙන සියලු අවදානම් පිළිබඳ පූර්ණ (සාකල්‍ය) දෘෂ්ටියක් සඳහා ජා.ර.භා.අ විසින් ව්‍යවසාය අවදානම් කළමනාකරණ ආකෘතියක් භාවිත කරයි. මේ ආකාරයෙන්, අවදානම් පිළිබඳ හොඳ බුද්ධි තොරතුරු ලබා ගැනීමේ වාසි උපයෝගී කර ගැනීමට ජා.ර.භා.අ හට හැකි වේ. අවදානම් බුද්ධි තොරතුරු අඛණ්ඩව වැඩිදියුණු කිරීම සහතික කිරීමෙන්, විගණන කමිටුවට සහ මණ්ඩලයට විශ්ලේෂණය කිරීමට හා ඒ අනුව ක්‍රියා කිරීමට, ශක්තිමත් තොරතුරු සහ දත්ත ලබා දීමට ජා.ර.භා.අ හට හැකි වන අතර ඉන් පාර්ශ්වකරුවන්ගේ වටිනාකම වැඩි දියුණු කිරීමට හා හොඳම සේවයක් සැපයීමට හැකිවේ.

# ව්‍යවසාය අවදානම් කළමනාකරණය

උපායමාර්ගික අවදානම් අරමුණු සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම සඳහා, ජා.ර.භා.අ හි කළමනාකාරීත්වය අදාළ සියලු දේශපාලන, තාක්ෂණික, සමාජ-සංස්කෘතික හා ආර්ථික වර්ධනයන් මෙන්ම රක්ෂණ අංශයට අදාළ තරඟකරුවන්ගේ සහ පාරිභෝගික ගතිකතාවයන් සුපරීක්ෂාකාරීව අධීක්ෂණය කරයි.

ආයතනයේ අවදානම් වර්ගීකරණ රාමුව විශේෂ කාණ්ඩ තුනකට බෙදා ඇත. වළක්වා ගත හැකි අවදානම් කාණ්ඩය වඩාත්ම කළමනාකරණය කළ හැකි අතර එය ආයතනය තුළින්ම පැන නගිනු ලබයි. අනුකූලතා නීති හා නියාමනයන් මගින් මෙය කළමනාකරණය කළ හැකි අතර, අනෙක් අතට උපාය මාර්ග සම්බන්ධයෙන් වන අවදානම් හා බාහිර අවදානම් ඇතිවීමේ හැකියාව අඩු කිරීමට සහ ඒවා පිරිවැය කාර්යක්ෂමව අවම කිරීමට වෙනස් ප්‍රවේශයක් අවශ්‍ය වේ.

## වළක්වාගත හැකි අවදානම්

### ආර්01 - කීර්තිය පිළිබඳ අවදානම

සිය සන්නාමය, වටිනාකම් සහ අවංකත්වය සෑම විටම ආරක්ෂා වන බවටත් වැඩි දියුණු කරන බවටත් සහතික වන අයුරින් වෙළඳපල කීර්තිය කළමනාකරණය කිරීමේ අවශ්‍යතාව ජා.ර.භා.අ හඳුනා ගනී. මෙම මූලධර්මයට අනුකූලව එලදායී සන්නාම කළමනාකරණයක් පැවතීම පාරිභෝගිකයින්, පාර්ශවකරුවන් සහ සාමාන්‍ය ජනතාව අඛණ්ඩව ජා.ර.භා.අ කෙරෙහි විශ්වාසය පවත්වා ගෙන යාම සහතික කිරීම සඳහා ඉතා වැදගත් වේ. ආයතනයේ සෑම මට්ටමකම සහ සියලු ව්‍යාපාරික ක්‍රියාවලීන් හි ස්ථාපනය කර ඇති යහපාලනයේ මූලධර්මයන් සහ මූල්‍ය වගකීම් වලට අනුකූල වීම සහ එලදායී පාලනයන් මඟින් මෙය සහතික කෙරේ. සෑම විටම ආයතනයේ කීර්තිනාමය ආරක්ෂා කරන ආයතනික සංස්කෘතියක් පවත්වාගෙන යාමට සහ ශක්තිමත් කිරීමට ජා.ර.භා.අ අඛණ්ඩව කටයුතු කරයි.

### ආර්02 - වංචාමය අවදානම

ආයතනයට අභ්‍යන්තර හෝ බාහිර ඕනෑම ආකාරයක වංචාවන්ට එරෙහිව දැඩි ආරක්ෂාවක් සහතික කිරීම සඳහා ජා.ර.භා.අ විසින් එලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සහ ගිණුම්කරණ පද්ධතියක් පිහිටුවා ඇත. වංචනික ක්‍රියාකාරකම්වල අවදානම අවම කිරීම සහතික කිරීම සඳහා ආයතනය තුළ ඇති සියලුම අභ්‍යන්තර පාලනයන් අඛණ්ඩව සමාලෝචනය කරන එලදායී අභ්‍යන්තර විගණන අංශයක් ජා.ර.භා.අ සතුව පවතියි. මනාව ව්‍යුහගත කරන ලද මෙහෙයුම් ක්‍රියාවලීන් සහ ක්‍රියා පටිපාටිය, පැහැදිලි සන්නිවේදන මාර්ගයන් සමඟ පූර්ව අනතුරු ඇඟවීමේ සංඥා පැහැදිලිව ප්‍රකාශ කරන බව සහතික කරයි.

## උපායමාර්ගික හා මෙහෙයුම් අවදානම්

### ආර්03 - ප්‍රාරක්ෂණ අවදානම

දූරදර්ශී, පූර්ව ක්‍රියාශීලී හා එලදායී අවදානම් කළමනාකරණය සහ අවදානම් අවම කිරීම පිළිබඳ ජා.ර.භා.අ හි පුළුල් මූලධර්මයන්ට අනුකූලව යමින්, ආයතනයේ නිරාවරණය සෑම විටම සමතුලිත හා පිළිගත හැකි අවදානම් මට්ටමක් සහිත වන බව ජා.ර.භා.අ සහතික කරයි. අයදුම් කිරීමේ හා අනුමත කිරීමේ දැඩි ක්‍රියාමාර්ගයක් මඟින් සහ දූරදර්ශී නිරාවරණ සහ ආවරණ සීමාවන් පවත්වාගෙන යාම මඟින් මෙම උපාය මාර්ගය ඉටු කරනු ලබයි. මීට අමතරව, අලාභ හා රඳවා ගැනීමෙහි අත්දැකීම් අවබෝධ කර ගැනීම සඳහා ආයතනය විසින් අඛණ්ඩ අධීක්ෂණය හා ඇගයීම සිදු කරයි. අවදානම් කළමනාකරණය සඳහා ක්‍රමානුකූල ප්‍රවේශයක් අනුගමනය කිරීමෙන්, ප්‍රාරක්ෂණ ක්‍රියාවලිය සිදුවන බව සහතික කිරීමට ජා.ර.භා.අ හට හැකි වන අතර අභ්‍යන්තර විගණනයන් මඟින් සියලු මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපදින බවට වගබලා ගනී. ප්‍රාරක්ෂණයේදී නිවැරදි අවදානම් මට්ටම් පැවරීම සඳහා කාර්ය මණ්ඩලයට ප්‍රමාණවත් නිපුණතා ඇති බව සහතික කිරීම සඳහා අභ්‍යන්තරව පුහුණුව ලබා දෙනු ලැබේ.

### ආර්04 - ප්‍රතිරක්ෂණ අවදානම

සමාලෝචනයට භාජනය වූ මූල්‍ය වර්ෂය තුළදී, ඉහළ මූල්‍ය ශ්‍රේණිගත කිරීම් සහ ඉහළ ගෝලීය ශ්‍රේණිගත කිරීම් සහිත ප්‍රතිරක්ෂණකරුවන් වෙතින් 2017 සඳහා සිය ප්‍රතිරක්ෂණ පෙළගැස්ම ආවරණය කිරීම සඳහා සාධාරණ පිරිවැයක් යටතේ ප්‍රතිරක්ෂණ ආවරණ ජා.ර.භා.අ විසින් ලබා ගන්නා ලදි.

2017 දී Retrocession ගිවිසුම (Excess of Loss) සකසන ලද අතර වැඩ වර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදල ආවරණය කිරීම සඳහා Catastrophic of Excess of Loss ප්‍රතිරක්ෂණ ගිවිසුම ඇති කරන ලදී. එමෙන්ම 2017 දී ජාතික කෘෂිකාර්මික ණය ආරක්ෂණ රක්ෂණය ආවරණය කිරීම සඳහා Stop of Loss ප්‍රතිරක්ෂණ ගිවිසුමක් සහ ජාතික ස්වභාවික ආපදා රක්ෂණ යෝජනාක්‍රමය සඳහා Excess of Loss ප්‍රතිරක්ෂණ ගිවිසුමක් ද ජා.ර.භා.අ විසින් පිහිටුවන ලදී.

### ආර්05 - සංචිත ප්‍රමාණවත්බව පිළිබඳ අවදානම

ජා.ර.භා.අ විසින් වගකීම් පියවිය යුතු වූ විට ඒවා සපුරාලීමට එහි අරමුදල් සංචිත තත්ත්වය ප්‍රමාණවත් බව අඛණ්ඩව සමාලෝචනය කර සහතික කරයි.

### ආර්06 - ණය අවදානම

ආයතනය ව්‍යාපාරයේ නියැලී සිටින ආයතනවල සහ පුද්ගලයන්ගේ ණය සුදුසුකම් සහ මූල්‍ය ස්ථායීතාව පිළිබඳව ජා.ර.භා.අ අඛණ්ඩව අධීක්ෂණය කරයි. එබැවින් ජා.ර.භා.අ හි ණය අනුමත කිරීමේ ක්‍රියාවලිය ව්‍යුහගත කර ඇත්තේ ව්‍යාපාරයේ ප්‍රමාණය හා වර්ගය මත පදනම්ව වන අතර සියලු කාර්ය මණ්ඩලයට මග පෙන්වීම සඳහා ණය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර ඇත. සියළුම රක්ෂණ ඔප්පුවල වාරික ගෙවීම සම්බන්ධයෙන් ජා.ර.භා.අ දැඩි ප්‍රතිපත්තියක් අනුගමනය කරන අතර හිඟ මුදල් නොගෙවීම් සඳහා තදින් ක්‍රියාමාර්ග ගනු ලබයි.

### ආර්07 - ද්‍රවශීලතා අවදානම

නැවත මිලදී ගැනීමේ ගිවිසුම්, විවිධ කල්පිරීම් සහිත භාණ්ඩාගාර බිල්පත් සහ විවිධ කල්පිරීම් සහිත භාණ්ඩාගාර බැඳුම්කර, ණයකර වැනි විවිධ කල්පිරීම් සහිත ආයෝජන විවිධාංගීකරණය කිරීමෙන් ද්‍රවශීලතා අවදානම අවම හෙවත් හිමිකම් ගෙවීම්, ප්‍රතිරක්ෂණ ගෙවීම් සහ භාණ්ඩාගාරයට අරමුදල් මාරු කිරීම වැනි ගිවිසුම්ගත බැඳීම් ඉටු කිරීමට ඇති නොහැකියාව අවම කර ඇත. AA-(lka) ෆිච් ශ්‍රේණිගත කිරීම මගින් ජා.ර.භා.අ හි ද්‍රවශීලතාවයේ ශක්තිමත් පිහිටීම සැලකිය යුතු ප්‍රමාණයකින් නිරූපණය කරයි.

ජා.ර.භා.අ සිය සියලු අරමුදල් විවිධ වූ කල්පිරීම් සහිත රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කරන අතර ඉන් සැලකිය යුතු ප්‍රමාණයක් කෙටිකාලීන ආයෝජන සහ ප්‍රති මිලදී ගැනීම් ගිවිසුම්වල තැන්පත්කර ඇත. සුරැකුම්පත්වල කල් පිරීම් පිළිබඳ විශ්ලේෂණය මගින් වගකීම් හා බැරකම් අතර විශාල නොගැලපීමක් නොමැති බවත් අරමුදල් ප්‍රමාණවත් ලෙස ද්‍රවශීලව පවතින බවත් තහවුරු කරයි.

### ආර්08 - තොරතුරු ආරක්ෂණ පද්ධති අවදානම

පද්ධති අසමත්වීම් හෝ සයිබර් ප්‍රහාර හේතුවෙන් ආයතනය පාඩු නොලබන බව සහතික කිරීම සඳහා වඩා හොඳ ආරක්ෂාවක් වෙනුවෙන් ජා.ර.භා.අ සිය තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහ තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්ති සඳහා අඛණ්ඩව ආයෝජනය කරයි. අභ්‍යන්තර කාර්ය මණ්ඩලය පද්ධති ආශ්‍රිත නිවැරදි ක්‍රියාවලීන් පිළිබඳව අඛණ්ඩව පුහුණු කරනු ලබන අතර තොරතුරු වල රහස්‍යභාවය සහ අවංකභාවය සහතික කිරීම සඳහා පාලන යාන්ත්‍රණ ක්‍රියාත්මක වේ.

### ආර්09 - ව්‍යාපාර අඛණ්ඩතාවය පිළිබඳ අවදානම

ව්‍යාපාරයේ කෙටිකාලීන හා දිගු කාලීන අඛණ්ඩතාව සහතික කිරීම සඳහා, ජා.ර.භා.අ හට ආයතනික ආපදා ප්‍රතිසාධන සැලසුම් මෙන්ම ආයතනයේ කාර්ය මණ්ඩලය හා සම්පත් සම්බන්ධ ව්‍යාපාර ප්‍රතිසාධන සැලසුම් ඇතුළත් වන අවිනිශ්චිතතා සැලසුම් පවතියි. මෙහි අරමුණ මෙහෙයුම් කටයුතු වලට දීර්ඝ බාධාවන් සිදු වීමේ අවදානමක් නොමැති බව සහතික කිරීමයි.

## බාහිර අවදානම්

අවදානම් වල මෙම සංඝටකය බොහෝ දුරට ආයතනික පාලනයෙන් බැහැරව පැවතුනද, ජා.ර.භා.අ සිය ව්‍යාපාරයට සිදුවිය හැකි බලපෑම් මෙන්ම අවදානම් අවම කර ගත හැකි මාර්ග පිළිබඳව ද කල් තියා තක්සේරු කරයි.

### ආර්10 - සංකේන්ද්‍රණය පිළිබඳ අවදානම

ප්‍රමාණවත් පරිදි විවිධාංගීකරණය නොවූ වත්කම් පෙළගැස්මක් පැවතීම අලාභය ඉහළ යාමේ අවදානම හා බැඳී පවතියි. ජා.ර.භා.අ සම්බන්ධයෙන් ගත් කළ එහි රජයේ සුරැකුම්පත්වල ආයෝජන සංකේන්ද්‍රණයක් පවතී. රජයේ සුරැකුම්පත් සඳහා ආයෝජනය කර ඇත්තේ රජයේ නීති හා නියාමනයන්ට අනුව ය. කෙසේ වෙතත්, ඒවා අවදානම් රහිත අතිශය විශ්වාසදායක ආයෝජන බැවින් මෙහිදී කිසිදු ගැටළුවක් ඇති නොකරයි.

### ආර්11 - හිමිකම් ගෙවීමේ අවදානම

වංචනික ක්‍රියා, නෛතික හා තාක්ෂණික සාධක හේතුවෙන් ඇතිවිය හැකි ආරවුල් සම්බන්ධයෙන් වන අවදානම පාලනය කරනු ලබන්නේ හිමිකම් අනුමත කිරීමේදී දැඩි රෙගුලාසි පැනවීමෙන් සහ එම හිමිකම් සැකසීමේදී රාජකාරි බෙදීමකට ලක් කිරීමෙනි.

### ආර්12 - වෙළඳපොළ අවදානම

අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කරන ලද පැහැදිලි ආයෝජන මාර්ගෝපදේශයන් ජා.ර.භා.අ විසින් නියම කර ඇත. මෙම මාර්ගෝපදේශ මඟින් එහි ආයෝජන ඵලදායී ලෙස කළමනාකරණය කළ යුතු ආකාරය නිශ්චිතව දක්වා සිටියි. වෙළඳපොළ අවදානම සැලකිය යුතු ලෙස අවම කිරීම සහතික කිරීම සඳහා කළමනාකරණ වාර්තා සඳහා පිවිසීමට ද ආයෝජන කමිටුවට අවස්ථාව ලබා දී ඇත.

### ආර්13 - නියාමන හා අනුකූලතා අවදානම

ජා.ර.භා.අ විසින් නියාමන වෙනස්වීම් සහ විකාශනයන් යාවත්කාලීන පදනමක් මත සමීපව අධීක්ෂණය කරනු ලබයි. එමෙන්ම ව්‍යාපාරයෙහි ක්‍රියාකාරිත්වය අනුකූල වන බව සහතික කිරීම සඳහා අදාළ කර්මාන්ත සංසදයන්ට සහභාගී වන අතර ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි වරින් වර සමාලෝචනය කර අභ්‍යන්තර පාර්ශවකරුවන් වෙත සන්නිවේදනය කරනු ලැබේ.

### ආර්14 - ව්‍යාපාර අවදානම

ප්‍රතිරක්ෂණය, වැඩ වර්ජන, කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී හානි රක්ෂණය, මෝටර් රථ රක්ෂණය, අග්‍රහාර රක්ෂණය, ස්වභාවික විපත් රක්ෂණය යනාදී බොහෝ උපායමාර්ගික ව්‍යාපාර ඒකක වෙත විවිධාංගීකරණය කිරීමෙන් ව්‍යාපාර අවදානම අවම කර ඇත.

### ආර්15 - විදේශ විනිමය අවදානම

විදේශ විනිමය ගනුදෙනු අවදානම් තුරන් කිරීම සඳහා, ප්‍රතිරක්ෂණ වාරික ගෙවීම සඳහා වන ප්‍රතිරක්ෂණ ගිවිසුම් දේශීය මුදල් වටිනාකම් මත ගිවිසුම්ගත කර ඇත.

### ආර්17 - ආයෝජන ණය අවදානම

ආයෝජන ණය අවදානම අවම මට්ටමකට ගෙන ඒම සඳහා භාණ්ඩාගාර බිල්පත්, නැවත මිළදී ගැනීම් සහ භාණ්ඩාගාර බැඳුම්කර වැනි අවදානම් රහිත ආයෝජන සිදු කරනු ලබන්නේ රාජ්‍ය බැංකු හරහා පමණි.

### ආර්19 - මෙහෙයුම් අවදානම

මෙහෙයුම් පරිගණකකරණය මගින් මෙහෙයුම් අවදානම අවම කර ඇත. වාරික එකතු කිරීම සහ හිමිකම් ගෙවීම් සම්බන්ධ දෝෂ සහ විෂමතා අවම කිරීම සඳහා ජා.ර.භා.අ හි සියලුම මෙහෙයුම් අංශ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් විගණනය කරනු ලැබේ. තවද, ගනුදෙනු වල දෝෂ රහිත වීම සඳහා සියලුම කාර්යාල මෙහෙයුම් ද පරිගණක ගත කර ඇත.

# අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

ජා.ර.භා.අ කළමනාකරණය කරනු ලබන්නේ මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරන ලද පහත සඳහන් සාමාජිකයන් හත් දෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් විසිනි.

(අ) මුදල් විෂය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යංශ නිලධාරියෙකු:

(ආ) මුදල් විෂය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ ප්‍රධාන ගණකාධිකාරී:

(ඇ) සෞඛ්‍ය විෂය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යංශ නිලධාරියෙකු:

(ඈ) රාජ්‍ය පරිපාලන විෂය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යංශ නිලධාරියෙකු: සහ

(ඉ) මූල්‍ය බැංකුකරණය, රක්ෂණ කළමනාකරණය හෝ නීතිය යන ක්ෂේත්‍රවල සුදුසුකම්ලත් හෝ විශේෂඥතාව ඇති පුද්ගලයින්ගෙන් තිදෙනෙකු අමාත්‍යවරයා විසින් නම් කළ යුතුය.

අධ්‍යක්ෂක මණ්ඩලයේ එක් අයෙකු සභාපති ලෙස පත් කිරීමට අමාත්‍යවරයාට බලය ඇත. පනත අනුව, මණ්ඩලයේ සියලුම සාමාජිකයන් පත් කළ දින සිට වසර පහක කාලයක් සඳහා සිය ධුරය හෙබවිය යුතුය. 2017 වර්ෂය තුළ මණ්ඩල රැස්වීම් 10 ක් පවත්වා ඇති අතර මණ්ඩලයේ සාමාජිකයින්ගේ ඉතා හොඳ සහභාගීත්වයක් වාර්තා වී තිබේ. මණ්ඩල රැස්වීම් සඳහා සාමාජිකයින්ගේ පැමිණීම පිළිබඳ විස්තර පහත පරිදි වේ;

| අධ්‍යක්ෂක මණ්ඩලයේ සාමාජිකයන් | අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයන්ගේ පැමිණීමේ විස්තර - 2017 | | | | | | | | | | | | පත්වීමේ දිනය | ඉල්ලා අස්වීමේ දිනය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ජන | පෙබ | මාර් | අප්‍රේ | මැයි | ජූනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ | | |
| මංජුල ද සිල්වා මහතා | √ | √ | √ | | √ | √ | √ | √ | √ | √ | | √ | 06/04/2015 | |
| ට්‍රෙවින් ප්‍රනාන්දුපුල්ලේ මහතා | √ | √ | √ | | √ | √ | නොපැ | √ | √ | නොපැ | | √ | 08/04/2015 | |
| අසේන්ද්‍ර සිරිවර්ධන මහතා | √ | √ | නොපැ | | √ | √ | නොපැ | √ | නොපැ | √ | | √ | 02/04/2015 | |
| ඩී. පී.විමලසේන මහතා | √ | √ | √ | | √ | නොපැ | | | | | | | 14/12/2015 | 30/05/2015 |
| එච්. ඒ. සී. කුමාරසිංහ මහතා | √ | √ | √ | | √ | √ | √ | නොපැ | √ | √ | | √ | 14/12/2015 | |
| පී. පී. එස්. රෝහණ ද සිල්වා මහතා | √ | √ | √ | | √ | √ | √ | √ | √ | √ | | √ | 05/05/2016 | |
| කේ. ඩී. එස්. රුවන්චන්ද්‍ර මහතා | √ | √ | √ | | √ | √ | √ | √ | √ | √ | | √ | 12/08/2016 | 12/12/2017 |
| එන්. එම්. ඩී. නවරත්න මහතා | | | | | | | √ | √ | √ | √ | | √ | 31/07/2017 | |

අනුමත ව්‍යාපාර සැලැස්ම අනුව නිසි අයුරින් ව්‍යාපාරය පවත්වාගෙන යන බවට සහ ආයතනයේ මූල්‍ය හා භෞතික ඉලක්කයන් සාක්ෂාත් කර ගන්නා බවට අධ්‍යක්ෂකවරුන් විසින් පාර්ශවකරුවන්ට වගකිව යුතුය.

## ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ව්‍යාපාර සමාලෝචන

රාජ්‍ය නිලධාරීන් සඳහා වෛද්‍ය රක්ෂණ යෝජනාක්‍රමය (අග්‍රහාර), අනිවාර්ය ප්‍රතිරක්ෂණ යෝජනාක්‍රමය, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ රක්ෂණ යෝජනාක්‍රමය, මෝටර් රථ රක්ෂණ යෝජනාක්‍රමය (රජයට අයත් මෝටර් වාහන සඳහා), සාමාන්‍ය රක්ෂණ යෝජනාක්‍රම, කෘෂිකාර්මික ණය ආරක්ෂක රක්ෂණ යෝජනාක්‍රමය, ජාතික ස්වභාවික ආපදා රක්ෂණ ක්‍රමය සහ වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදල (SRCCGTF) යන අරමුදල සහ රක්ෂණ යෝජනාක්‍රම පවත්වාගෙන යාම ජා.ර.භා.අ විසින් 2017 දී සිදුකළ ප්‍රධාන කාර්යයන් වේ.

## මූල්‍ය ප්‍රතිඵල

ජා.ර.භා.අ විසින් 2016 දී රු. මිලියන 6,844 ක් වූ දළ ලිඛිත වාරිකයට (GWP) සාපේක්ෂව 2017 දී රු. මිලියන 9,071 ක දළ ලිඛිත වාරික අගයක් වාර්තා කරන ලදී. එමෙන්ම ජා.ර.භා.අ විසින් රු. මිලියන 1,077 ක බදු වලට පෙර ලාභයක් උපයා ඇති අතර එය 2016 දී රු. මිලියන 2,839 ක් විය.

## විගණකවරුන්

අධ්‍යක්ෂක මණ්ඩලයේ 2017 මූල්‍ය ප්‍රකාශය 1971 අංක 38 දරණ මූල්‍ය පනත අනුව විගණකාධිපතිවරයා විසින් විගණනය කරන ලදී.

**මංජුල ද සිල්වා**
සභාපති

**උදාරි පියභාෂිනී**
අධ්‍යක්ෂක මණ්ඩල ලේකම්

කොළඹ
2019 ජූලි 23

# විගණන කමිටු වාර්තාව

විගණන කමිටුව මණ්ඩලයේ සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත විය. 2017 වර්ෂයේදී කේ.ඩී.එස්. රුවන්චන්ද්‍ර (ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජෙනරාල්), ට්‍රෙවීන් ප්‍රනාන්දුපුල්ලේ මහතා සහ අසේන්ද්‍ර සිරිවර්ධන මහතා, එම කමිටුව හෙබවීය. විගණකාධිපති දෙපාර්තමේන්තුව නියෝජනය කරන විගණන අධිකාරිවරයා (SA) කමිටුවේ ආරාධනය මත නිරීක්ෂකයෙකු ලෙස රැස්වීම් වලට සහභාගී විය.

### විගණනයේ විෂය පථය

2017 වර්ෂය තුළ විගණන කමිටුව විසින් විගණනයේ විෂය පථය අඛණ්ඩව සිදු කරන ලද අතර පහත ඒවාද ඊට අයත් විය.

1. අභ්‍යන්තර විගණන ඒකකයේ වගකීම් තීරණය කිරීම සහ වාර්ෂික විගණන සැලසුම් සමාලෝචනය කිරීම.
2. ජා.ර.භා.අ හි සියළුම ක්‍රියාකාරකම් සහ ක්‍රියාවලීන් සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත් බව සමාලෝචනය කිරීම සහ ඇගයීම.
3. පිරිවැය ඵලදායීතාවය සහ අනවශ්‍ය වියදම් ඉවත් කිරීම යනාදිය සඳහා ක්‍රමානුකූල කාල පරාසයන්හිදී මූල්‍ය කාර්ය සාධනය සමාලෝචනය කිරීම.
4. බාහිර විගණක සමඟ සම්බන්ධ වී විගණකාධිපතිවරයාගේ කළමනාකරණ ලිපි පසු විපරම් කිරීම.
5. ආඥාපනත්, නියාමනයන්, නීති සහ චක්‍රලේඛයන්ට අනුකූලද යන්න නිශ්චය කර ගැනීම.
6. ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම.
7. පිළියම් යෙදීම සඳහා අභ්‍යන්තර විගණන / බාහිර විගණන වාර්තා, කළමනාකරණ ලිපි සමාලෝචනය කිරීම.
8. රාජ්‍ය ව්‍යවසායන් පිළිබඳ කමිටුවේ නිර්දේශ / නියෝග ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීම.

### විගණන කමිටුවේ (AC) රැස්වීම්

2017 වර්ෂය සඳහා විගණන කමිටුවේ රැස්වීම් තුනක් පවත්වා ඇති අතර කමිටු රැස්වීම්වල කටයුතු ප්‍රමාණවත් තොරතුරු සහිතව සටහන් කර නිතිපතා මණ්ඩලයට වාර්තා කරන ලදී.

### අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන සැලැස්ම ජා.ර.භා.අ හි අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද අතර විගණන කමිටුව විසින් සමාලෝචනය කරන ලදී. විගණන කමිටුවෙහි සැලකීම් අනුව ඇතුළත් කර, සැලැස්ම විගණන කමිටුව විසින් අනුමත කර මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. අභ්‍යන්තර විගණනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග සහ සිදු කරන ලද පරීක්ෂාවන් විගණන කමිටුව විසින් නිරන්තරයෙන් සමාලෝචනය කර අධීක්ෂණය කරනු ලැබීය.

### බාහිර විගණනය

විගණන කමිටුව විගණන අධිකාරීවරයාගේ අදහස් හා යෝජනා පිළිබඳව අවධානය යොමු කළ අතර බාහිර විගණන කළමනාකරණ ලිපි ද සමාලෝචනයට භාජනය කරන ලදී. ඒවා පදනම් කරගනිමින් තීරණ ගෙන ඒ පිළිබඳ විගණනයෙන් පසු විපරම් කිරීමෙන් අනතුරුව සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා කළමනාකාරිත්වය වෙත ඉදිරිපත් කරන ලදී.



**කේ. ඩී. එස්. රුවන්චන්ද්‍ර**
සභාපති
විගණන කමිටුව



# ධෛර්යවන්තව නැගිටින අයට අපි අත දෙන්නෙමු



# සැමට සුරක්ෂිත අනාගතයක් තහවුරු කිරීම

# මූල්‍ය ප්‍රකාශ

| | |
|---|---|
| IBNR & LAT සහතිකය | 57 |
| විගණකාධිපතිගේ වාර්තාව | 58 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 82 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | 83 |
| ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය | 84 |
| මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය | 86 |
| මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් | 88 |
| දොළොස් වසරක අප ආ ගමන් මග | 116 |

# IBNR සහ LAT සහතිකය

27 April 2018
To the shareholders of National Insurance Trust Fund

### National Insurance Trust Fund 31 December 2017 Net IBNR and LAT Certification

I hereby certify that the undiscounted Central Estimate IBNR provision of LKR 577,876,078 including CHE is adequate in relation to the Net Claim Liability reserves of National Insurance Trust Fund as at the 31 December 2017, net of reinsurance. This IBNR provision, together with the Case Reserves held by the Company, is expected to be adequate to meet the future liabilities, including the claims handling expenses, in respect of the Company's incurred claims obligations as at 31 December 2017, in many but not all scenarios of future experience.

At the end of each reporting period, companies are required to carry out a Liability Adequacy Test (LAT) as laid out in SLFRS 4. The LAT is performed to assess the adequacy of the carrying amount of the Unearned Premium Reserve (UPR). I hereby certify that the UPR provision of LKR 3,566,750,109 set by the Company, net of reinsurance, is adequate in relation to the unexpired risks of National Insurance Trust Fund as at 31 December 2017, in many but not all scenarios of future experience. As such, there is no premium deficiency to be recognised by the Company.

The results have been determined in accordance with internationally accepted actuarial principles.

I have relied upon information and data provided by the management of the Company and I have not independently verified the data supplied, beyond applying checks to satisfy myself as to the reasonability of the data.

**Matthew Maguire**
Fellow of the Institute of Actuaries of Australia (FIAA) For and on behalf of NMG Financial Services Consulting
Dated 27 April 2018

T: +65 6325 9855 F: +65 6325 4700 E: contact@NMG-Group.com
www.NMG-Group.com
30 Hill Street, #03-02A, Singapore 179360

# ජාතික විගණන කාර්යාලය

தேசிய கணக்காய்வு அலுவலகம்

NATIONAL AUDIT OFFICE

[illegible] / My No. [illegible]/1/17/29 | [illegible] / Your No | දිනය / Date 2019 ජූලි 03 දින

සභාපති,

ජාතික රක්ෂණ භාර අරමුදල.

**ජාතික රක්ෂණ භාර අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ජාතික රක්ෂණ භාර අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනතේ 17 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව අරමුදලේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අරමුදලේ සභාපති වෙත 2018 ඔක්තෝබර් 26 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු

කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික රක්ෂණ භාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පෙන්නුම් කරන බව මා දරන්නා වූ මතය වේ.

ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE

3

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(i) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

(අ) ප්‍රමිතියේ 31 (අ) ඡේදය ප්‍රකාරව, වත්කම් ලෙස හඳුනා ගැනීමෙන් පසු දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් එහි සාධාරණ අගය විශ්වාසදායී ලෙස මැනිය හැකි විට එහි ප්‍රත්‍යාගණිත අගයට, ප්‍රත්‍යාගණනය කළ යුතු බව සඳහන් අතර සෑම වර්ෂ 03 කට හෝ 05 කට වරක් අයිතමයක් ප්‍රත්‍යාගණනය කිරීම ප්‍රමාණවත් වන බව සඳහන් වේ. එහෙත් 2017 දෙසැම්බර් 31 දිනට පැවති ධාරණ අගය රු. 39,470,895 ක් වූ දේපළ, පිරියත හා උපකරණ වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රමිතයේ 51 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 3,432,638 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර ගෙන නොතිබුණි.

**(ii) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 21**

ප්‍රමිතියේ 29 වන ඡේදය ප්‍රකාරව, විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනුවකින් මූල්‍ය අයිතම පැන නගින විට සහ ගනුදෙනු දිනය සහ නිරවුල් කරන දිනය අතර විනිමය අනුපාතයේ වෙනසක් ඇති විට විනිමය වෙනසක් ඇති වන අතර ගනුදෙනුව එය සිදු වූ ගිණුම්කරණ කාලපරිච්ඡේදයේදීම හඳුනා ගනී. කෙසේ වුවද ගනුදෙනුවක්/ යම් වටිනාකමක් පසුව එළඹෙන ගිණුම්කරණ කාල පරිච්ඡේදයේ නිරවුල් කරන ලද්දේ නම්, එය නිරවුල් කරන කාල පරිච්ඡේදය තුළ විනිමය අනුපාතය වෙනස්වීම මත තිරණය නොකිරීම හේතුවෙන් 2017 වර්ෂයේ විනිමය අනුපාත වෙනස්කම් හේතුවෙන්, ගිණුම් තුළ ලාභය රු. 994,384 ක් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අරමුදලේ ආයෝජන ආදායම්වල දළ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවද, ශුද්ධ ආදායම ඇතුළත් කර තිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ආයෝජන ආදායම රු.123,111,800 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ii) විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, 2017 දෙසැම්බර් 31 දින වන විට වාරික ආදායම් ලෙස ලැබී තිබු නමුත්, ලදුපත් නිකුත් කිරීමේ ප්‍රමාද දෝෂය හේතුවෙන් 2017 වර්ෂයට අදාළව එකතුව රු. 17,568,213 ක් වූ වාරික මුදල් ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබූ අතර ඒ වෙනුවට එම වටිනාකම "Motor Premium Advance Collected" ගිණුමෙහි ඇතුලත් කර තිබුණි.

(iii) ලැබිය යුතු වාරික ආදායම තුළ ඇතුළත් දින 90 ඉක්ම වූ එකතුව රු. 95,978,933 ක ශේෂ සහ ලැබිය යුතු වාරික ආදායම් - ප්‍රතිරක්ෂණය තුළ වසර 06 කට අධික කාලයක සිට පැවත එන රු. 9,053,364 ක හඳුනා නොගත් ශේෂයක් සම්බන්ධයෙන් සමාලෝචනය කර බොල් හා අඩමාණ ණය සඳහා වෙන් කිරීම් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.

(iv) දිස්ත්‍රික් කාර්යාලවල දෛනික මුදල් තැන්පතු දිනයන් හා පද්ධතියට ඇතුළත් කරනු ලබන ලදුපත් දිනයන් අතර සැලකියයුතු කාල පරතරයක් පැවතීම හේතුවෙන් බැංකු ගිණුම්වලට මුදල් බැර වී තිබුණද, එම මුදල් අදාළ දිනයන්හි ආදායම් ලෙස ගිණුම්ගත වී නොමැති අවස්ථා නිරීක්ෂණය විය. ඒ අනුව, නියැදි පරීක්ෂාවේදී අනාවරණය වූ පරිදි, රු. 5,482,729 ක ආදායමක් සමාලෝචිත වර්ෂයට අදාළ ගිණුම්වල අඩුවෙන් දක්වා තිබුණි.

(v) විදේශ ව්‍යවහාර මුදලින් වූ මූල්‍ය අයිතම් සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසානයේදීම අවසාන අනුපාතිකය යොදාගනිමින් පරිවර්තනය කළ යුතු වුවද, එසේ පරිවර්තනය නොකිරීම හේතුවෙන් අරමුදලේ අවසන් මූල්‍ය ප්‍රකාශනවල රු. 5,918,344 ක ශුද්ධ ලාභයක් අඩුවෙන් දක්වා තිබුණි.

| අයිතමය | වටිනාකම |
|---|---|
| | රු. |
| ප්‍රතිරක්ෂණ අංශයෙහි ලැබිය යුතු වාරික ආදායම් ගිණුම් ශේෂ පරිවර්තනය නොකිරීම | 5,884,934 |
| SRCC අංශයේ ඇමරිකානු ඩොලර් ජංගම ගිණුමේ ශේෂය ගැලපීමේ වෙනස | 622,682 |
| විනිමය අනුපාත පරිවර්තනයේදී රු. 262,796 ක අලාභය රු. 371,872 ක ලාභයක් ලෙස පෙන්නුම් කිරීම | (589,272) |
| | 5,918,344 |

(vi) විදේශ ව්‍යවහාර මුදලින් වූ මූල්‍ය අයිතම් ගිණුම් කාලපරිච්ඡේදයක් අවසානයේදී අවසාන අනුපාතිකය යොදාගනිමින් පරිවර්තනය කළ යුතු වුවද, එසේ පරිවර්තනය නොකිරීම හේතුවෙන් ලැබිය යුතු මෝටර් නොවන වාරික ආදායම් ශේෂයෙහි රු. 56,614 ක අලාභය අවසන් මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි.

(vii) 2017 දෙසැම්බර් 31 දිනට සාමාන්‍ය රක්ෂණය - (මෝටර් නොවන) ණයගැති කාල විශ්ලේෂණය තුළ එකතුව රු. 278,024 ක් වූ බැර ශේෂයන් පැවති අතර, මෙම ශේෂ හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි.

(viii) අරමුදලෙහි මූල්‍ය ප්‍රකාශන SRCC හා NITF යන දෙඅංශයෙන් සමන්විත වන අතර එහිදී, එකතුව රු. 3,462,112 ක් වූ වෙනත් මූල්‍ය නොවන වත්කම් තුළ ඇතුළත් ලැබිය යුතු ශේෂය අරමුදලේ NITF අංශය, SRCC අංශයෙන් සේවක ආපදා ණය ලබා දීම සඳහා ලබා ගත් ණය ශේෂයක් වන අතර එය NITF අංශය මගින් නිරවුල් කර තිබුණු බව දන්වා සිටියද ඒහා සම්බන්ධ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවූනු අතරම, එය තවදුරටත් NITF අංශයෙහි ගිණුම්වල ගෙවිය යුතු ශේෂයක් ලෙසද පෙන්නුම් නොකෙරුණි. එමෙන්ම SRCC අංශයෙහි ලැබිය යුතු ශේෂයක් ලෙස නිරූපණය වුවත් එම වටිනාකමට අදාළ සාක්ෂිද විගණනයට ඉදිරිපත් නොවිය.

(ix) 2016 වර්ෂයේ විගණන ගාස්තුව රු. 886,200 ක් වූ අතර එම මුදල පදනම් කරගෙන හෝ 2017 වර්ෂයට විගණන ගාස්තු වෙන් කිරීමක් හා වර්ෂයට අදාළ වියදම ගිණුම්ගත කිරීමක් සිදු නොකිරීම හේතුවෙන් වියදම් හා බැරකම මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි.

(x) අරමුදලේ සේවකයන් සඳහා සෞඛ්‍ය රක්ෂණයක් ක්‍රියාත්මක කර තිබුණු අතර ඒ මඟින් අරමුදලේ සේවකයින් වෙත වන්දි වශයෙන් 2017 වර්ෂයේදී රු. 9,813,773 ක් ගෙවා තිබුණි. එසේ වුවද, ඊට අදාළ වාරික වටිනාකම වූ රු. 3,331,750 න් 2017 වර්ෂය තුලදී රු. 2,269,500 ක් පමණක් ලැබී තිබූ අතර ඉතිරිය වූ රු. 1,062,250 ක වාරික මුදල මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සාමාන්‍ය රක්ෂණය මෝටර් නොවන අංශයට අදාලව නියැදි පදනමක් මත තෝරාගත් ආයතයන් වෙත යැවූ ශේෂ සනාථන කැඳවීම් ලිපි වල ඇතුලත් ශේෂ හා කාල විශ්ලේෂණයෙහි ඇතුලත් ලැබිය යුතු ශේෂයන් අතර රු. 472,880 ක වෙනස්කම් විය.

(ii) මූල්‍ය ප්‍රකාශන අනුව, භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම රු. 888,946,713 ක් වුවද ශේෂ සනාථන හා විගණනයට ඉදිරිපත් කළ උපලේඛනය අනුව එය රු. 889,407,219 ක් වීම නිසා රු. 539,494 ක වෙනසක් විය. මෙම වෙනසට හේතුව කල්පිරුණු සංවර්ධන බැඳුම්කර ශේෂයක් තවදුරටත් ගිණුම්හි ඇතුළත් වී තිබීම බව නිරීක්ෂණය විය.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් එක් එක් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

| | අයිතමය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ලැබිය යුතු වාරික ආදායම - ප්‍රතිරක්ෂණය | 9,053,364 | විස්තරාත්මක උපලේඛන, කාල විශ්ලේෂණ, ශේෂ සනාථ කිරීම් |
| | | 101,030,311 | ශේෂ සනාථ කිරීම් |
| (ආ) | ලැබිය යුතු වාරික ආදායම - මෝටර් | 1,136,176 | කාල විශ්ලේෂණය, ශේෂ සනාථ කිරීම් |
| (ඇ) | ගෙවූ තැන්පතු | 270,049 | ශේෂ සනාථ කිරීම්, විස්තරාත්මක උපලේඛන |
| (ඈ) | ලැබිය යුතු චෙක්පත් හරවා යැවීම | 585,481 | විස්තරාත්මක උපලේඛන, කාල විශ්ලේෂණය, ශේෂ සනාථ කිරීම් |
| | | 112,075,381 | |

**2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි සටහන් අංක 10.1 ප්‍රකාරව, 2016/17 වර්ෂය වෙනුවෙන් ප්‍රතිරක්ෂණ ආයතන වෙතින් ලැබිය යුතු වටිනාකම රු. 4,574,100,921 ක් වූ අතර එම ශේෂය 2017 දෙසැම්බර් 31 දිනට වූ මුළු මූල්‍ය තත්ත්වයෙන් සියයට 25 ක් විය. 2016 වර්ෂයට සාපේක්ෂව එම ශේෂය රු. 954,701,937 කින් එනම් සියයට 17 කින් අඩු වී තිබුණු අතර අයවිය යුතු ප්‍රතිරක්ෂණ වටිනාකම පහත පරිදි විය.

| | වටිනාකම |
|---|---|
| | රු. |
| ලැබිය යුතු ප්‍රතිරක්ෂණය - RETRO | 2,157,672,249 |
| ලැබිය යුතු ප්‍රතිරක්ෂණය - NNDIS | 2,416,428,672 |
| | 4,574,100,921 |

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රතිරක්ෂණ ආයතන වෙතින් අයවිය යුතු ඉහත ශේෂයෙන් විගණිත දිනය වූ 2019 ජනවාරි 17 වන දින වන විට එකතුව රු. 1,590,250,491 ක් පමණක් අයකර ගෙන තිබූ අතර රු.1,679,464,649 ක් වර්ෂය තුළ ලියා හැර තිබුණි. ඉන් රු. 490,479,162 ක් ලියා හැරීම් සම්බන්ධව පමණක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් විගණනයට ඉදිරිපත් කළද, රු. 1,188,985,487 ක් කපා හැරීම් සම්බන්ධව වියිමත් අනුමැතියක් 2019 ජුලි 02 දින වන විටත් විගණනයට ඉදිරිපත් නොවිය.

(ආ) කෙසේ වුවද 2018 අප්‍රේල් 26 දිනැති අංක NITF/FIN/02/2016 දරන කළමනාකරණ නියෝජන ලිපිය අනුව, ඉහත අයවිය යුතු වටිනාකමින් රු. 3,117,190,041 ක් අය කරගත හැකි බව විගණනය වෙත දන්වා තිබුණද 2019 ජනවාරි 19 වන විට ඉන් සියයට 51 ක් හෙවත් රු. 1,590,250,491 ක් පමණක් අයකර ගෙන තිබුණි.

(ii) අග්‍රහාර රක්ෂණ සාමාජිකයින් පිළිබඳ තොරතුරු ඇතුළත් වියිමත් දත්ත පද්ධතියක් (Data base) නඩත්තු කර නොතිබීම හා හිමිකම් නිරවුල් කිරීමේ ක්‍රමවේදයේ පවතින දුර්වලතාවයන් හේතුවෙන් 2018 ජුලි 25 දින වන විටත් 2015 වර්ෂයේ සිට පැවත එන ප්‍රතික්ෂේප හිමිකම් ගෙවීම් ලෙස ගිණුම්ගත කර තිබූ රු.12,263,329 ක ශේෂ නිරවුල් කර නොතිබුණි.

(iii) 2007 වර්ෂයේ සිට SRCC අංශයට අදාළව, රු. 3,843,488 ක ආපසු ගෙවිය යුතු වාරික මුදල් ශේෂයක් පැවති අතර මෙම ගෙවිය යුතු වාරික මුදල් අදාළ රක්ෂණ ආයතන වෙත ගෙවා නිරවුල් කිරීම හෝ ඊට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සිදු කර නොතිබුණි.

(iv) වසර 03 කට අධික කාලයක සිට SRCC අංශයෙන් NITF අංශයට ප්‍රතිපූර්ණය කළ යුතුව තිබූ එකතුව රු.2,907,894 ක් ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

(v) සාමාන්‍ය රක්ෂණය මෝටර් නොවන යටතේ ලැබිය යුතු වාරික ආදායමෙහි 2015 වර්ෂයේ සිට මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙන් හා ඊට අයත් දෙපාර්තමේන්තුවලින් අයවිය යුතු ලෙස රු. 184,055 ක් දක්වා තිබූ නමුත් විගණනයේදී ලබා ගත් සනාථ කිරීම් අනුව එවැනි අයවිය යුතු ශේෂයක් නොපැවතුණි.

(vi) 2017 දෙසැම්බර් 31 දිනට රු. 323,711,536 ක් වූ ලැබිය යුතු මෝටර් නොවන සාමාන්‍ය රක්ෂණ වාරික ආදායම තුළ දින 90 ඉක්මවූ ශේෂය රු. 95,978,993 ක් වූ අතර ඒ තුළ 2015 හා 2016 වර්ෂයන්ගේ සිට පැවත එන ශේෂයන්ද විය. එම ශේෂයන් අයකර ගැනීම සම්බන්ධව මෙතෙක් අරමුදල කටයුතු කර නොතිබුණි.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

පහත සදහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 03/2015 | ලබා ගන්නා තත්කාර්ය අතුරු අග්‍රිමය එය දෙන ලද කාර්යය නිම කළ වහාම නැවත පියවිය යුතු වුවත් 2017 වර්ෂයේදී ලබා දී තිබූ රු. 1,055,115 ක උප අග්‍රිම පියවීම සඳහා මාස 02 සිට මාස 06 දක්වා කාලයක් ගත වී තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 396 | ගෙවීමට තිබෙන සෑම චෙක්පතකම වලංගු කාලය අවසන් වූ විට, එය නැවත වලංගු කිරීම සඳහා ආපසු එවන මෙන් ඉල්ලා |

| | |
|---|---|
| | හැකි තරම් ඉක්මනින් ආදායකයාට ලියා යැවිය යුතු අතර, ආදායකයා චෙක්පත ආපසු එවූවහොත් එය නැවත වලංගු කර අප්‍රමාදව ඔහු වෙත යැවිය යුතුය. අරමුදල විසින් අවලංගු කර තිබූ චෙක්පත් සම්බන්ධයෙන් අරමුදල එවැනි ක්‍රියාපටිපාටියක් අනුගමනය කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 396 (ඇ) | මාස 06 ඉකුත් වූ එහෙත් ගෙවීමට ඉදිරිපත් නොකළ වටිනාකම රු.6,860,412 ක් වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2015 | චක්‍රලේඛය ප්‍රකාරව, උත්සව අත්තිකාරම් වශයෙන් ලබාදිය හැකි උපරිම මුදල රු. 10,000 ක් වුවද, අරමුදල විසින් එම සීමාව නොසලකා කාර්යය මණ්ඩලයෙහි මූලික වැටුප පදනම් කරගෙන උත්සව අත්තිකාරම් ගෙවා තිබූ අතර ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී සේවකයින් 142 කට එම සීමාව ඉක්මවා රු. 1,871,081 ක් විධිමත් අනුමැතියකින් තොරව ගෙවා තිබුණි. |
| (ඇ) 2006 අංක 10 දරන දේශිය ආදායම් බදු පනතෙහි 113 වන වගන්තිය | යම් තක්සේරු වර්ෂයක් සඳහා කිසිදු තක්සේරුවක් කරනු ලැබ නොතිබුණ ද පිළිවෙලින් ඒ තක්සේරු වර්ෂයේ අගෝස්තු, නොවැම්බර් සහ පෙබරවාරි මාසවල 15 වන දින හෝ ඊට පෙරද, ඊලඟට එළඹෙන වර්ෂයේ මැයි මස 15 වන දින හෝ ඊට පෙරද වාර කොටස් 4 කින් ආදායම් බදු ගෙවිය යුතු බව සඳහන් වේ. කෙසේ වුවද, අරමුදල ස්වයං තක්සේරු කිරීම මත බදු ගෙවීම සිදුකර නොතිබුණි. |
| (ඈ) 2003 ජුනි 02 දිනැති අංක පීඩ්/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| - 8.3.8 වගන්තිය | අරමුදල විසින් සමාලෝචිත වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව එකතුව රු. 2,170,000 ක් අනුග්‍රහ දැක්වීම් ලෙස ලබාදී තිබුණි. |
| - 9.14. ඡේදය | චක්‍රලේඛය ප්‍රකාරව පරිපාලන අත්පොතක් පිළියෙල කර ඒ සඳහා භාණ්ඩාගාර ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඉ) | 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 49 ඡේදය | තත් කාර්යය සඳහා සාධන ලද රීති මගින් නිශ්චය කරනු ලබන යම් තොරතුරු ඇතුළත් ත්‍රෛමාසික වාර වාර්තාවක් සෑම කාර්තුවක්ම අවසන් වී දින 45 ක් ඇතුළත ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත යැවිය යුතු වුවත් අරමුදලේ කාර්තුමය වාර්තා එම කාල සීමාව තුළ ඉදිරිපත් නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය. |

## 2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) විදේශ මුදල් ගනුදෙනු සඳහා විදේශ ව්‍යවහාර මුදලින් රජයේ බැංකුවක පවත්වාගෙන ගොස් තිබූ ගිණුමක් මගින් ස්වාභාවික ආපදාවන්ට ලක් වූවන්ට වන්දි ගෙවීම් සඳහා චෙක්පත් නිකුත් කර තිබුණි. මෙම ගිණුමේ මුදල් ආපදා වන්දි ගෙවීම් සඳහා භාවිතා කිරීම සඳහා ලබා ගත් අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොවූ අතර මෙම ගිණුම දැනට භාවිතා නොවන බැවින් එලෙස යොදා ගත් බව විගණනයට දන්වා තිබුණි.

(ii) ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙ 2017 ජුනි 28 දිනැති අංක IBSL/DG/SUP/17/06/233 දරන උපදෙස් මාලාව අනුව අංශ අතර අරමුදල් මාරු කිරීම් සිදු කල නොහැකි වුවද 2016 හා 2017 වර්ෂවලදී අරමුදලේ අංශ අතර මුදල් මාරු කර තිබුණි. ඒ අනුව ප්‍රතිරක්ෂණ අංශය විසින් අනෙකුත් අංශ වෙත 2018 ඔක්තෝබර් 15 දින වන විට රු. 1,651,072,897 ක මුදලක් පියවිය යුතුව තිබුණි.

## 2.5 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතෙහි (25) වන වගන්තියේ ලාභ ආදායම නිශ්චය කිරීමේදී ඉඩදිය යුතු අඩු කිරීම්හි සඳහන් (අ) ඡේදයට අනුකූල නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය. ඊට පිළිතුරු වශයෙන් අරමුදල රාජ්‍ය අංශයේ ආයතනයක් වූ බැවින් බදු මුදල් ගෙවීම හා ගණනය කිරීම දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ සාකච්ඡා කොට සිදු කළ බවත්, එහිදී මුල් වර්ෂ සඳහා එනම් 2009 සිට ක්ෂය වීම් සඳහා වූ දීමනාව වෙනුවට ගිණුම්කරණ ක්ෂය වටිනාකම ආදායමින් අඩු කිරීමට එකඟ වූ බවත් දක්වා තිබුණි. කෙසේ වුවද, එම පිළිතුරු සනාථ කර ගැනීමට දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව සමඟ ඇතිකර ගත් එකඟතාවයට අදාළ ලිඛිත තහවුරු කිරීම් මෙතෙක් විගණනය වෙත ඉදිරිපත් නොවුණි.

(ii) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ප්‍රමිතියේ 114 වන ඡේදයෙහි (ඇ) ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශනයන්හි ඉදිරිපත් කර ඇති අයිතමවලට උපකාරක තොරතුරු සටහන් මගින් ඉදිරිපත් කල යුතු එසේම, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12 ආදායම් බදු ප්‍රමිතිය ප්‍රකාරව ආදයම් බදු ගණනය කිරීම් පිළිබඳ හෙළිදරව් කිරීම කල යුතු බව වැඩිදුරටත් සඳහන් වේ. එසේ වුවද,අරමුදල ආදායම් බදු බැරකම සටහනක් මගින් මූල්‍ය ප්‍රකාශන තුල හෙලිදරව් කර නොතිබුණි.

(iii) මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් සාමාන්‍ය රක්ෂණය මෝටර් නොවන ශුද්ධ හිමිකම් ගෙවීමට අදාළ වටිනාකම වූ රු. 185,529,964 ක් 2017 වර්ෂයේ බදු බැරකම ගණනයේදී රු. 185,631,974 ක් වශයෙන් එනම් රු. 102,010 ක් වැඩියෙන් හඳුනාගෙන තිබීම හේතුවෙන් සත්‍ය බදු බැරකම හා වර්ෂයේ ආදායම් බදු වියදම රු. 28,563 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන තුල නිරූපණය විය.

(iv) 2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනත ප්‍රකාරව බදු බැරකම ගණනය සඳහා ලාභ සහ ආදායම නිශ්චය කිරීමේදී වෙළඳ ප්‍රචාරණ වියදමින් 25% ක් සඳහා ඉඩ නොදිය යුතු බව සඳහන් කර තිබුණද, වෙනත් මෙහෙයුම් හාපරිපාලන වියදම් තුල ඇතුළත් රු. 3,980,192 ක් වූ වෙළඳ ප්‍රචාරණ වියදම් වටිනාකම බදු බැරකම ගණනයේදී රු. 2,905,750 ක් ලෙස සලකමින් ඉන් සියයට 25 ක් වන රු. 726,437 ක් පමණක් ඉඩ නොදෙන වියදමක් (Disallowable Expenses) ලෙස ආදායමට එකතු කර තිබුණි. මේ හේතුවෙන් රු. 3,980,192 ක් වූ වටිනාකමින් සියයට 25 ක් වන රු. 995,048 හා රු. 726,437 ක අතර වෙනස රු. 268,611 ක් වීම නිසා 2017 වර්ෂයේ බදු බැරකම හා බදු වියදම රු. 75,211 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන තුල නිරූපණය විය.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මෙමෙහෙයුම් කටයුතු වලින් වූ මූල්‍ය ප්‍රතිඵලය රු. 976,233,935 ක ශුද්ධ ලාභයක් වූ අතර . ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු.2,839,751,855ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,863,517,920 ක පිරිහීමක් විය. ශුද්ධ වාරික ඉපයීම් රු.2,763,322,531 කින් වැඩිවී තිබුණද, ශුද්ධ ප්‍රතිලාභ සහ වන්දි වියදම රු.4,357,544,669 කින් වැඩිවීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ රු. 4,240,847,242 ක් වූ අතිරික්තය 2014 වර්ෂය අවසානයට රු.4,737,846,670 ක් දක්වා ඉහළ ගොස් තිබූ නමුත් 2015 හා 2016 වර්ෂයන්හිදී එය පහත වැටී තිබුණි. 2017 වර්ෂයේදී එය තවදුරටත් රු. 976,233,935 ක් දක්වා එනම් රු. 1,863,517,920 කින් පහත වැටී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු. 4,326,939,182 ක් වූ අරමුදලේ දායකත්වය ඉන් පසු වර්ෂවලදී වාර්ෂිකව උච්චාවචනය වී තිබූ අතර සමාලෝචිත වර්ෂවලදී එය රු. 1,285,935,618 ක් දක්වා අඩු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනතේ 2 වගන්තියේ (උ) ඡේදය අනුව, 1995 අංක 30 දරන සමෘද්ධි අධිකාරිය පනත යටතේ ප්‍රතිලාභ ලබන තැනැත්තන් හා (ඌ) වගන්තිය ප්‍රකාරව ගොවීන්, ධීවරයින් හා ස්වයං රැකියාවල නියුක්ත තැනැත්තන් සඳහා රක්ෂණාවරණ ලබා දීම මෙම පනත මගින් ආවරණය වුවත් 2017 වර්ෂයේදී හෝ එම රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කොට දායක මුදල් (Premium) අයකර ගැනීමට අරමුදල ක්‍රියාකර නොතිබුණි.

(ii) ජාතික රක්ෂණ භාර අරමුදලේ 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව එක් එක් අංශය විසින් ක්‍රියාත්මක කල යුතුව පැවති පහත සඳහන් ක්‍රියාකරකම් වර්ෂය තුලදී ක්‍රියාත්මක නොකිරීම/ ප්‍රමාණවත් පරිදි ක්‍රියාත්මක නොකිරීම නිරීක්ෂණය විය . විස්තර පහත දැක්වේ.

| ක්‍රියාකාරී සැලැස්මට යොමුව | අංශය | විස්තරය<br>ක්‍රියාත්මක කර නොතිබීම/ ප්‍රමාණවත් පරිදි ක්‍රියා කර නොතිබීම |
|---|---|---|
| 01 | ප්‍රතිරක්ෂණ | 2017 වර්ෂයේදී මෝටර් හා මෝටර් නොවන සාමාන්‍ය රක්ෂණ සඳහා ප්‍රතිරක්ෂණය කිරීමට සැලසුම්කර තිබුණද එම කාර්යයේ මූලික කටයුතු ආරම්භ කර තිබූ නමුත් එය 2018 නොවැම්බර් 05 දින වන විටත් අවසන් කිරීමට අරමුදල අපොහොසත් වී තිබුණි. |

| | | |
|---|---|---|
| 02 | වැඩවර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්ථවාදී අරමුදල | හස්ත (Manual) ගිණුම්කරණ ක්‍රමයට ගිණුම් පවත්වාගෙන යන මෙම අරමුදලේ ගිණුම් ස්වයංක්‍රීයකරණය කර අවසන් කිරීමට සැලසුම්කර තිබුණද විගණිත දිනය වූ 2018 ඔක්තෝබර් 15 දින වන විටත් එම කටයුතු අවසන් කර නොතිබුණි. |
| 03 | සාමාන්‍ය රක්ෂණය - මෝටර් නොවන අංශය | i. පවතින රක්ෂණාවරණය පුළුල් කිරීම සඳහා ඒකාබද්ධ විදේශ රක්ෂණ ඔප්පුවක් ලබා ගැනීමට 2017 වර්ෂය තුල මෙම අංශය මගින් සැලසුම් කර තිබුණද විදේශ පහසුකම් සලසන්නෙක් හා ප්‍රතිරක්ෂණාවරනයක් ලබා ගැනීමේ නොහැකියාව මත එම කාර්යය සම්පූර්ණ කිරීමට අරමුදල අපොහොසත් වී තිබුණි.<br>ii. රක්ෂණය නොකළ රජයේ දේපල රක්ෂණය කිරීමට යෝජනා කර තිබුණද එම කටයුතු ආරම්භ කළ බවට සාක්ෂි ඉදිරිපත් නොවීය.<br>iii. ධීවර යාත්‍රා රක්ෂණාවරණය 2017 වර්ෂයේදී ආරම්භ කර තිබුණු බව අරමුදල විසින් දක්වා තිබුණද ඒ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි. |
| 04 | සාමාන්‍ය රක්ෂණය - මෝටර් අංශය | පෞද්ගලික අංශයේ මෝටර් රථ රක්ෂණ මගින්, ආදායම වැඩි කර ගැනීම, නව රක්ෂණ යෝජනා ක්‍රමයක් ලෙස රජයේ නිලධාරීන්ගේ පෞද්ගලික මෝටර් රථ රක්ෂණය කිරීම "අග්‍රහාර මෝටර්" ලෙස හඳුන්වා දීම, පාරිභෝගික කළමණාකරන වැඩසටහන මගින් පාරිභෝගිකයින් රඳවා ගැනීම හා තොරතුරු තාක්ෂණ පහසුකම් ලබාදීමෙන් ශාඛා කාර්යාල මගින් යෝජනා ක්‍රම ලබා ගැනීමට පහසුකම් සැලසීමටත් සැලසුම් කර තිබුණද වර්ෂය තුළදී එම කාර්යයන් ඉටුවීම අල්ප මට්ටමක විය. |
| 05 | ස්වාභාවික ආපදා අංශය | රක්ෂණ කර්මාන්තය සඳහා ස්වාභාවික ආපදා සංචිතයක් (Disaster Pool) නිර්මාණය කිරීමට සැලසුම් කර තිබුණු අතර ඒ සඳහා ප්‍රධාන විධායක නිලධාරි සඳහා තොරතුරු වාර්තාවක් ලබාදීමට හා එම සංචිතයෙන් ලැබෙන වාසි පිළිබඳ රක්ෂණ කර්මාන්තය දැනුවත් කිරීම ඊට ඇතුලත් විය. එසේ වුවද, 2018 ඔක්තෝබර් 15 දින වන විටත් මීට අදාලව කිසිදු කාර්යයක් ඉටුකර නොතිබූ අතර ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ එකඟතාවය නොලැබීම නිසා එය ක්‍රියාත්මක නොවූ බව අරමුදල විසින් දන්වා තිබුණි. |
| 06 | කෘෂි රක්ෂණ හා ක්ෂුද්‍ර රක්ෂණ අංශය | i. ක්ෂුද්‍ර රක්ෂණය මගින් සංක්‍රමණික සේවකයන් ද පශු සම්පත් හා ගොවීන් ආවරණය වන ලෙස රක්ෂණාවරණ හඳුන්වාදීමට සැලසුම්කර තිබුණද විගණිත දිනය වන විටත් ඒ සඳහා කටයුතු කර |

නොතිබුණි. එමෙන්ම ගොවීන් ණය බරින් වන අලාභ වලින් ආරක්ෂා කිරීම සඳහා කෘෂි ණය ආරක්ෂණ ක්‍රියාමාර්ගයක් සිදුකිරීමට සැලසුම්කර තිබුණද 2018 ඔක්තෝබර් 15 දින වන විටත් එම කාර්යය සිදුකර නොතිබුණි.

ii. ගොවි දිවි අරුණ රක්ෂණාවරණය මඟින් රු.1,200 ක වාර්ෂික වාරික ගෙවීමක් යටතේ ගොවීන් 200,000 ක් රක්ෂණාවරණය කිරීම තුළින් රු. 240,000,000 ක වාර්ෂික වාරික ආදායමක් ලබා ගැනීමට සැලසුම් කර තිබුණද ගොවීන් රක්ෂණාවරණය කිරීම හෝ කිසිදු වාරික ආදායමක් ඉපයීම සිදු කර නොතිබුණි. එසේ වුවද, ඊට අදාලව රු. 192,780 ක වියදමක් දරා තිබුණි.

| | | |
|---|---|---|
| 07 | තොරතුරු තාක්ෂණ අංශය | පවත්නා තොරතුරු පද්ධතියේ අඩුපාඩු හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම නිවැරදි නොවන බව දැනට වසර කිහිපයක සිට විගණනය විසින් පෙන්වා දී තිබුණු අතර නව තොරතුරු තාක්ෂණ පද්ධතියක අවශ්‍යතාව හඳුනා ගනිමින් නව පද්ධතියක් හඳුන්වා දීම සඳහා උපදේශන කාර්යය කිරීමට මොරටුව විශ්ව විද්‍යාලයෙන් ඉල්ලීමක් කළ බව විගණනයට දැනුම් දී තිබුණි. එසේ වුවද, ඊට අදාල ඉදිරි පියවර කිසිවක් ගෙන තිබුණු බවක් විගණනයට නිරීක්ෂණය නොවුණි. |
| 08 | මූල්‍ය අංශය | ප්‍රතිරක්ෂණය හා සාමාන්‍ය රක්ෂණය ලෙස අරමුදල වෙන් කිරීමට 2017 වර්ෂයේදී සැලසුම් කර තිබුණද එම කටයුතු වර්ෂය තුලදී සිදුකර නොතිබුණි. මෙම කාර්යය මේ වන විට ආරම්භ කර ඇතත් එය වර්ෂයකදී ක්‍රියාත්මක කිරීමට නොහැකි බව අරමුදල පවසා ඇත. |
| 09 | ආයෝජන කළමනාකරණ අංශය | ක්‍රියාකාරී සැලැස්ම අනුව මෙම අංශය මගින් පහත කාර්යයන් ඉටු කිරීමට සැලසුම් කර තිබුණද එම කාර්යයන් 2017 වර්ෂය අවසාන වන විටත් සිදු කර නොතිබුණි. |

i. ආයෝජන සම්බන්ධයෙන් පනතේ ඇති විධිවිධාන වෙනස් කිරීමට කටයුතු කිරීම.

ii. ආයෝජන ප්‍රතිලාභ උපරිම කිරීමට පෞද්ගලික අංශය මඟින් රජයේ සුරකුම්පත්වල ආයෝජන කිරීම සඳහා කටයුතු කිරීම

iii. රෝහල්වල කොටස් මිලදී ගැනීමෙන් ආයෝජනය ශක්තිමත් කිරීම.

iv. ආයෝජන වෙළෙඳපළ පිළිබඳ පර්යේෂණ සිදු කිරීම.

10 අග්‍රහාර අංශය

(i) 2005 මැයි 18 දිනැති අංක 12/2005 (i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (ii) හා (iii) වගන්ති ප්‍රකාරව, රාජ්‍ය නිලධාරීන් අග්‍රහාර රක්ෂණය සඳහා අනිවාර්යෙන් ලියාපදිංචි කළ යුතු බවත් දක්වා තිබුණි. එහෙත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ තොරතුරු අනුව, 2017 වර්ෂය අවසානයට ත්‍රිවිධ හමුදාව හැර මුළු රාජ්‍ය නිලධාරීන් 1,119,441 ක් වුවද විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, 2018 සැප්තැම්බර් 10 දින වන විට මෙම යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි මුළු රාජ්‍ය නිලධාරීන් ගණන 696,501 ක් පමණක් විය. ඒ අනුව අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමයට දැනට වසර 12 ක් ගත විය යුතු රාජ්‍ය නිලධාරීන්ගෙන් සියයට 38 කට ආසන්න ප්‍රමාණයක් අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි කර ගැනීමට අරමුදල අපොහොසත් වී තිබුණි.

(ii) සාමාජිකයන් සඳහාම වෙන වෙනම සාමාජික ගිණුම් පවත්වා ගෙන යාම, මාසික ගිණුම් යාවත්කාලීන කිරීම හා අග්‍රහාර හිමිකම් ගෙවීම වේගවත් කිරීමේ අරමුණින් අග්‍රහාර රක්ෂණ ක්‍රමය යටතේ අරමුදලට ලැබෙන වාරික මුදල් මාසික අවකරණ ලැයිස්තුවට අනුව නිලධාරියාගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කර මෘදු පිටපත් මගින් හෝ සංයුක්ත තැටියක් මගින් අරමුදලට ලැබීමට සලස්වන ලෙස දන්වමින් ආකෘති පත්‍රයක් 2017 පෙබරවාරි 06 දින අරමුදල විසින් හඳුන්වා දී තිබුණි. එසේ වුවද ආයතන 1744 ක් අතුරින් ආයතන 257 ක් ඒ අනුව කටයුතු කර නොතිබූ අතර ඊට අදාල ඉදිරි ක්‍රියාමාර්ග ගෙන අග්‍රහාර රක්ෂණය සඳහා විධිමත් දත්ත පදනමක් සැකසීමට හා ඉහත අරමුණු සාර්ථක කර ගැනීමට අරමුදල අපොහොසත් වී තිබුණි.

(iii) රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 37 (1) වගන්තිය (පසුව සංශෝධනය කරන ලද 16 වන වගන්තිය) අනුව සෑම රක්ෂණකරුවෙකුම විසින්ම රක්ෂණ ඔප්පු දරන්නන්ගේ සුභ සිද්ධිය ප්‍රමාණවත් ලෙස සුරක්ෂිත වන්නේද යන්න පරීක්ෂා කිරීමේ කාර්යය සඳහා, රක්ෂණකරු විසින් නිකුත් කරනු ලැබූ සියලු රක්ෂණ ඔප්පු ආකෘති හා එම රක්ෂණ ඔප්පු ආකෘති පත්‍ර වලට සිදු කරනු ලබන යම් සංශෝධන සහ ලිඛිතව කරන ලද නිවේදනවල පිටපත් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත යැවිය යුතුය. එහෙත් එම ආයතනයේ අධීක්ෂණයට යටත් කර ඇති ජාතික රක්ෂණ භාර අරමුදල විසින් 2016 වර්ෂයේදී රජයේ සේවකයින් වෙනුවෙන් ආරම්භ කරන ලද අග්‍රහාර රන්, රිදී හා විශ්‍රාමික රක්ෂණ

යෝජනා ක්‍රමය හා අර්ධ රාජ්‍ය නිලධාරීන් සඳහා වන රන් හා රිදී රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා එසේ කටයුතු කර නොතිබුණි.

(iv) අරමුදල විසින් 2011 හා 2015 වර්ෂවල කාඩ්පත් ඇතුළුව රු.25,743,020 ක් වැය කර අග්‍රහාර චුම්භක කියවීම් යන්ත්‍ර 45 ක් මිලදී ගෙන තිබූ අතර එයින් යන්ත්‍ර 17 ක් පමණක් රෝහල් වෙත නිකුත් කර තිබුණි. රෝහල් වෙත නිකුත් කර තිබූ යන්ත්‍ර අතුරින් යන්ත්‍ර 7 ක් රෝහල්වල ජාල පද්ධතියක් සමඟ සම්බන්ධ කර කටයුතු කරගෙන යාමට අපහසු බව දන්වමින් 2018 ජනවාරි මස අරමුදලට ආපසු භාර දී තිබූ අතර යන්ත්‍ර 22 ක් රෝහල් වෙත නිකුත් කර නොතිබුණි. කෙසේ වුවද ඉන් යන්ත්‍ර 05 ක් පරිහරණය කර නොහැකි තත්ත්වයක පැවති අතර, යන්ත්‍ර 7 ක භෞතික පැවැත්ම විගණනයට අනාවරණය නොවීය. ඒ අනුව යන්ත්‍ර මිලදී ගැනීමේ අරමුණ ඉටු වූයේද යන්න පිළිබඳව විගණනයේදී ප්‍රශ්නකාරී විය. එසේ වුවද වර්තමානයේ වඩාත් ඵලදායී සැමටම පහසු වූ පද්ධති ක්‍රමයක් තුළින් සාමාජිකයන් හඳුනාගැනීමේ ක්‍රමයට මාරු වී ඇති බවත් කාඩ්පත් කියවීමේ යන්ත්‍ර ලබා දීම ඵලදායීත්වයෙන් අඩු බවත් අරමුදල විසින් විගණනයට දන්වා තිබූ අතර ඒ අනුව ඉහත වියදම නිශ්ඵල වියදමක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

(v) අරමුදලේ අග්‍රහාර කාඩ්පත් ඉදිරිපත් කරන සාමාජිකයන් වෙත පහසුකම් ලබාදීම සඳහා රෝහල් 22 ක් සමග අරමුදල ගිවිසුම්වලට එළඹ ඇති බව විගණනයට දන්වා තිබුණු අතර ඉන් රෝහල් 13 ක ගිවිසුම් කාලය අවසන් වී ඇති බව නිරීක්ෂණය වුවද, නව ගිවිසුම් වලට ඇතුළත් වී නොතිබුණි. තවද, විශ්‍රාමික හා අර්ධ රාජ්‍ය නිලධාරීන් සඳහා 2016 හා 2017 වර්ෂවලදී හඳුන්වා දී තිබූ අග්‍රහාර කාඩ්පත් නිකුත් කිරීම සිදුකර නොතිබුණි.

(vi) ගිවිසුම අනුව, අග්‍රහාර හැඳුනුම්පත් හරහා සාමාජිකයන් හඳුනා ගැනීම සඳහා පද්ධති පහසුකම් ලබාදෙන බව දක්වා තිබුණද, වලංගු ගිවිසුම් 02 අතුරින් එක් රෝහලක් සඳහා පමණක් එම පහසුකම් ලබා දී තිබුණි. අග්‍රහාර සාමාන්‍ය, රන් හා රිදී කාඩ්පත් නිකුත් කළ ද එම කාඩ්පත් සඳහා වෙනමම නව වට්ටම් ගාස්තු හඳුන්වාදීමක් නිරීක්ෂණය නොවුණු අතර රන් හා රිදී රක්ෂණ සාමාජිකයන් රෝහල් වලට හඳුන්වාදීමෙන් සාමාජිකයාට ලැබෙන ප්‍රතිලාභද මෙතෙක් ආයතනය හඳුන්වාදී නොතිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

**(අ) ජාතික රක්ෂණ භාර අරමුදල, ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය යන නම භාවිතා කිරීම**

ජාතික රක්ෂණ භාර අරමුදල, ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය යන නමද භාවිතා කර තිබුණි. මේ පිළිබඳ විමසීමේදී අරමුදල දක්වා තිබුණේ, 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනතේ 4 වන වගන්තියේ ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය පිහිටුවීම සම්බන්ධව සඳහන් කර ඇති එහි සඳහන් පරිදි, පනතේ 6 වන වගන්තියේ නිශ්චිතව සඳහන් වන තැනැත්තන්ගෙන් සමන්විත (මෙහි මින් මතු මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන) ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලයක් පිහිටුවනු ලබන අතර එම වගන්තියෙන් ගම්‍ය වන්නේ ආයතනය ජාතික රක්ෂණ භාර අරමුදල හෝ ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය යන නාමයෙන් හැඳින්විය හැකි වුවද රක්ෂණ ක්ෂේත්‍රයෙහි ආයතනය ප්‍රසිද්ධියට පත්ව ඇත්තේ ජාතික රක්ෂණ භාර අරමුදල යනුවෙන් බවයි.

(ආ) පහත සඳහන් නිරීක්ෂණයන් ද කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සාමාන්‍ය රක්ෂණ මෝටර් නොවන අංශයේ ලැබිය යුතු වාරික ආදායම රු. 178,870,895 කින් ඉහල ගොස් තිබූ අතර එම ආදායම අයකර ගැනීමේ ක්‍රමවත් ක්‍රියාපටිපාටියක් විගණනයේදී නිරීක්ෂණය නොවිය. තවද, එම අයවිය යුතු ශේෂයන්හි ඇතුලත් දින 360 කට වඩා අධික ණයගැති කාල සීමාවක් සහිත ණයගැතියන් සඳහා 2017 වර්ෂයේදීද ඉන්වොයිස් පත් නිකුත් කර තිබුණු බව නිරීක්ෂණය විය. ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමේ ප්‍රමාදයන් අරමුදලේ මුදල් ගලා ඒම සීමා වීමට හේතු වී තිබූ අතර එම මුදල් අයකර ගැනීමට අවශ්‍ය පියවර නොගෙන නැවත නව රක්ෂනාවරණ ලබාදීමට අරමුදල කටයුතු කර තිබුණි.

(ii) පනතේ 54 වන වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක අයිආර්සීඑස්එල්/ඩීජී/එල්ජී/18/03/139 හා 2018 මාර්තු 27 දිනැති ලිපියෙන්, ජාතික රක්ෂණ භාර අරමුදලේ කටයුතු පිළිබඳව විමර්ශනයක් සිදු කිරීම සඳහා ස්වාධීන විගණකයෙකු පත් කිරීමට තීරණය කර තිබුණු අතර ඊට අදාළ කටයුතු මෙම වාර්තාවේ දින වන විටත් අවසන් වී නොතිබුණි.

(iii) 2005 මැයි 18 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 12/2005 මගින් අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ සියළුම නිලධාරීහු ඒ සඳහා සුදුසුකම් ලබන බව සඳහන් වූ අතර

2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල පනතේ 2 වන වගන්තිය ප්‍රකාරවද මෙම රක්ෂණ යෝජනා ක්‍රමයෙන් අර්ධ රාජ්‍ය නිලධාරීන් ආවරණය නොවුණි. එසේ තිබියදීත් අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් මත 2018 අගෝස්තු 31 දින වන විට අර්ධ රාජ්‍ය ආයතන 30 ක් අග්‍රහාර රක්ෂණය යටතේ ප්‍රතිලාභ ලබන බව විගණනයට නිරීක්ෂණය විය. තවද, 2017 දෙසැම්බර් 31 දින විට අර්ධ රාජ්‍ය ආයතන 12 කින් දායක මුදල් ලෙස රු. 14,915,950 ක් රැස්කරගෙන තිබුණු අතර ප්‍රතිලාභ ලෙස රු.7,183,772 ක් ගෙවා තිබුණි.

## 5. තිරසර සංවර්ධන

### 5.1 තිරසර සංවර්ධන අරමුණු ලභා කර ගැනීම

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය හා තිරසර සංවර්ධන පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර "2030 න්‍යාය පත්‍රය" අනුව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර, සමාලෝචිත වර්ෂයට අදාළව අරමුදල විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබීම හේතුවෙන් තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළගා විය යුතු ආකාරය, ඉලක්ක මැන බැලීම සඳහා වන දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි.

## 6. ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2011 නොවැම්බර් 04 දින පෞද්ගලික ආයතනයකින් මුළු පිරිවැය රු.21,820,000 කට චුම්භක කාඩ්පත් 650,000 ක් සහ චුම්භක කාඩ්පත් කියවන යන්ත්‍ර 20 ක් මිලදී ගැනීම සඳහා ඇණවුම් කර තිබුණි. ඒ සඳහා අරමුදල වෙතින් එහි මුළු වටිනාකමින් සියයට 20 ක් හෙවත් රු.4,364,000 ක් අත්තිකාරම් මුදල් ලෙස ගෙවා තිබුණි. 2014 ඔක්තෝබර් 10 දින කාඩ්පත් 221,630 ක් සපයා තිබුණද 2012 මාර්තු 21 දින කාඩ්පත් 100,000 ක් සඳහාත් 2012 ජූලි 24 දින කාඩ්පත් 150,000 ක් සඳහාත් පිළිවෙලින් රු.2,440,000 ක් සහ රු.3,585,000 ක් ගෙවීම කර තිබුණු අතර කාඩ්පත් 28,370 ක් වෙනුවෙන් රු.865,285 ක් වැඩිපුර ගෙවා තිබුණි. 2014 වර්ෂයේ මුද්‍රණය කළ එම කාඩ්පත වර්තමානයේ ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණු අතර එම ආයතනය ද ක්‍රියාත්මක තත්ත්වයේ නොවීය. එම වැඩිපුර ගෙවූ මුදල් අය කර ගැනීම හා ඊට

අදාළව ගත් ඉදිරි ක්‍රියාමාර්ගය විගණනය විසින් විමසා සිටියද ඒ සඳහා මෙතෙක් පිළිතුරු නොලැබුණි.

(ii) 2015 වර්ෂයේදිද රු. රු.3,923,020 ක් වැය කර චුම්භක කාඩ්පත් 300,000 ක් සහ චුම්භක කාඩ්පත් කියවන යන්ත්‍ර 25 ක් මිලදී ගෙන තිබූ අතර එම ප්‍රසම්පාදනයට අදාළව සැපයුම්කරු විසින් ඉදිරිපත් කළ මිල ගණන් හා අදාළ ප්‍රසම්පාදන ලිපිගොනු විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර අස්ථානගත වී ඇති බව වාර්තා වී තිබුණි.

(iii) 2018 ජූනි 07 දින අරමුදල වෙත ලැබී තිබූ චුම්භක කාඩ්පත් 10,000 ක් අදාළ සාමාජිකයන් වෙත බෙදා හැරීමට මෙම වාර්තාවේ දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(iv) 2016 අයවැය යෝජනා මගින් සුලිසුළං, කුණාටු, නියඟ, ගංවතුර, නායයෑම්, හරිතෙන් කුණාටු, භූ චලන, සුනාමි සහ එවැනි අනෙකුත් කවර හෝ ස්වාභාවික විපත්වලින් ඇති වන පාඩු ආවරණය කරගැනීම සඳහා රක්ෂණ යෝජනා ක්‍රමයක් යෝජනා කර තිබුණි. ඒ අනුව ඒකපුද්ගල රක්ෂණාවරණය රු.මිලියන 2.5 ක්ද ආපදාවන්ට ලක්වන එක් පුද්ගලයෙකු වෙනුවෙන් උපරිමය රු. ලක්ෂයක ආවරණයක්ද, හිමිවන පරිදි රු.මිලියන 10,000 ක සමස්ත රක්ෂණාවරණයක් හා සමුද්‍රෙහි ධීවර කර්මාන්තයෙහි යෙදී සිටිනා අතරතුර හදිසි අනතුරුවලට මුහුණ දෙන ධීවරයින් වෙනුවෙන් රු.මිලියන 01 ක හදිසි අනතුරු මරණ රක්ෂණාවරණයක්ද හඳුන්වා දීමට යෝජනා කර තිබුණි. යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම පිණිස අයවැය මගින් රක්ෂණ වාරික ලෙස 2016 වර්ෂයේදී රු.මිලියන 300 ක්ද, 2017 වර්ෂයේදී රු. මිලියන 500 ක ප්‍රතිපාදන අරමුදල වෙත ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකළ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

i. 2016/2017 වර්ෂ සඳහා ප්‍රතිරක්ෂණාවරණයේ මුළු වටිනාකම රු.මිලියන 420 ක් වූ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 හා ඊට අදාලව සිදු කළ සංශෝධනවලට අනුව, රු. මිලියන 200 ට වඩා වැඩි ප්‍රසම්පාදන අමාත්‍ය මණ්ඩලය විසින් පත්කල ප්‍රසම්පාදන කමිටුවක (CAPC) නිර්දේශය මත සිදුකළ යුතු වුවද, මෙම ප්‍රසම්පාදනය ආරම්භයේදී, අරමුදල එසේ නිර්දේශ ලබා ගෙන නොතිබුණි.

ii. අරමුදල විසින් ප්‍රතිරක්ෂණාවරණය සම්බන්ධයෙන් විධිමත් ප්‍රසම්පාදන ක්‍රමයක් අනුගමනය නොකොට සැපයුම්කරුවෙකු තෝරා ගෙන ඒ සඳහා 2017 මැයි 30 දින අමාත්‍ය මණ්ඩල ආවරණ අනුමැතියක් පමණක් ලබාගැනීමට ක්‍රියාකර තිබුණි. කෙසේ වුවද, මෙම අනුමැතිය ලබා ගන්නා

අවස්ථාව වන විටත් එනම් 2016 අප්‍රේල් 06 දින වන විට අදාළ ප්‍රතිරක්ෂකයා වන පුද්ගලික සමාගම සමඟ අරමුදල ගිවිසුමකට එළඹ තිබුණි.

ii. 2016/17 වර්ෂයට අදාළ ප්‍රතිරක්ෂණාවරණ කාලපරිච්ඡේදය 2017 මාර්තු 31 දිනෙන් අවසන් වී තිබුණු අතර එය නැවත අළුත් කිරීම සඳහා ක්‍රියා කර තිබුණි. ඊට අදාළ ප්‍රසම්පාදන කටයුතුද විධිමත්ව සිදුකළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

v. එම ප්‍රසම්පාදනය සඳහා අරමුදල පිළියෙල කර තිබූ කාල රාමුව හා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට දන්වා ඇති ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළ කාල රාමුව එකිනෙකට වෙනස්විය. එසේම, මෙම කාල රාමුව, 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සංශෝධන 31 හි සඳහන් ප්‍රසම්පාදන කටයුතුවලට අදාළ කාල රාමුව හා එකඟ නොවිය. කෙසේ වුවද, අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණික කමිටුව පත් කිරීම සඳහා ගත වූ කාලය හා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට ගත වන කාලය හේතුවෙන් මෙම ප්‍රතිරක්ෂනාවරණය අළුත් කිරීම ප්‍රමාද වීමට බලපා ඇති බව අරමුදල විසින් කරුණු දක්වා තිබුණි.

v. නැවතත් 2018/19 වර්ෂය සඳහා ප්‍රතිරක්ෂණාවරණය 2018 මැයි 27 දින සිට ක්‍රියාත්මක කළ යුතුව තිබුණද පැරණි ප්‍රතිරක්ෂණාවරණ ගිවිසුම 2018 මැයි 27 දින සිට 2018 ජූලි 31 දක්වා අරමුදල විසින් දීර්ඝ කර තිබූ අතර ඒ වෙනුවෙන් රු. 149,923,973 ක් අමතර මුදලක් ප්‍රතිරක්ෂණ ආයතනය වෙත ගෙවා තිබුණි. එම ගිවිසුම සඳහා විගණන දිනය වූ 2018 ඔක්තෝබර් 15 දින වන විටත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය හෝ ලැබී නොතිබීම හේතුවෙන් අදාළ ගිවිසුමට දෙපාර්ශවය ඇතුල් වී නොතිබුණි.

i. 2017 අංක 23 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 79 වගන්ති ප්‍රකාරව, කිසිම තැනැත්තෙකු, ඒ තැනැත්තා මණ්ඩලය විසින් ප්‍රදානය කරන ලද තැරැව්කරුවෙකු වශයෙන් ලියාපදිංචි කිරීමේ සහතිකයක් දරන්නෙකු නම් හා මණ්ඩලය විසින් අනුමත කරන ලද රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමයක සාමාජිකයෙකු වන්නේනම් මිස, රක්ෂණ තැරැව්කරුවෙකු වශයෙන් ක්‍රියා කිරීම හෝ එලෙස පෙනී සිටීම හෝ නොකළ යුතු බව සඳහන් වුවද, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ලියාපදිංචි නොවූ තැරැව්කරුවෙකු හරහා අරමුදලේ අංශ 03 ක 2017 සහ 2018 වර්ෂවල ප්‍රතිරක්ෂණාවරණ ලබාගෙන තිබුණි.

**6.1 අවිධිමත් ගනුදෙනු**

---

අරමුදලේ ප්‍රධාන කාර්යාලයේ ගොඩනැගිලි බදු කුලී ගිවිසුම 2017 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් වී තිබුණු අතර ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව නැවත එම ගොඩනැගිල්ල බදු කුලිය රු. 1,650,000 ක සිට රු. 2,400,000 ක් දක්වා වැඩි කර කුලියට ගෙන තිබුණි. පසුව එනම් 2017 දෙසැම්බර් 15 දින අරමුදල ගිවිසුමට එළඹී තිබුණද එම ගොඩනැගිලි කුලී තක්සේරුවක් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීමට ක්‍රියා කර නොතිබුණි. එසේම පැරණි ගිවිසුමේ නොවූ සේවා ගාස්තුවක් ගෙවීමටත් ඊට අදාල දඩ මුදල් ගෙවීමටත් අරමුදල එකඟ වී තිබුණි.

**6.2 හඳුනාගන්නා ලද පාඩු**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2016/2017 වර්ෂ සඳහා වූ ප්‍රතිරක්ෂණ ගිවිසුම 2017 අප්‍රේල් 01 දින අවසන් වූ නමුත් එදින සිට එම ගිවිසුම අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා නව ප්‍රතිරක්ෂණ ගිවිසුමට එළඹීමට අරමුදල අපොහොසත් වී තිබූ අතර , ඒ හේතුවෙන් 2017 මැයි 25 දින ඇති වූ ගංවතුර හා නායයෑම් ආපදා තත්වයන්ගෙන් විපතට පත් ජනතාව වෙනුවෙන් සහන ලබා දීමේදී ප්‍රතිරක්ෂණ සමාගම වෙතින් අරමුදල වෙත සහාය ලබා ගැනීමට නොහැකි වී තිබුණි. ඒ අනුව, ඊට අදාළ වන්දි ලෙස රු. 1,497,914,007 ක මුදලක් අරමුදලට ගෙවීමට සිදු වී තිබුණු අතර ප්‍රතිරක්ෂන ගිවිසුම ක්‍රියාත්මක වූයේ නම් අරමුදල වෙත ලබාගත හැකිව තිබූ රු. 497,914,007 ක් අරමුදලට අහිමි වී තිබුණි. එසේම, 2017 නොවැම්බර් මස සිදු වූ ආපදාව සඳහා වන්දි ගෙවීම් වල වටිනාකම ප්‍රතිරක්ෂකයින් විසින් ගෙවනු නොලබන අවම සීමාව (Deductibal Claim Expense) ඉක්මවා නොතිබූ බැවින් ඒ සඳහාද ප්‍රතිරක්ෂන සමාගම වෙතින් වන්දි අරමුදලට ලැබී නොතිබුණි. එසේම, අරමුදල විසින් ප්‍රතිරක්ෂණ ගිවිසුමට පරිබාහිරව රු.476,614,977 ක් වූ ගෙවීම් සිදු කර තිබුණු අතර ප්‍රතිරක්ෂකයින් විසින් එම මුදල් ප්‍රතිපූර්ණය කිරීම, ප්‍රතික්ෂේප කර තිබීම හේතුවෙන් එම වටිනාකමින් අරමුදලට අලාභයක් සිදු වී තිබුණි.

(ii) 2016 හා 2017 වර්ෂවලදී ලැබිය යුතු ප්‍රාරක්ෂණ ශේෂ සඳහා මුදල් ලැබීමේදී විනිමය අනුපාත වෙනස්වීම මත පිළිවෙලින් රු. 3,888,779 ක් හා රු. 13,005,027 ක අලාභයන් සිදු වී තිබුණි.

## 6.3 කාර්යමණ්ඩල පරිපාලනය

2017 දෙසැම්බර් 31 දිනට අරමුදලේ අනුමත කාර්ය මණ්ඩලය 271 ක් හා සත්‍ය කාර්ය මණ්ඩලය 211 ක් වූ අතර ස්ථිර කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 60 ක් පැවතුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 05 ක් පැවති අතර ඒ තුළ සහකාර සාමාන්‍යාධිකාරී තනතුරක්, කළමනාකරු තනතුරු 03 ක් හා අභ්‍යන්තර විගණන තනතුරක් ඇතුළත් විය. ඉහත තනතුරු සඳහා 2018 සැප්තැම්බර් 01 දින සිට වැඩ බැලීමේ පදනම මත නිලධාරීන් පත් කර තිබුණි.

(ආ) ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 13.3 ඡේදය ප්‍රකාරව වැඩ බැලීමේ පත්වීමක් කල යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණක් වුවත් නිත්‍ය පත්වීම් සිදු කිරීමකින් තොරව තනතුරු 04 ක් සඳහා මාස 04 කට අධික කාලයක සිට වැඩ බැලීමේ පත්වීම් සිදුකර තිබුණි.

(ඇ) විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව ඉහත අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවන දෛනික වැටුප් ලබන නිලධාරීන් 68 දෙනෙකු සහ කොන්ත්‍රාත් පදනම මත වැටුප් ලබන නිලධාරීන් 29 දෙනෙකු සමාලෝචිත වර්ෂය තුළ බඳවා ගෙන තිබුණි. කෙසේ වුවද, එම බඳවා ගැනීම්වලට අදාලව ලිපිගොනු පවත්වා නොතිබුණු අතර පුවත්පත් දැන්වීම් පල කර විධිමත් පරිදි බඳවා ගැනීම් සිදු කර තිබූ බවට සාක්ෂි විගණනයේදී නිරීක්ෂණය නොවිය.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ රු. 454,844 ක් වැය කර පුවත්පත් දැන්වීම් පල කර තනතුරු 05 ක් සඳහා අයදුම්පත් කැඳවා තිබුණු අතර විගණිත දිනය වූ 2018 ඔක්තෝබර් 12 දින වන විටත් තනතුරු 05 ක් සඳහා බඳවා ගැනීම් සිදු කර නොතිබුණි.

(ඉ) සහකාර කළමනාකරු ආයෝජන සහ අවදානම් තනතුරට නිලධාරියෙකු බඳවා ගැනීම සඳහා 2017 හා 2018 වර්ෂවලදී අවස්ථා 02 කදී එකතුව රු. 396,405 ක් වැය කර පුවත්පත් දැන්වීම් පලකර තිබූ නමුත් මෙම වාර්තාවේ දින වන විටත් සුදුසුකම් සහිත නිලධාරියෙකු ඉදිරිපත් නොවීම හේතුවෙන් බඳවා ගැනීම් සිදු කර නොතිබුණි.

(ඊ) මූල්‍ය අක්‍රමිකතාවයක් හේතුවෙන් අනුරාධපුර ශාඛාවේ කළමණාකරු 2018 අගෝස්තු 28 දින සිට වැඩ තහනම් කර තිබූ අතර ඊට අදාළ විමර්ශණ වාර්තාව වෙනුවෙන් රු. 47,280 ක් ගෙවීම් කර තිබුණි. කෙසේ වුවද, විගණිත දිනය වූ 2018 සැප්තැම්බර් 26 වන විටත් අවසන් විමර්ශණ වාර්තාව නිකුත් කිරීම හෝ ඉදිරි ක්‍රියාමාර්ග ගෙන තිබූ බව නිරීක්ෂණය නොවිය.

7. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

7.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදයට අනුව, මූල්‍ය වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2017 දෙසැම්බර් 07 දිනදීය.

7.2 අභ්‍යන්තර විගණනය

2017 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්මක් පිළියෙල කර තිබුණද ඊට අනුකූලව විගණන පරීක්ෂාවන් සිදු කර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

7.3 අයවැය ලේඛනමය පාලනය

මණ්ඩලයේ අයවැයගත ආදායම් හා වියදම්, තත්‍ය අගයන් හා සැසඳීමේදී සියයට 20 සිට සියයට 470 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

7.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාර, අරමුදලේ වාර්ෂික වාර්තාව ගිණුම් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවද 2016 වර්ෂික වාර්තාව 2018 ඔක්තෝම්බර් 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE

8. **පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| 01. මූල්‍ය පාලනය | (i) අවශ්‍යතාවය ඇස්තමේන්තුගත කර අත්තිකාරම් ලබා නොදීම. |
| | (ii) අත්තිකාරම් ලේඛන යාවත්කාලීන නොකිරීම. |
| | (iii) අරමුදලේ මූල්‍ය ගිණුම් මාර්ගෝපදේශයෙහි දැක්වෙන නියාමනයන්ට අනුව මුදල් තැන්පතු පත් හා ලදුපත් කාර්යාල - අධීක්ෂණ අංශය (Branch Supervision) වෙත ඉදිරිපත් නොවීම. |
| | (iv) වියදම් දැරූ පාර්ශවයන් විසින් නියමිත කාල සීමාව තුළදී ගනුදෙනුවලට අදාළ ගෙවීම් වවුචර්පත් හා අනෙකුත් සාක්ෂින් ගිණුම් අංශයට ඉදිරිපත් නොකිරීම. |
| | ණයගැති කාල විශ්ලේෂණය යාවත්කාලීන කර නොතිබීම හේතුවෙන් ණයගැති කාල විශ්ලේෂණය හා ප්‍රධාන ලෙජරය අතර රු.85,037,720 ක වෙනසක් හට ගෙන තිබුණි. |
| 02. ගිණුම්කරණය | (i) අරමුදල ගිණුම් කටයුතු සඳහා භාවිතා කරමින් පවතින ගිණුම්කරණ පද්ධතියේ දෝෂ පැවතීම. |
| | (ii) පසුගිය වර්ෂවල විගණන නිරීක්ෂණ අනුව, ආපදා ණය වාරික හා පොළිය නිලධාරීන්ගේ වැටුපෙන් නියමිත පරිදි අයකර ගත්තද, ලෙජර් ගිණුම් යාවත්කාලීන නොවීම. |
| | (iii) මූල්‍ය ප්‍රකාශන තුළ අංශ දෙකක තොරතුරු ඇතුළත් වන අතර එක් අංශයක් පරිගණකගත කිරීම හා අනෙක් අංශය හස්ත ක්‍රමයට ගිණුම් සකස් කිරීම. |
| 03. ස්වාභාවික ආපදා රක්ෂණාවරණය | ස්වාභාවික ආපදා රක්ෂනාවරණයට අදාළ වන්දි ගෙවීම් විධිමත්ව සිදු නොකළ අවස්ථා පැවතීම |
| 04. කළමනාකරණ තොරතුරු පද්ධතියේ අඩුපාඩු | අරමුදලේ මූල්‍ය ප්‍රකාශන කොටස් 02 කින් සමන්විත වූ අතර ඉන් එක් අංශයක ගිණුම් හා අදාල ලේඛන පරිගණකගත පද්ධතියක් හරහා පිළියෙල කර තිබුණද, අනෙක් අංශය යටතේ වූ ගිණුම් ඇතුළු ලේඛන හස්ත (Manual) ක්‍රමය මගින් පවත්වාගෙන ගොස් තිබුණි. මේ හේතුවෙන් ගිණුම් තැබීමේ අඩුපාඩු සිදුවී තිබූ බව විගණනයට නිරීක්ෂණය විය. |

ඩබ්ලිව්. පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත : ලේකම්, මුදල් අමාත්‍යාංශය

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| අස්පර්ශ්‍ය වත්කම් | 7 | 1,377,708 | 0 |
| දේපළ, පිරියත හා උපකරණ | 8 | 39,470,985 | 43,058,543 |
| මූල්‍ය වත්කම් | 9 | 8,161,427,792 | 11,187,844,373 |
| ලැබිය යුතු ප්‍රතිරක්ෂණ | 10.1 | 4,574,100,921 | 5,528,802,851 |
| ලැබිය යුතු වාරික | 10.2 | 2,109,164,970 | 1,340,840,446 |
| මෘදු ණය | 11 | 14,069,897 | 67,081,271 |
| වෙනත් මූල්‍ය නොවන වත්කම් | 12 | 1,922,337,050 | 159,891,434 |
| විලම්බිත කොමිස් | 13 | 597,083,610 | 482,908,910 |
| අතැති මුදල් හා බැංකුවේ ඇති මුදල | 14 | 1,133,642,497 | 705,205,727 |
| **මුළු වත්කම්** | | 18,552,675,429 | 19,515,633,556 |
| | | | |
| **ස්කන්ධ ප්‍රාග්ධනය හා වගකීම්** | | | |
| රඳවා ගත් ඉපැයුම් | | 7,213,150,131 | 7,831,705,609 |
| ස්කන්ධ ප්‍රාග්ධනයේ අනෙකුත් අංග | | (66,791,641) | (266,847,481) |
| **මුළු ස්කන්ධ ප්‍රාග්ධනය** | | 7,146,358,490 | 7,564,858,128 |
| | | | |
| **වගකීම්** | | | |
| රක්ෂණ ගිවිසුමේ වගකීම් | 17 | 8,879,856,741 | 9,795,236,509 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් | 18 | 29,660,364 | 15,090,870 |
| වෙනත් වගකීම් | 15 | 2,496,799,835 | 1,865,533,436 |
| බැංකු අයිරා | 14 | - | 274,914,611 |
| **මුළු වගකීම්** | | 11,406,316,939 | 11,950,775,427 |
| **මුළු ස්කන්ධ ප්‍රග්ධනය හා වගකීම්** | | 18,552,675,429 | 19,515,633,555 |

අරමුදලේ මූල්‍ය තත්ත්වය දැක්වෙන ප්‍රකාශය, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කරමි.

සහකාර සාමාන්‍යාධිකාරී / මූල්‍ය නිලධාරී

අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ

2018-මාර්තු-20

කොළඹදී

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

| දෙසැම්බර් 31න් අවසන් වර්ෂය | සටහන් | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|---|
| දළ වාරිකය | 1 | 9,071,278,467 | 6,844,785,577 |
| අග්‍රහාර සඳහා ලද දායක මුදල් | 1 | 2,726,522,599 | 2,004,436,602 |
| රැස්කළ වගා රක්ෂණ බදු | | 1,878,361,459 | 1,511,302,032 |
| ප්‍රතිරක්‍ෂණ වාරික අගය | | (1,146,635,715) | (760,552,873) |
| වැව.කැ.කෝ.සි.අ.ත්‍රක්‍රි. අරමුදලට පවරා ඇති | | (28,647,172) | (31,027,621) |
| **ශුද්ධ වාරිකය** | | 12,500,879,639 | 9,568,943,716 |
| නොඉපයූ වාරික සඳහා සංචිතයන්හි ශුද්ධ වෙනස | | (887,050,657) | (718,437,265) |
| **ශුද්ධ වාරික ඉපයුම්** | | 11,613,828,982 | 8,850,506,451 |
| **වෙනත් මෙහෙයුම් වලින් ලද ආදායම්** | | | |
| ගාස්තු සහ කොමිස් අදායම් | 2 | 6,350,874 | 4,704,803 |
| ආයෝජන සහ අනෙකුත් ආදායම් | 3 | 1,143,209,930 | 983,984,377 |
| **අනෙකුත් ආදායම්** | | 1,149,560,805 | 988,689,180 |
| දළ ප්‍රතිලාභ හා හිමිකම් ගෙවීම් | 4 | (11,455,239,706) | (5,761,417,865) |
| ප්‍රතිරක්ෂකයින් වෙත පැවරූ හිමිකම් | 4 | | 6,868,180,969 |
| ගිවිසුම් ගත වගකීම්වල දළ වෙනස | 4 | 2,077,748,294 | (6,355,570,386) |
| ප්‍රතිරක්‍ෂණ ගිවිසුම් ගත වගකීම්වල වෙනස | 4 | (239,679,294) | |
| දළ ෂර්හසෘ වෙනස | | (283,528,663) | (294,347,416) |
| **ශුද්ධ ප්‍රතිලාභ හා හිමිකම්** | | (9,900,699,368) | (5,543,154,699) |
| ප්‍රාරක්‍ෂණ සහ අත්පත්කර ගැනීමේ පිරිවැය (ප්‍රතිරක්‍ෂණ ඇතුළුව) | 5 | (1,440,826,507) | (1,068,320,881) |
| අනෙකුත් මෙහෙයුම් හා පරිපාලන වියදම් | 6 | (344,678,298) | (387,968,196) |
| **මුළු ප්‍රතිලාභ, හිමිකම් හා අනෙකුත් වියදම්** | | (11,686,204,174) | (6,999,443,776) |
| **බදු පෙර ලාභය /(අලාභය)** | | 1,077,185,612 | 2,839,751,855 |
| ආදායම් බදු වියදම | | (100,951,677) | - |
| වර්ෂයේ ලාභය/(අලාභය) | | 976,233,935 | 2,839,751,855 |
| **අනෙකුත් විස්තීර්ණ ආදායම්** | | | |
| අලෙවිය සඳහා ඇති මූල්‍ය වත්කම් වල ශුද්ධ වෙනස | | 208,755,171 | (182,717,265) |
| පාරිතෝෂික තක්සේරුව මත ආයුගණක ඉපයීම් | | (8,699,331) | 4,740,893 |
| **වසර සඳහා අනෙකුත් විස්තීර්ණ වියදම්, බදු වලට පසු** | | | (177,976,372) |
| **මුළු විස්තීර්ණ ආදායම** | | 1,176,289,775 | 2,661,775,484 |

# ස්කන්ධ ප්‍රාග්ධනයේ සිදුවූ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

| | රඳවාගත් ඉපැයුම් රු. | විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් රු. | මුළු ස්කන්ධ ප්‍රාග්ධනය රු. |
|---|---|---|---|
| **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 7,550,219,714 | 172,815,232 | 7,723,034,946 |
| වර්ෂයේ ලාභය | 4,303,897,565 | - | 4,303,897,565 |
| විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම්වල ශුද්ධ වෙනස | | (261,686,342) | (261,686,342) |
| බැඳුම්කර සඳහා ක්‍රමක්ෂය වට්ටම් | 50,321,582 | | 50,321,582 |
| ප්‍රතිරක්ෂණ ඉන්වොයිසි සහ ණය සටහන් අවලංගු කිරීම | (92,421,039) | | (92,421,039) |
| වාර්ෂික ගාස්තු සහ සෙස් බදු | (24,370,817) | | (24,370,817) |
| ප්‍රතිරක්ෂණය නිවැරදි කිරීම | (60,170,679) | | (60,170,679) |
| මෝටර් වාහන නොවන වාරික කපා හැරීම | (1,995,673) | | (1,995,673) |
| ක්‍ෂය නිවැරදි කිරීම් | (583,958) | | (583,958) |
| මෝටර් වාහන වාරික නිවැරදි කිරීම | 4,668,666 | | 4,668,666 |
| වාරික නැවත ලබාදීමේ ගැලපුම් | 2,574,100 | | 2,574,100 |
| දේ.පි.උ. සමුච්චිත ක්‍ෂය ගැලපුම් | 11,643,799 | | 11,643,799 |
| වියදම් හා වෙනත් පියවීම් ප්‍රතිපූර්ණය | 599,610 | | 599,610 |
| ඒකාබද්ධ අරමුදලට මාරුකල මුදල් | (3,000,000,000) | | (3,000,000,000) |
| **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 8,744,382,870 | (88,871,109) | 8,655,511,761 |
| | | | |
| වර්ෂයේ ලාභය | 2,839,751,855 | | 2,839,751,855 |
| විකිණීමට ඇති මූල්‍ය ආයෝජනවල ශුද්ධ වෙනස | | (182,717,265) | (182,717,265) |
| ආයුගණක මත තක්සේරුකළ පාරිතෝෂික | | 4,740,893 | 4,740,893 |
| කපා හරින ලද ප්‍රතිරක්‍ෂණ ලදුපත | (34,714,833) | | (34,714,833) |
| ඒකාබද්ධ අරමුදලට මාරු කළ මුදල | (3,200,000,000) | | (3,200,000,000) |
| 2015/16 සඳහා ගෙවිය යුතු ආදායම් බදු | (578,674,926) | | (578,674,926) |
| ඇපකර වට්ටම් ක්‍රමක්ෂය | 47,663,316 | | 47,663,316 |
| ක්‍ෂය ගැලපීම් | 2,614,431 | | 2,614,431 |
| වාරික ආපසු ගෙවීම් ගැලපුම් | 7,306,615 | | 7,306,615 |
| ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවුම් ආදායම් මෝටර් වාහන නොවන | 22,500 | | 22,500 |
| මෝටර් වාහන රක්‍ෂණ වාරික | (75,000) | | (75,000) |
| කපා හළ තැන්පතු ගෙවීම් | (392,000) | | (392,000) |
| ප්‍රතිරක්‍ෂණ වාරික ගැලපීම් | 3,869,230 | | 3,869,230 |
| බදුකුලී පිරිවැය | (48,450) | | (48,450) |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 7,831,705,609 | (266,847,481) | 7,564,858,128 |

| 2017 දෙසැම්බර් 31 දිනට | රඳවාගත් ඉපැයුම් රු. | විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් රු. | මුළු ස්කන්ධ ප්‍රාග්ධනය රු. |
|---|---|---|---|
| වර්ෂයේ ලාභය | 976,233,935 | | 976,233,935 |
| විකිණීමට ඇති මූල්‍ය ආයෝජනවල ශුද්ධ වෙනස | | 208,755,171 | 208,755,171 |
| ඒකාබද්ධ අරමුදලට මාරු කළ මුදල | (1,500,000,000) | | (1,500,000,000) |
| වසර අවසාන සංවෘත වෙනස | (44,253,311) | | (44,253,311) |
| 2016/17 සඳහා ගෙවිය යුතු ආදායම් බදු | (97,669,225) | | (97,669,225) |
| ඇපකර වට්ටම් ක්‍රමක්ෂය | 26,235,147 | | 26,235,147 |
| AAIB ආපසු ගෙවීම් | 42,871,673 | | 42,871,673 |
| 2016 දිරි දීමනා | (3,140,650) | | (3,140,650) |
| RI සාමාන්‍ය වාරික | (2,921,713) | | (2,921,713) |
| AR පාලක සෘෂ - ආරම්භක | (38,856,406) | | (38,856,406) |
| AR පාලක මෝටර් නොවන - ආරම්භක | 83,109,718 | | 83,109,718 |
| අගුරු චෙක්පත් | (324,575) | | (324,575) |
| සේවක භාර අරමුදල 3% | 305,147 | | 305,147 |
| මෝටර් බයිසිකල් අත්තිකාරම් සහ ලැබිය යුතු මෝටර් රථ | (57,582,588) | | (57,582,588) |
| ආර්ථික සේවා ගාස්තු (ESC) | (2,068,743) | | (2,068,743) |
| වෙනත් පෙර වර්ෂ ගැලපුම් | (493,887) | | (493,887) |
| පාරිතෝෂික තක්සේරුව මත ක්‍රියාකාරී (වාසි) / අලාභය | | (8,699,331) | (8,699,331) |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **7,213,150,131** | **(66,791,641)** | **7,146,358,490** |

පිටු 88 සිට 115 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

වරහන් තුළ ඇති සංඛ්‍යා මඟින් අඩු කිරීම් පෙන්නුම් කරයි.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා | | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් කටයුතු මඟින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | | |
| **බදු පෙර ලාභය** | | 1,077,185,612 | 2,839,751,855 |
| **ගැලපීම්** : | | | |
| පොලී ආදායම | | (1,138,264,819) | (967,301,878) |
| ක්ෂය කිරීම් | | 7,316,750 | 7,056,814 |
| ශුද්ධ සාධාරණ වටිනාකම් වෙනස්වීම් | | 200,055,840 | (177,976,372) |
| පෙර වර්ෂයට අදාළ ගැලපීම් | | (94,789,413) | (555,043,548) |
| ස්ථාවර වත්කම් බැහැරකිරීමේ ලාභ/ (අලාභ) | | (4,945,111) | - |
| | | 46,558,859 | 1,146,486,872 |
| මෙහෙයුම් වත්කම්වල වෙනස් වීම් | A | (1,690,242,910) | (5,998,105,224) |
| මෙහෙයුම් වගකීම් වල වෙනස් වීම් | B | (370,495,553) | 8,098,135,583 |
| මෙහෙයුම් කටයුතු මඟින් ජනිත වූ මූල්‍ය ප්‍රවාහ | | (2,014,179,604) | 3,246,517,230 |
| ගෙවූ පාර්තෝෂික | | - | (229,889) |
| මෙහෙයුම් කටයුතු මඟින් ජනිත වූ ශුද්ධ මුදල් | | (2,014,179,604) | 3,246,287,341 |
| **ආයෝජන කටයුතු මඟින් ජනිත වූ මූල්‍ය ප්‍රවාහ** | | | |
| මූල්‍ය ආයෝජනවල ශුද්ධ ප්‍රතිග්‍රහණ | | 3,026,416,582 | (798,871,647) |
| ලද පොලී | | 1,138,264,819 | 967,301,878 |
| මෘදු ණය ආපසු අයකරගැනීම් | | 53,011,374 | 62,163,340 |
| දේපළ, පිරියත, හා උපකරණ බැහැර කිරීම | | 6,029,880 | - |
| දේපළ, පිරියත, හා උපකරණ ප්‍රතිග්‍රහණය | | (1,377,708) | - |
| ආයෝජන කටයුතු සඳහා යෙදවූ ශුද්ධ මුදල | | (4,813,960) | (13,375,128) |
| මූල්‍යකරණ කටයුතු මඟින් ජනිත වූ මූල්‍ය ප්‍රවාහ | | 4,217,530,986 | 217,218,443 |
| **මූල්‍යකරණ කටයුතු මඟින් ජනිත වූ මූල්‍ය ප්‍රවාහ** | | | |
| ඒකාබද්ධ අරමුදලට මාරුකළ මුදල | | (1,500,000,000) | (3,200,000,000) |
| මූල්‍යකරණ කටයුතු සඳහා යෙදවූ ශුද්ධ මුදල් | | (1,500,000,000) | (3,200,000,000) |
| **මුදල් සහ මුදල් හා සමාන වත්කම්වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | C | 703,351,381 | 263,505,784 |
| වර්ෂය මුල පැවති මුදල් සහ මුදල් හා සමාන වත්කම්වල ශුද්ධ අගය | | 430,291,116 | 166,785,332 |
| වර්ෂය අවසානයේ පැවති මුදල් සහ මුදල් හා සමාන වත්කම්වල අගය | | 1,133,642,497 | 430,291,116 |

| දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා | 2017 රු. | 2016 රු. |
|---|---|---|
| **මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය පිළිබඳ සටහන්** | | |
| අ. මෙහෙයුම් වත්කම්වල වෙනස් වීම | | |
| විලම්බිත කොමිස් (වැඩිවීම)/අඩුවීම | (114,174,700) | (61,775,957) |
| අයවිය යුතු ප්‍රතිරක්ෂණ වාරික (වැඩිවීම)/අඩුවීම | 954,701,929 | (5,528,802,851) |
| අයවිය යුතු රක්ෂණ වාරික (වැඩිවීම)/අඩුවීම | (768,324,524) | (279,942,420) |
| වෙනත් මූල්‍ය නොවන වත්කම්වල (වැඩිවීම)/අඩුවීම | (1,762,445,615) | (127,583,996) |
| | (1,690,242,910) | (5,998,105,224) |
| **ආ. මෙහෙයුම් වගකීම්වල වෙනස් වීම** | | |
| රක්ෂණ ගිවිසුම්ගත වගකීම් (වැඩිවීම)/අඩුවීම | (915,379,769) | 6,537,322,393 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් (වැඩිවීම)/අඩුවීම | 14,569,494 | (1,137,249) |
| වෙනත් වගකීම්වල (වැඩිවීම)/අඩුවීම | 530,314,722 | 1,561,950,438 |
| | (370,495,553) | 8,098,135,583 |
| **ඇ. මුදල් සහ මුදල් හා සමාන වත්කම්වල වැඩිවීම/(අඩුවීම)** | | |
| වර්ෂය අවසානයේ පැවති මුදල් සහ මුදල් හා සමාන වත්කම්වල ශුද්ධ අගය | 1,133,642,497 | 430,291,116 |
| අඩුකළ: වර්ෂය මුල පැවති මුදල් සහ මුදල් හා සමාන වත්කම්වල ශුද්ධ අගය | 430,291,116 | 166,785,332 |
| මුදල් සහ මුදල් හා සමාන වත්කම්වල ශුද්ධ (වැඩිවීම)/අඩුවීම | 703,351,381 | 263,505,784 |

# මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

## 1.0 ආයතනික තොරතුරු

### 1.1 වාර්තා කරනු ලබන ආයතනය

2007 අංක 28 දරන සංශෝධන පනතින් සංශෝධිත ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය (මණ්ඩලය) 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනත මගින් ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත කර ඇත. ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තේ අංක 97, මරදාන පාර, කොළඹ 10 වන අතර ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ද එම ලිපිනයෙහිම පිහිටා ඇත.

### 1.2 මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට බලය ලබාදීමේ දිනය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2017 ඔක්තෝබර් මස 31 දින මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය ලබා දී ඇත.

### 1.3 මව් සමාගම සහ පරම මව් සමාගම

අධ්‍යක්ෂ මණ්ඩලයේ මව් සමාගම සහ පරම මව් සමාගම වන්නේ ශ්‍රී ලංකා රජයයි.

### 1.4 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් කටයුතුවල ස්වරූපය

මෙම මණ්ඩලයේ මූලික ක්‍රියාකාරකම් වනුයේ සාමාන්‍ය රක්ෂණ කටයුතු සහ ප්‍රතිරක්ෂණ කටයුතු ඉටු කිරීම වේ. සමාලෝචිත කාලය තුළ මෙම ප්‍රධාන ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල සැලකිය යුතු වෙනස්කම් සිදු වී නොමැත.

### 1.5 මූල්‍ය ප්‍රකාශන සඳහා වන වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමකි.

### 1.6 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශය

අන්‍යාකාරයෙන් දක්වා ඇති අවස්ථාවන්හි දී හැර අන් සෑම විටම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් සකස් කර ප්‍රකාශයට පත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි ආයතනයෙහි මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

මූල්‍ය ප්‍රකාශනවලට පහත සඳහන් අයිතමයන් ඇතුළත් වේ:

- වර්ෂ අවසානයේදී මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය පැහැදිලි කෙරෙන තොරතුරු ඇතුළත් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයක් (පිටු අංක 82 බලන්න)
- සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලයේ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ තොරතුරු නිරූපනය කරන ලාභ හෝ අලාභ සහ වෙනත් මෙහෙයුම් ආදායම් ඇතුළත් ප්‍රකාශයන් (පිටු අංක 83 බලන්න)
- ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්කම් නිරූපනය වන පරිදි ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශයක් (පිටු අංක 84-85 බලන්න)
- මණ්ඩලයට මුදල් සහ මුදල් හා සමාන වත්කම් උත්පාදනය කිරීමටත්, එවැනි මූල්‍ය ප්‍රවාහ උපයෝජනයටත් මණ්ඩලය සතු හැකියාව පිළිබඳ තොරතුරු පරිශීලකයන් වෙත ලබාදෙනු ලබන මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයක් (පිටු අංක 86-87 බලන්න) සහ
- ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ වෙනත් මූල්‍ය සහ මූල්‍ය නොවන තොරතුරු පැහැදිලි කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්. (පිටු අංක 88 සිට 115 දක්වා බලන්න)

### 1.7 සේවක සංඛ්‍යාව

2017 දෙසැම්බර් 31 දිනට ආයතනයේ කාර්ය මණ්ඩල සංඛ්‍යාව 211 කි (2016-206).

## 2.0 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ත

**ගිණුම්කරණ ප්‍රතිපත්ති වල වෙනස්වීම්**

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී මෙහි අන්‍යාකාරයකින් සඳහන්කර ඇත්තම් මිස, පහතින් දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කිරීමකින් තොරව අඛණ්ඩව යොදා ගනිමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.

### 2.1 පිළියෙල කිරීමේ පදනම

#### *2.1.1 අගය කිරීමේ පදනම*

මූල්‍ය ප්‍රකාශන උපචිත පදනමින් සකස් කර ඇති අතර විකිණීමට ඇති මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකම පදනම්ව අගය කිරීම හැරුණු විට අනෙකුත් වත්කම් ඓතිහාසික පිරිවැය මත පදනම්ව අගය කර ඇත.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේ ප්‍රමිති අංක 4 මගින් අවසර දී ඇති පරිදි එම ප්‍රමිතිය පිළිගැනීමට පෙර පැවති ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව රක්ෂණ ගිවිසුම් සඳහා වන ගිණුම් ප්‍රමිති පිළිපදිමින් මණ්ඩලය මගින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.

මණ්ඩලය මගින් වඩා පුළුල් ලෙස ද්‍රවශීලතාව පදනම්ව මූල්‍ය තත්ත්වය දැක්වෙන ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කර ඇති අතර මූල්‍ය ප්‍රකාශන සඳහා උද්ධමනය මගින් ඇති කරන බලපෑම සඳහා ගැලපීම් සිදු කර නොමැත. මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් එකිනෙක හිලව් කිරීම් කර ඇති අතර මූල්‍ය තත්ත්වය දැක්වෙන ප්‍රකාශන තුළ ශුද්ධ වටිනාකම පමණක් නිරූපනය කරයි. නෛතිකව ක්‍රියාත්මක කිරීමට හැකියාව ඇති බවට තොරතුරු ඇති විටෙක දී හැර වටිනාකම් හඳුනා ගෙන හිලව් කිරීමට අවස්ථාව ඇති විටෙක පමණක් මූල්‍ය වත්කම් සහ වගකීම් හිලව් කිරීම් කර ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.

#### 2.1.2 ව්‍යවහාර මුදල් සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකක

මෙහි දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර සියලුම මූල්‍ය තොරතුරු අන්‍යාකාරයෙන් දක්වා ඇත්නම් මිස, ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්න රුපියලට ගණනය කර ඉදිරිපත් කර ඇත.

#### 2.1.3 ප්‍රමාණාත්මකභාවය හා සමාහරණය

සෑම කුඩා අයිතමයක්ම ප්‍රමාණාත්මකභාවය පිළිබඳ අවධානය යොමු කර ඛාණ්ඩගත කර වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කර ඇත. ප්‍රමාණාත්මක නොවන

අවස්ථාවල දී හැර එවැනි සමානතාවයක් නොමැති අයිතමයන් වෙන් වෙන් වශයෙන් සලකා වාර්තා ගත කර ඇත.

## 2.2 වාර්තා ගත කරනු ලබන කාලය

වාර්තා ගත කරනු ලබන කාලය 2016 ජනවාරි සිට දෙසැම්බර් දක්වා වේ.

අවශ්‍ය අවස්ථාවලදී අවස්ථානෝචිත පරිදි අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පහත පැහැදිලි කර ඇත.

## 2.3 වැදගත් ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී කළමනාකාරීත්වය මගින් විනිශ්චයන්, ඇස්තමේන්තු කිරීම් සහ උපකල්පනයන් කළ යුතු වන අතර ඒවා ගිණුම්කරණ ප්‍රතිපත්තීන් යොදා ගැනීම් සහ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් වටිනාකම් හඳුනා ගැනීමට ද බලපෑමක් ඇති කරයි. සත්‍ය තත්ත්වයන් මෙම ඇස්තමේන්තු ගත වටිනාකම් සමඟ වෙනස්වීමට ද හැකියාව ඇත.

ඇස්තමේන්තු සහ පදනම් කරගත් උපකල්පනයන් ඓතිහාසික පිරිවැය මත සහ වෙනත් සාධක මත පදනම් වන අතර ඒවා පවත්නා වෙනත් සාධක සහ තොරතුරු මත පදනම්ව පවතින වත්කම් සහ වගකීම්වල ඉදිරියට ගෙන එනු ලබන වටිනාකම තක්සේරුවට භාජනය කර ඇත.

ඇස්තමේන්තු සහ පදනම් කරගත් උපකල්පනයන් අඛණ්ඩ පදනමින් සමාලෝචනයට භාජනය කරනු ලබන අතර ඒ අනුව ගිණුම්කරණ ඇස්තමේන්තු වලට කරනු ලබන සංශෝධනයන් හඳුනාගනු ලබන්නේ එම ඇස්තමේන්තු සංශෝධනයන් සිදු වූවහොත් සහ එය අනාගත කාලයට බලපෑමක් ඇති කරන්නේ නම් පමණි.

ගිණුම්කරණ ප්‍රතිපත්තීන් යොදා ගැනීමේ දී කරනු ලබන තීරණාත්මක විනිශ්චයන් පිළිබඳ තොරතුරු සහ ඒවා සැලකිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වටිනාකම් තුළට බලපෑමක් ඇති කර ඇස්තමේන්තු කිරීම් පහත පරිදි සටහන් මගින් ඉදිරිපත් කර ඇත.

### *2.3.1 රක්ෂණ ගිවිසුම්වල වගකීම් තක්සේරුව*

සාමාන්‍ය රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ ගිවිසුම්වලට අදාළව වාර්තා කරනු ලබන දිනට ඉදිරිපත් විය හැකියයි අපේක්ෂිත හිමිකම් පිරිවැය අත්‍යන්ත වටිනාකමට ඇස්තමේන්තු කර ඇති අතර එම ඉදිරිපත් වන හානි පූර්ණ අයදුම්පත්වල ගෙවීමට සිදුවන අත්‍යන්ත වටිනාකම නිශ්චිතව හඳුනා ගැනීමට සැලකියයුතු කාලයක් ගත විය හැක.

විශාල වටිනාකමින් යුතු හානි පූර්ණයන් වෙන් වශයෙන්ම ගෙන සලකා බලා අලාභයන් හි මුහුණත වටිනාකම යළි තක්සේරු කිරීම හෝ සංශෝධනය කිරීම හෝ අනාගත තත්ත්වයන් නිරූපනය වන පරිදි බොහෝ අවස්ථාවල දී අගය කිරීම් කරනු ලැබුව ද උද්ධමනය හෝ අලාභ ලැබීමේ සම්භාවිතාව පදනම්ව පෙර වර්ෂවල හානි ප්‍රතිපූර්ණයන් වල වර්තමාන වටිනාකම තක්සේරුවට භාජනය කරනු ලබයි.

උපයා නොමැති වාරික වටිනාකම තක්සේරු කිරීමේ දී ද මේ හා සමාන විනිශ්චයන් ඇස්තමේන්තු කිරීම් සහ උපකල්පනයන් යොදා ගෙන ඇත. කාල අනුපාතනය හැර වෙනත් පදනමක් මත ගිවිසුමක් මගින් සපයනු ලබන රක්ෂණ සේවයේ රටාවට අනාවරණය නොවූ වාරික ක්‍රමක්ෂය කිරීම අවශ්‍යද යන්න තීරණය කිරීම අවශ්‍ය වේ.

### *2.3.2 විලම්බිත ප්‍රතිග්‍රහණ පිරිවැයෙහි හානිකරණය*

සෑම වාර්තා කරන දිනකම විලම්බිත ප්‍රතිග්‍රහණ පිරිවැය පිළිබඳ අගය අඩු වී ඇතිදැයි සමාලෝචනයක් සිදු කරයි. ඉදිරියට ගෙන ආ වටිනාකමට වඩා අයකරගත හැකි මුදල අඩුනම් එය විස්තීර්ණ අදායම් ප්‍රකාශයෙහි හානිකරණ අලාභයක් ලෙස හඳුනා ගනී. සමාලෝචිත වර්ෂය තළ එවැනි අගය අඩුවීමක් දක්නට නොතිබිනි. අදාළ කොන්ත්‍රාත් හිලව් කර හෝ අවලංගු කර ඇතිවිට ප්‍රතිග්‍රහණ පිරිවැය ඉවත් කරනු ලබයි.

### *2.3.3 හානිකරණය පිළිබඳ තක්සේරු කිරීම*

සෑම වාර්තා කරනු ලබන දිනකටම මණ්ඩලය මගින් කිසියම් වත්කමකට හෝ මුදල් උත්පාදන ඒකකයක හානිකරණයට (අගය අඩුවීමකට) බලපාන සාධක ඇති බවට හඳුනාගැනීමක් හෝ තත්ත්වය වර්ධනය වීමක් තිබේ නම් ඒ පිළිබඳ තක්සේරුවක් කරනු ලබයි. මේ සඳහා අදාළ වත්කමහෙි හෝ මුදල් උපයන ඒකකයෙහි වටිනාකම පිළිබඳ තක්සේරුවක් කළ යුතු වේ. මෙම තක්සේරු කිරීම් සඳහා කළමනාකාරීත්වය මගින් එම වත්කම්වල හෝ මුදල් උත්පාදන ඒකකවල අනාගත මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කිරීමක් සහ ඒවායෙහි වර්තමාන වටිනාකම සොයා ගැනීම සඳහා සුදුසු වට්ටම් ප්‍රතිශතයක් තෝරා ගැනීම ද කළ යුතු වේ. මෙම අගයකිරීම් (valuation) සඳහා මණ්ඩලය මගින් අනාගත මුදල් ප්‍රවාහ සහ වට්ටම් අනුපාත පිළිබඳ ඇස්තමේන්තු කිරීමක් කළ යුතු වේ. ඒ සඳහා ඔවුන් අවිනිශ්චිතතාවන්ට ද මුහුණ දෙනු ඇත.

### *2.3.4 වගකීම් සහ අවදානම් සඳහා ප්‍රතිපාදන*

සාමාන්‍ය ව්‍යාපාරික පරිසරය තුළ මණ්ඩලයට නීත්‍යානුකූල හානි ප්‍රතිපූර්ණයන් ඉදිරිපත් කෙරෙයි. කළමනාකාරීත්වය මගින් එම ප්‍රතිපූර්ණයන් සඳහා ඉදිරිපත් වීමට ඇති සම්භාවිතාව පදනම්ව ඒ සඳහා වෙන් කිරීම් කරනු ලබයි. මෙහි දී නෛතික හානි පූර්ණයක් හිමි වීම සඳහා වන කාලය අවිනිශ්චිත වන අතර ඒ නිසා ද ආර්ථික ප්‍රතිලාභයන් ඇති කරයි. නියමිත නෛතික තීරණයන් ලැබීමට ගත වන කාලය සහ ඊට දරණ පිරිවැය අවසාන වශයෙන් රඳා පවතිනුයේ ඒ සඳහා ගත වන කාලය මත ය.

සමාලෝචිත වර්ෂය තුළ, නඩු කාර්ය ප්‍රතිපාදන වශයෙන් සමස්ත නෛතික හිමිකම් වලින් 15%ක් වෙන් කිරීමට මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

# මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

### 2.3.5 විලම්භිත බදු වත්කම් සහ වගකීම්

සංකීර්ණ බදු රෙගුලාසි අර්ථ නිරූපණය කිරීම සහ අනාගත බදු අය කළ හැකි ආදායමේ ප්‍රමාණය හා කාලය සම්බන්ධයෙන් අවිනිශ්චිතතාවයන් පවතී. බදු අරමුණු සඳහා සුදුසුකම් ලත් ගෙවීම් ලෙස සලකනු ලබන ඒකාබද්ධ අරමුදලට සැලකිය යුතු දායකත්වයක් ලබා දීම නිසා අපේක්ෂා කළ හැකි අනාගතයේදී බදු අය කළ හැකි ලාභයක් ලබා ගැනීමට අපහසු බව කළමනාකාරිත්වය ඇස්තමේන්තු කරයි, එබැවින් විලම්බිත බදු සඳහා ප්‍රතිපාදන ලබා නොදේ.

### 2.3.6 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් තක්සේරු කිරීම - පාරිතෝෂිකය

නිශ්චිත ප්‍රතිලාභ ඔප්පු සම්බන්ධයෙන් ආදායම් ප්‍රකාශයේ දක්වා ඇති වගකීම වන්නේ වාර්තා කරන දිනට පවත්නා නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ වත්මන් වටිනාකමයි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 - කාර්ය මණ්ඩල ප්‍රතිලාභ - ප්‍රමිතියට අනුව වාර්තා කරන දිනට පවතින නිශ්චිත ප්‍රතිලාභ වගකීම සුදුසුකම්ලත් ආයුගණක තක්සේරුකරුවෙකු විසින් ප්‍රක්ෂේපිත ඒකක හර ක්‍රමවේදය (PUC) යොදාගනිමින් ගණනය කරනු ලැබේ.

ආයුගණක තක්සේරුව සඳහා වට්ටම් අනුපාතය, වැටුප් වර්ධක අනුපාතය හා සේවය කිරීමට ඉතිරිව ඇති කාලය ආදිය පිළිබඳව උපකල්පන සිදුකිරීම අවශ්‍ය වේ.

ශුද්ධ නිශ්චිත ප්‍රතිලාභ වගකීම ප්‍රති-ගණනය කිරීමේදී එම වගකීම සමන්විත වන ආයුගණක ලාභ හෝ අලාභ වහාම වෙනත් විස්තීරණ ආදායම් වල ඇතුළත් කරනු ලැබේ.

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ සේවකයෙකු අඛණ්ඩ වසර පහක සේවා කාලයක් සම්පූර්ණ කළ විට පාරිතෝෂික ලැබීමට හිමිකම් ලබයි. එහෙත් එසේ පාරිතෝෂික ගෙවීම සඳහා පිටතින් ප්‍රතිපාදන හිමි නොවේ.

මූල්‍ය තත්ත්වය පිළිබඳ සටහන් 18හි දක්වා ඇත.

### 2.3.7 නාමික බදු බැර (රඳවා ගැනීමේ බදු)

මණ්ඩලය මගින් අනාගත බදු අය කළ හැකි ආදයම තක්සේරු කරනු ලබන අතර ඊට එරෙහිව ගෙවන ලද නාමික බදු බැර හිලව් කිරීම් සඳහා හිමිකම් ඇත. මෙහි දී මණ්ඩලය මගින් ගෙවන ලද නාමික බදු ලාභ අලාභ ගිණුමට සටහන් කරනු ලබන අතර එම නාමික බදු මුදල නුදුරු අනාගතය තුළ මණ්ඩලයට හිලව් කර ගැනීමක් අපේක්ෂා කළ නොහැකි. කෙසේ වෙතත් අනාගතයේ දි මණ්ඩලයට බදු අය වන ආදායම් ඉපයීමකදී එය ආපසු ලබා ගෙන එලෙස ලියා හැර ඇති නාමික බදු ප්‍රයෝජනයට ගත හැකි වනු ඇත.

### 2.3.8 අඛණ්ඩ පැවැත්ම

මණ්ඩලයෙහි කළමනාකාරීත්වය මගින් ඇගයීමට ලක් කළ පරිදි මණ්ඩලයට අඛණ්ඩ පැවැත්මකින් යුතුව ව්‍යාපාරික කටයුතු නුදුරු අනාගතයක් දක්වා කර ගෙන යාහැකි අතර එයට එම අවශ්‍යතා සඳහා සියලු සම්පත් ඇති බව ද නිරීක්ෂණය කර ඇත. ප්‍රවර්ධන ව්‍යාපාරයක් ලෙස ඉදිරියටත් පවත්වාගෙන යෑමේ මණ්ඩලයේ හැකියාව පිළිබඳ සැලකිය යුතු සැකයක් ඇතිකරන ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයන් පිළිබඳව මණ්ඩලයට දැනගැනිමට ලැබී නැත. ඒ හේතුවෙන් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සංකල්පය පදනම්ව මූල්‍ය වාර්තා පිළියෙල කර ඉදිරිපත් කර ඇත.

සැලකිය යුතු අවිනිශ්චිතතාවයෙන් යුතු ඇස්තමේන්තු කිරීමේ ප්‍රමාණාත්මක විනිශ්චයන් යොදා ගනිමින් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් භාවිතයට ගැනීමේ දී ඒ පිළිබඳ තොරතුරු ගිණුම් වාර්තා සමග ඉදිරිපත් කර ඇති වටිනාකම්වල ඇතුළත් වන අතර ඊට අදාළ තොරතුරු මේ සමඟ ඉදිරිපත් කර ඇත.

## 2.4 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

### 2.4.1 අස්පර්ශ්‍ය වත්කම්

වෙන් වෙන් වශයෙන් අත්පත් කරගෙන ඇති අස්පර්ශ්‍ය වත්කම් අගය කිරීම ආරම්භක පිරිවැය පදනම්ව කර ඇති අතර පහත මූලිකවම හඳුනාගත් අස්පර්ශ්‍ය වත්කම් ඉදිරියට ගෙනවිත් ඇත්තේ පිරිවැයෙන් ඉදිරියට ගෙන ආ ලියාහැරීමේ වටිනාකමට අඩු කිරීමෙන් අනතුරුව වන අතර මෙම අස්පර්ශ්‍ය වත්කම් ඒවායෙහි ප්‍රයෝජනවත් ජීවිත කාලය තුළ අගය අඩුවීමක දී ඒවා එම ජීවිත කාලය තුළ ලියා හරිනු ලබයි.

අඩුම තරමින් සෑම වාර්තා කරනු ලබන අවස්ථාවක දීම ලියා හැරීමේ වර්ෂ ගණන සහ ක්‍රමය පිළිබඳ ඇගයීමකට ලක් කරනු ලබන අතර අපේක්ෂිත ප්‍රයෝජනවත් ජීව කාලය හෝ බලාපොරොත්තු වන පාරිභෝජන රටාව පදනම්ව එම වත්කම්වල ලියා හරිනු ලබන වටිනාකම තීරණය කරනු ලබන අතර එය සුදුසු පරිදි එම ඇස්තමේන්තුවල වෙනස්වීම් ලෙසට ගෙන ගිණුම් ගැලපීම් සිදු කර ඇත. මෙම අස්පර්ශ්‍ය වත්කම්වල ලියා හැරීමේ වියදමක් ලෙස ආදායම් ප්‍රකාශනවල එම වත්කම් යොදා ගනු ලබන මෙහෙයුම් කාණ්ඩය යටතේ දක්වා ඇත.

අස්පර්ශ්‍ය වත්කමක් ඉවත් කරනු ලබන විට එම වත්කම ඉවත් කිරීම මඟින් ජනිත වන ලාභය හෝ පාඩුව වශයෙන් ගණනය කරනු ලබන්නේ අදාළ වත්කමේ පොත්වල අගය සහ ශුද්ධ බැහැරකිරීමේ ප්‍රතිෂ්ඨාව අතර ඇති වෙනස වන අතර එය ආදායම් ප්‍රකාශයේ සටහන් කරනු ලැබේ.

මණ්ඩලය විසින් ලබාගත් පරිගණක මෘදුකාංග ඒවායේ පිරිවැයෙන් උපචිත ක්‍රමක්ෂය සහ උපචිත හානිකරණ පාඩුව අඩුකිරීමෙන් ලැබෙන අගය මත පොත්වල සටහන් කර ඇත. පරිගණක මෘදුකාංග ක්‍රමක්ෂය වසර 04ක් පුරා සිදු කරනු ලබයි.

### *2.4.2 දේපළ, පිරියත හා උපකරණ*

දේපළ, පිරියත සහ උපකරණ සියල්ල ස්පර්ශ්‍ය වත්කම් වේ. ඒවා වර්ෂ එකකට වැඩි කාලයක් ප්‍රයෝජනයට ගැනීමට අදහස් කරනු ලබයි.

පිරියත, යන්ත්‍ර සහ උපකරණ වාර්තා ගත කර ඇත්තේ ඒවා මිලට ගැනීමට දරණ ලද පිරිවැයට එම වත්කමින් අපේක්ෂිත ප්‍රතිලාභ ලැබීමට සුදුසු බවට පත් කිරීමට දරනු ලබන අනෙකුත් වියදම් ද එකතු කරන ලද පිරිවැයට ය.

2.4.3 ක්ෂය කිරීම්

මණ්ඩලය ස්ථාවර වත්කම් සඳහා ක්ෂය කිරීම් පරිහරණයට මිලට ගත් මාසයේ සිට ආරම්භ කර එම වත්කම ඉවත් කරන මාසය තෙක් විය ගණනය කිරීම කරනු ලබයි. ක්ෂය වෙන් කිරීම කරනු ලබන්නේ සරල මාර්ග ක්‍රමය පදනම්ව වන අතර එම පිරිවැය අපේක්ෂිත ප්‍රයෝජනවත් ජීව කාලය පුරා පහත පරිදි ලියා හැරීම කරනු ලබයි:

| | |
|---|---|
| යන්ත්‍ර සූත්‍ර | වසර 10 ක් සඳහා |
| ලී බඩු සහ සවි කිරීම් | වසර 13.33 ක් සඳහා |
| කාර්යාල උපකරණ | වසර 13.33 ක් සඳහා |
| මෝටර් රථ වාහන | වසර 10 ක් සඳහා |

සෑම වාර්තා කරනු ලබන දිනකදීම වත්කම්වල ලියාහරින ලද වටිනාකම ප්‍රයෝජනවත් ජීව කාලය, ක්ෂය කිරීමේ ක්‍රමවේදය සමාලෝචනයට ලක් කර සුදුසු පරිදි අවශ්‍ය සංශෝධන සිදු කරනු ලබයි.

**මුළුමනින්ම ක්ෂයකර අවසන්වූ නමුත් භාවිතයට යොදාගන්නා දේපල, පිරියත හා උපකරණ**

මුළුමනින්ම ක්ෂයකර අවසන්වූ නමුත් වාර්තාකරණ දින වන විටත් භාවිතයට යොදාගන්නා දේපළ, පිරියත හා උපකරණවල මුල් පිරිවැය 105 වන පිටුවේ 08 සටහනේ දක්වා ඇත.

### *2.4.4 මූල්‍ය සාධනපත්‍ර*

මණ්ඩලය මගින් එහි මූල්‍ය තත්ත්වය වාර්තා කරනු ලබන දිනට ඇති මූල්‍ය වත්කම් මූල්‍ය වගකීම් හඳුනා ගන්නා ලද්දේ මණ්ඩලය අදාළ මූල්‍ය සාධනපත්‍රවලට අදාළ ගෙනිතික ප්‍රතිපාදන අනුව මණ්ඩලයට හිමිකාරීත්වය ලැබෙන අවස්ථාවේ දීය. මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් මූලිකව ඒවායෙහි සාධාරණ වටිනාකම පදනම්ව අගය කර ඇත. සෘජුව හඳුනාගත හැකි හුවමාරුවට අදාළ වියදම් ඇති නම් ඒවා ද සලකා මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් අගය කරනු ලබන අතර ඒවායෙහි සාධාරණ වටිනාකම නිරූපනය කිරීම සඳහා සුදුසු පරිදි මූල්‍ය වත්කම් සහ වගකීම්වලට වටිනාකම එකතු කිරීම හෝ අඩු කිරීම තුළින් අවශ්‍ය ගැලපීම් සිදු කරනු ලබයි. මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් පරිග්‍රහණයට සෘජුව ආරෝපනය වන ගණුදෙනුවට අදාළ පිරිවැය සාධාරණ වටිනාකම පදනම් කර ගනිමින් ආදායම් ප්‍රකාශ තුළ ලාභ හා අලාභ මඟින් වහාම හඳුනාගනු ලැබේ. මූල්‍ය වත්කම් හා වගකීම් හිලව්කර, ශුද්ධ අගය ඉදිරිපත් කරනු ලබන්නේ, අදාළ අගය එසේ හිලව් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට නෛතික අයිතිය හිමි වන්නේ නම් සහ ශුද්ධ පදනමකින් පියවීමට හෝ වත්කම උපලබ්ධිකර ඒ හා සමගම බැරකම පියවීමට අපේක්ෂා කරන්නේ නම් පමණි.

**මූල්‍ය වත්කම්**

**(අ) මූලික හඳුනා ගැනීම සහ අගය කිරීම**

මණ්ඩලය මගින් මූලිකවම සියලුම ණය හා ලැබිය යුතු දෑ හට ගන්නා අවස්ථාවේ දීම හඳුනා ගැනීම සිදු කරනු ලබන අතර අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් හා වගකීම් මූලිකවම හඳුනා ගනු ලබන්නේ ඒවායෙහි නෛතික අයිතිය මණ්ඩලය වෙත පැවරෙන අවස්ථාවෙහි දී ය. මූලිකවම මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් ඒවායෙහි සාධාරණ වටිනාකමට එම වත්කම් නිකුත් කිරීමට හෝ අත්පත් කර ගැනීමට සෘජුවම දරනු ලබන වියදම් වේ නම් ඒවා ද එකතු කර අගය කරනු ලබයි. මූලික අදියරෙහි දී ම මූල්‍ය වත්කම් පහත සඳහන් එක් කාණ්ඩයක් යටතේ කාණ්ඩගත කරනු ලැබේ.

- ලාභයක් හෝ අලාභයක් ඇතිව සාධාරණ වටිනාකමට
- විකිණීමට ඇති මූල්‍ය වත්කම්
- අලාභයන් හා ලැබිය යුතු ගෙවීම්
- කල් පිරෙන තෙක් රඳවා ගෙන ඇති ආයෝජන.

මණ්ඩලය මගින් එහි ආරම්භක අවස්ථාවේ දී මූල්‍ය වත්කම් වර්ග කිරීම සිදු කරනු ලබයි. මෙම වර්ග කිරීම අදාළ වත්කම් අත්පත් කර ගැනිමේ අරමුණ පදනම්ව සිදු කිරීමට අවධානය යොමු කරයි. තවද මෙම අගය කිරීම ඒවායෙහි සාධාරණ වටිනාකම අනුව අගය කරනු ලබයි. එම වටිනාකම පදනම්ව ආයෝජන කාණ්ඩයට අදාළ හට ගන්නා ලාභ සහ අලාභ උපක්‍රමිකව හඳුනා ගැනීම කරයි. විකිණීමට ඇති ආයෝජන සහ කල් පිරෙන තෙක් රඳවා ගන්නා ආයෝජන කාණ්ඩයන් අගය කිරීම හෝ රඳවා ගැනීම ලියා හරින ලද පිරිවැය පදනම්ව සිදු කරයි.

මූල්‍ය වත්කම්වල මිලදී ගැනීම හෝ විකිණීමට අදාළ නිශ්චිත දිනය තීරණය කරනුයේ අදාළ නෛතික අයිතිය හුවමාරු වන දිනය හෝ වෙළඳපොළ ක්‍රමවේදය තුළ පවත්නා නිරවුල් වීමට අදාළ භාවිතයන්ට අනුව එම දිනය තීරණය කරනු ලබයි. එනම් මණ්ඩලය මගින් මිලට ගන්නා / විකුණන මූල්‍ය වත්කම් වලට අදාළ ගෙවීමට ඇති / ලැබිය යුතු මුදල හඳුනා ගැනීම කරනු ඇත. කෙසේ වෙතත් එම ආයෝජන හිමිකාරීත්වය යටතට වර්ග කරනු ලබන අවස්ථාවක දී සාමූහික ණය වල ගනුදෙනු වූ දිනයට (එනම් විකුණූ දිනය) එම වත්කම් අගය කිරීමට හෝ අගය නොකිරීමට එම ආයෝජනවල පිරිවැය සැලකිල්ලට ගනු ලබයි.

මණ්ඩලය සතුව ඇති මූල්‍ය වත්කම් සහ ඒවායෙහි වර්ග කිරීම් පහත දක්වා ඇති වගුව මගින් ඉදිරිපත් කර ඇත.

| කාණ්ඩය | මූල්‍ය වත්කම |
|---|---|
| ලාභ හෝ අලාභ මත සාධාරණ වටිනාකමට | කිසිවක් නැත |
| විකිණීමට ඇති | භාණ්ඩාගාර බැඳුම්කර භාණ්ඩාගාර බිල්පත් |
| ණය සහ ලැබිය යුතු දෑ | ප්‍රතිමිලදී ගැනීම් (REPO), හදිසි ප්‍රතිමිලදී ගැනීම් (REPO) |
| කල් පිරෙන තෙක් රඳවා ගත් | විදේශ විනිමය සංවර්ධන බැඳුම්කර භාණ්ඩාගාර බැඳුම්කර |

**(ආ) පසුකාලීන අගය කිරීම්**

මූල්‍ය වත්කම්වලට අදාළව පසුව කරනු ලබන අගය කිරීම් පහත පරිදි ඒවායෙහි වර්ග කිරීම් මත පදනම් වනු ඇත. ලාභ හෝ අලාභයන් අනුව සාධාරණ වටිනාකමට ඉදිරිපත් කරන මූල්‍ය වත්කම් ලාභ හෝ අලාභයන් අනුව මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකම මත හඳුනා ගන්නා මූල්‍ය වත්කම් තුළට ගනුදෙනු කිරීමට රඳවා ගන්නා වත්කම් සහ ඒවා මුලාරම්භයේ දී දරණ ලද පිරිවැය පදනම්ව ලාභ / අලාභයන් හඳුනා ගැනීම් සහිතව අගය කරයි. නුදුරු අනාගතයේ දී විකිණීමේ අදහසින් මිලට ගෙන ඇති ආයෝජන මෙම විකිණීමට ඇති වත්කම් කාණ්ඩයට ඇතුළත් වනු ඇත.

ලාභ හෝ අලාභයන් හඳුනා ගැනීමක් සහිතව සාධාරණ වටිනාකමට ආයෝජනය කාණ්ඩ හඳුනා ගැනීමක් සඳහා පහත සඳහන් නිර්ණායකයන් සම්පූර්ණ කළ යුතු වේ.

- වෙනස් වෙනස් වූ පදනම් යොදා ගනිමින් එම වත්කම් සහ වගකීම්වල සාධාරණ වටිනාකමට අගය කිරීමක් සිදු නොවන බවට තහවුරු කරගන්නා අතරම අඛණ්ඩ පැවැත්මකින් යුතුව එම වත්කම්වල වටිනාකම් ඉවත් කිරීමක් හෝ තක්සේරු වටිනාකම එකතු කිරීමක් කරනු ලැබීම

  හෝ

- මණ්ඩලයේ ආයෝජන උපායමාර්ග අනුව යමින් එම මූල්‍ය වත්කම් සහ වගකීම් කළමනාකරණය සහ මෙහෙයවීම කරනු ලබන අතර එම මූල්‍ය වත්කම්, වගකීම් හෝ එම දෙවර්ගයට මණ්ඩලයේ මූල්‍ය වත්කම් සහ වගකීම් යටතට ඇතුළත් වේ.

මෙම ආයෝජනයන් මූලිකවම සාධාරණ වටිනාකම පදනම්ව වාර්තා කර ඇත. දෙවනුව ඒවායෙහි මුල් හඳුනා ගත් අගය නැවත අගය කිරීමට භාජනය කර ඒ අනුව සාධාරණ වටිනාකමෙහි ඇතිවන වෙනස්කම ලාභයක් හෝ අලාභයක් ලෙසට හඳුනා ගැනීම කරයි. එය සම්පූර්ණ ආදායම් තත්ත්වයේ වෙනස්වීම දැක්වෙන ප්‍රකාශනය තුළට ඇතුළත් කර ඇත.

උපචිත හා ගෙවිය යුතු පොළිය පිළිවෙලින් ආයෝජන ආදායම හා මූල්‍ය වියදම් ලෙසට පිළිවෙලින් හඳුනා ගෙන ඉදිරිපත් කර ඇති අතර සඵල පොලී අනුපාතය පදනම් කරගෙන ආයෝජන මත පොළී ලැබීමට හිමිකම ලැබූ විට දී පමණක් ආදායම් ලෙසට හඳුනා ගැනීම සිදු කරයි. සුදුසු පරිදි නුදුරු අනාගතය තුළ විකිණීමට අදහස් කරයි නම් මණ්ඩලය මගින් මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමකට ලාභයක් අලාභයක් ඇතිව තක්සේරු කරනු ලබයි.

තවද කිසියම් විටෙක මණ්ඩලයට පවත්නා වෙළඳපොළ තත්ත්වය තුළ අදාළ මූල්‍ය වත්කම් අපේක්ෂා කරන පරිදි විකුණා ගැනීම සිදු කළ නොහැකි විටක දී ඒ පිළිබඳ තත්ත්වය සලකා බලා එම වත්කම් යළි වර්ගීකරණය කිරීමකට භාජනය කරනු ලබයි. ඒ සඳහා එවකට පවත්නා පොළී අනුපාතයන් සැලකිල්ලට ගනු ලබයි. මෙවැනි ණය සහ ලැබිය යුතු දෑ/ගෙවීම් ප්‍රතිවර්ගීකරණයට භාජනය කිරීම මගින් විකිණීමට ඇති හෝ කල් පිරෙන තෙක් රඳවා ගන්නා වත්කම් ලෙසට ඒවායෙහි ස්වභාවය අනුව හඳුනාගැනීම කරනු ලබයි.

**විකිණීමට ඇති මූල්‍ය වත්කම්**

විකිණීමට ඇති මූල්‍ය වත්කම්වලට භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර (රජයේ බැඳුම්කර) ඇතුළත් වන අතර මෙම ආයෝජනයන් කාණ්ඩය නිශ්චිත නොවන කාලයක් සඳහා රඳවා ගනු ලබන ආයෝජනයන් වේ. මෙම ආයෝජනයන් ද්‍රවශීලතා අවශ්‍යතාවන් මත සහ වෙළඳපොළ තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීමක් ලෙස ඒවා විකිණීමක් සිදු විය හැකිය. විකිණීමට ඇති මූල්‍ය වත්කම් මුලාරම්භ වටිනාකමට අගයකිරීමෙන් පසුව ඒවා සාධාරණ වටිනාකමට අගය කරනු ලබන අතර එහි දී උප ලබ්ධි නොවූ ලාභය හෝ පාඩුව හඳුනා ගනු ලබයි. මේවා වෙනත් සම්පූර්ණ ආදායම් වර්ගීකරණය යටතේ විකිණීමට ඇති සංචිත ලෙසට හඳුනා ගෙන ඇත.

විකිණීමට ඇති ආයෝජන මත උපයනු ලබන පොළී ආදායම බලාපොරොත්තු වන පොළී අනුපාතය පදනම්ව හඳුනා ගනු ලබන අතර ලියා හරින ලද හිඟ රක්‍ෂණ වාරික සහ හෝ වට්ටම් කිරීම් විකිණීමට ගෙන ඇති ආයෝජනවලට අදාළව ආදායම් ගිණුම්වල ආයෝජන ආදායම ලෙසට හඳුනාගෙන ඇත්තේ එම පොළිය ලැබීමේ හිමිකම් ලබන අවස්ථාවේදීය. එසේම එම වත්කම්වල අගය අඩුවීමක් සිදු වී ඇති බවට හඳුනා ගන්නා විටකදී ඒ අනුව ආයෝජන ආදායමට සිදු කරනු ලබන ලාභ හෝ අලාභයන් ලෙසට සහ විකිණීමට ඇති සංචිත වටිනාකමට ගැලපීම් ඉවත් කරනු ලබයි.

මණ්ඩලය මගින් විකිණීමට ඇති මූල්‍ය වත්කම් අගය කිරීමේ දී ඒවායේ විකිණීමට ඇති හැකියාව සහ ඒ පිළිබඳ කෙටිකාලීනව ඇති අදහස අනුව වටිනාකම් තීරණය කරනු ලබයි. එසේම මෙම මූල්‍ය වත්කම් පවත්නා වෙළඳපොළ තත්ත්වයන් අනුව විකුණා ගැනීමට නොහැකි බවට කළමනාකාරීත්වයට හැඟී යන්නේ නම් සහ එහි බලපෑම සැලකිය යුතු තරම් වේ නම් එම තත්ත්වය සලකා යළි එම වත්කම් වර්ගීකරණය කිරීමක් කරනු ලබයි. මෙලෙස යළි වර්ගීකරණය කිරීමට ණය සහ ලැබිය යුතු දෑ යන වර්ගීකරණයට හැකියාව ඇත්තේ එම මූල්‍ය වත්කම්

ණය සහ ලැබිය යුතු දෑ යන නිර්වචනයට අයත් වන සහ කළමනාකාරිත්වයේ අදහස සහ නුදුරු අනාගතයේ දී විකිණීමට හෝ කල් පිරීම වන තෙක් රඳවා ගැනීම සම්පූර්ණ අවස්ථාවල දී පමණි. කල් පිරෙන තෙක් රඳවා ගන්නා වත්කම් වර්ගීකරණයට හැකියාව ඇත්තේ ආයතනයට ඒ සඳහා හැකියාවක් සහ කල් පිරෙන තෙක් රඳවා ගැනිටම අදහසක් ද තිබේ නම් පමණි.

මූල්‍ය වත්කම්වල විකිණීමට ඇති වත්කම් යන කාණ්ඩයට අදාළව යළි වර්ගීකරණය නිසා ඇති වන ලාභ හෝ පාඩුව එම වත්කම මත හඳුනා ගනු ලබන අතර එම ප්‍රමාණය අපේක්ෂිත පොළී අනුපාතය යොදා ගනිමින් එම වත්කමෙහි පවත්නා ප්‍රයෝජනවත් ජීව කාලය පුරා යොදා ගැනීමක් කරනු ලබයි. නව ලියා හරින ලද පිරිවැය සහ අනාගත අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් අතර වෙනස අපේක්ෂිත පොලී අනුපාතය යොදා ගනිමින් ලියා හැරීමට භාජනය කරයි. පසුකාලීනව එම වත්කම්වල අගය අඩුවීමක් හඳුනා ගනු ලැබූ විටෙක දී එය හිමිකාරීත්වයට ඇති කරන බලපෑම ආදායම් ප්‍රකාශනවල දැක්වීම කරනු ලබයි.

**ණය සහ ලැබිය යුතු වත්කම්**

ණය සහ ලැබිය යුතු දෑ යන වත්කම් කාණ්ඩය ස්ථිර හෝ නිශ්චිත ගෙවීමක් සහිත වන අතර ඒවා ක්‍රියාකාරී වෙළඳපොළක හුවමාරු කිරීමට නොහැකි වත්කම් කාණ්ඩයකි. මණ්ඩලය මගින් ණයකර ද මෙම කාණ්ඩය යටතේ නම් කිරීමට තීරණය කරන ලද අතර ඊට හේතුව නම් එවැනි උපකරණ මිල ලේඛනයට ඇතුළත් කළද ඒ සඳහා ක්‍රියාකාරී වෙළඳපොළක් නොතිබීමයි.

මෙම ආයෝජනයන් ආරම්භයේ දී පිරිවැයට හඳුනා ගන්නා ලද අතර එම ආයෝජන අත්කර ගැනීම සඳහා සාධාරණ වටිනාකමක් ගෙවීමට සිදු විය. මෙම වත්කම් මිලට ගැනීමට සෘජුවම දරණ ලද පිරිවැයක් තිබේ නම් එම ප්‍රමාණය ද ආයෝජන පිරිවැයට ඇතුළත් කර ඇත. ආරම්භක අගය කිරීමට අනතුරුව ණය සහ ලැබිය යුතු දෑ සඵල පොළී අනුපාතය යොදා ගනිමින් වටිනාකමට අගය කිරීම් කරන අතර එහි දී අගය අඩුවීම් සඳහා ද අඩු කිරීම් කර ඇත.

ලියා හරින ලද පිරිවැය ගණනය කිරීමේ දී කිසියම් වට්ටම් කිරීමක් හෝ අධි මිලක් පවතියි නම් එය සැලකිල්ලට ගෙන ඇති අතර අත් කර ගැනීමේ ගාස්තු හෝ වියදමක් වේ නම් එය අපේක්ෂිත පොළී ආදායමට ද ඇතුළත් කර සලකා බලයි. ආදායම් ප්‍රකාශනවල ආයෝජන ආදායම තුළට මෙම අපේක්ෂිත පොලී අනුපාතය යොදා ගනිමින් කරනු ලබන ලියා හැරීම් ගලපා ඇති අතර එම ලියා හැරීමේ ක්‍රියාවලිය තුළ දී එම ආයෝජනයට අදාළව ලාභය හෝ අලාභය හඳුනා ගැනීමක් කරනු ලබයි.

කාර්ය මණ්ඩලයට ලබාදී ඇති ආපදා ණය ප්‍රමාණ වටිනාකම් සැලකිය යුතු ලෙස අඩු බැවින් පොළී අනුපාතය යොදා ගනිමින් අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කර අදාළ ලැබිය යුතු ණය වටිනාකම ගණනය කිරීම් කර හිඟ ණය ශේෂය හඳුනා ගැනීමක් සිදු කර නොමැත.

**කල්පිරෙන තෙක් රඳවා ගන්නා මූල්‍ය වත්කම්**

ගණුදෙනු කිරීම සඳහා යොදා ගැනිමට නොහැකි ස්ථිර හෝ නිශ්චිත ගෙවීම් වටිනාකමක් සහ නිශ්චිත කල් පිරීමක් සහිත ඒවා මෙම කාණ්ඩයට ඇතුළත් වේ. මණ්ඩලයේ අදහස සහ හැකියාව මත මෙම වත්කම් කල් පිරෙන තෙක් රඳවා ගැනීම කරයි. මූලික අගය කිරීමෙන් අනතුරුව එය යොදා ගනිමින් කල් පිරීමට රඳවාගත් මූල්‍ය වත්කම් ලියා හැරීමේ පිරිවැය සලකා බලමින් තක්සේරු කිරීමක් සිදු කරනු ලබයි. විදේශ විනිමය සංවර්ධන බැඳුම්කර මෙම කාණ්ඩය යටතේ වර්ග කර ඇත.

සඵල පොළී අනුපාත ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශයේ ආයෝජන ආදායම්වල ඇතුළත් කර ඇත. අයෝජන ඉවත්කරන විට හෝ හානිකරණයට ලක්වී ඇති විට හා ක්‍රමක්ෂය ක්‍රියාවලිය මගින් ද ලාභ හා පාඩු ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇත.

**(ඇ) මූල්‍ය වත්කම් හඳුනා ගැනීමෙන් ඉවත් කිරීම**

මූල්‍ය වත්කම් (හෝ අදාළ පරිදි, මූල්‍ය වත්කමක යම් කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයක කොටසක්) සම්බන්ධයෙන් -

- එම වත්කමින් මූල්‍ය ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිවාසිකම් ඉකුත්වූ විට
- මූල්‍ය ප්‍රවාහ ලබා ගැනීමේ ගිවිසුම්ගත අයිතිවාසිකම පවරාදෙනු ලැබූ විට

හෝ

- එම වත්කමින් මූල්‍ය ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිවාසිකම මණ්ඩලය විසින් රඳවාගනු ලැබූ හෝ යම් ගිවිසුමක් යටතේ අදාළ මූල්‍ය ප්‍රවාහ යම් තෙවන පාර්ශ්වයක් වෙත සැලකිය යුතු ප්‍රමාදයකින් තොරව ගෙවීමේ බැඳීමක් ඇතිකර ගනු ලැබූ විට එසේත් නැතහොත්

ආ) මණ්ඩලය විසින් වත්කමට අදාළ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු පරිදි පවරාදෙනු ලැබ හෝ

ආ) වත්කමට අදාළ සියලු අවදානම් සහ ප්‍රතිලාභ මණඩලය විසින් සැලකිය යුතු පරිදි පවරාදෙනු ලැබ හෝ රඳවාගනු ලැබ නොමැති නමුත් වත්කමේ පාලනය පවරාදී ඇත්නම් එවැනි මූල්‍ය වත්කම් පොත්වලින් ඉවත් කරනු ලැබේ.

මණ්ඩලය විසින් යම් වත්කමකින් මූල්‍ය ප්‍රවාහ ලබා ගැනීමේ සිය අයිතිවාසිකම් පවරාදෙනු ලැබ ඇත්නම් හෝ එසේ කිරීමට එකඟවී ඇත්නම් හෝ වත්කමට අදාළ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු පරිදි පවරාදෙනු ලැබ හෝ රඳවාගනු ලැබ නොමැති නම් හෝ වත්කමේ පාලනය පවරාදී නොමැති නම්, එවැනි වත්කම් පිළිගැනීම කරනු ලබන්නේ එම වත්කම සම්බන්ධයෙන් මණ්ඩලය තවදුරටත් ක්‍රියාකරන ප්‍රමාණයට පමණි.

පවරාදෙන ලද වත්කමක් සම්බන්ධයෙන් වන ඇපකරයක ස්වරූපයෙන් තවදුරටත් කටයුතු කිරීම වත්කමේ මුල් ධාරණ අගය සහ අදාළ බැඳුම්කරය යටතේ ගෙවීමට මණ්ඩලයට නියමවී ඇති උපරිම

අගය යන දෙකින් වඩා අඩු අගය මත ඇගයීමට ලක් කරනු ලැබේ. එහිදී, මණ්ඩලය විසින් ඒ හා සම්බන්ධ බැරකම ද පිළිගනු ලැබේ. එසේ මණ්ඩලය රඳවාගෙන ඇති අයිතිවාසිකම් හා බැඳීම් නිරූපණය වන පදනමක් මත පවරාදෙන ලද වත්කම සහ ආශ්‍රිත බැරකම ඇගයීමට ලක් කෙරේ.

**(ඈ) මූල්‍ය වත්කම් වල අගය අඩු වීම**

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සෑම වාර්තාකරණ දිනකම යම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් හානිකරණ වී ඇති බවට වාස්තවික සාක්ෂි තිබේදැයි සොයා බලනු ලැබේ. යම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් හානිකරණ වී ඇති බවට සලකනු ලබන්නේ එම වත්කම මූලික පිළිගැනීමෙන් (සිදුවූ අලාභයකින්) අනතුරුව සිදුවූ එවැනි එක් සිදුවීමක් හෝ සිදුවීම් කිහිපයක් හේතුවෙන් හටගත් හානිකරණ පිළිබඳ වාස්තවික සාක්ෂි ඇත්නම් සහ එම අලාභය මගින් එම මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයේ ඇස්තමේන්තුගත ඉදිරි මූල්‍ය ප්‍රවාහය කෙරෙහි විශ්වසනීය ආකාරයෙන් තක්සේරුකළ හැකි බලපෑමක් සිදු වන්නේ නම් පමණි. හානිකරණය පිළිබඳ සාක්ෂි වලට ණයගැතියන් හෝ ණයගැතියන් කණ්ඩායමක් සැලකියයුතු මූල්‍ය දුෂ්කරතාවකට ලක්ව සිටීම පිළිබඳ ඉඟි පහළවීම, පොළිය හෝ මූලික ණය මුදල ගෙවීම පැහැර හැරීම හෝ නොසලකා හැරීම, ඔවුන් බංකොලොත් වීම හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට ලක්වීම සහ නිරීක්ෂණීය දත්ත මගින් ගෙවීම් පැහැර හැරීම හා සහසම්බන්ධ හිඟ මුදල් හෝ ආර්ථික කොන්දේසි වල වෙනස්කම් ආදී ඇස්තමේන්තුගත ඉදිරි මූල්‍ය ප්‍රවාහවල මැනිය හැකි පහළයාමක් ඇතිවිය හැකි බව විද්‍යමාන වීම ආදිය ඇතුළත් වේ.

**(ඉ) සාධාරණ අගය ගණනය කිරීම**

මණ්ඩලය මගින් වාර්තා කරනු ලබන සෑම දිනකදීම විකිණීමට ඇති වත්කම් යන කාණ්ඩයට අයත් මූල්‍ය උපකරණයන්ගේ සාධාරණ අගය පිළිබඳ තක්සේරුවක් කර ලාභය හෝ අලාභය හඳුනා ගනු ලබයි.

සියලුම වත්කම් හා වගකීම්වල සාධාරණ අගය තක්සේරු කිරීම හෝ හෙළිදරව් කිරීම මූල්‍ය ප්‍රකාශනවල සිදු කරන අතර එම සාධාරණ අගය දැක්වීම අනුපිළිවල පහත පරදි ඉදිරිපත් කරයි. එය සමස්ථයක් ලෙස සාධාරණ අගය ගණනය කිරීමට වැදගත්වන අඩුම යෙදවුම මත පදනම් වේ.

- 1 මට්ටම - මිල කිරීමක් සහිත (වෙන් කිරීමකින් තොරව) හඳුනාගත් වත්කම් හෝ වගකීම්වල ක්‍රියාකාරී වෙළඳපොළ මිල
- 2 මට්ටම - සාධාරණ අගය තක්සේරු කිරීමට වැදගත්වන අවම මට්ටමේ යෙදවුම් සඳහා තක්සේරු ක්‍රම සෘජුව හෝ වක්‍රව නිරීක්ෂණය කළ හැකි වීම.
- 3 මට්ටම - සාධාරණ අගය තක්සේරු කිරීමට වැදගත්වන අවම මට්ටමේ යෙදවුම් සඳහා තක්සේරු ක්‍රම නිරීක්ෂණය කල නොහැකිවීම.

| සාධනපත්‍ර වර්ගය | සාධාරණ අගය කිරීමේ පදනම | සාධාරණ අගයෙහි මට්ටම |
|---|---|---|
| සංවර්ධන බැඳුම්කර | සඵල අනුපාතය අනුව අගය කර ඇත. | මට්ටම 2 |
| භාණ්ඩාගාර බැඳුම්කර | වෙළඳපොළ ඉපැයීම අනුව අගය කර ඇත. | මට්ටම 1 |
| භාණ්ඩාගාර බිල්පත් | වෙළඳපොළ ඉපැයීම අනුව අගය කර ඇත. | මට්ටම 1 |

**මූල්‍ය වගකීම්**

**(අ) මූලාරම්භක හඳුනා ගැනීම හා අගය කිරීම**

සියලුම මූල්‍ය වගකීම් ආරම්භයේ දී සාධාරණ වටිනාකමට හඳුනාගනු ලබන අතර ණය සහ ණය ගැනීම් සම්බන්ධයෙන් ඒ සඳහා සෘජුවම දරනු ලබන වියදම් අඩු කරනු ලබයි. මණ්ඩලයේ මූල්‍ය වගකීම් යටතට වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු මුදල් සහ රක්ෂණ ගෙවීම් සහ බැංකු අයිරා ද ඇතුළත් වේ.

**(ආ) පසුකාලීන අගය කිරීම**

මූල්‍ය වගකීම් පසුකාලීනව අගය කිරීම මත දැක්වෙන පරිදි එවා වර්ගකිරීම මත රඳා පවතී:

**ණය සහ ණය ගැනීම්**

මූලාරම්භයේ දී හඳුනාගැනීමෙන් අනතුරුව පොළී ගෙවනු ලබන ණය සහ ණය ගැනීම් පසුකාලීනව අගය කිරීම සඵල පොළී අනුපාතය යොදා ගනිමින් ලියා හැරීමේ පදනමට කරනු ලබයි. සඵල පොළී අනුපාතය යොදා ගනිමින් වගකීම් ලියා හැරීමේ ක්‍රියාවලියේදී හට ගනු ලබන ලාභය හෝ අලාභය මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම කරනු ලබයි. අත්පත් කර ගැනීමේ දී ගෙවනු ලබන අධි මිල හෝ ලැබෙන වට්ටම් ද සලකා ඒවා ද සඵල පොළී අනුපාතයට ගැලපීමෙන් අනතුරුව ලියා හැරීමේ පිරිවැය ගණනය කරයි. එසේම ආදායම් ප්‍රකාශනවල එම ලියා හැරීමේ පිරිවැය මූල්‍ය ණය පිරිවැය යටතේ දක්වා ඇත.

**(ඇ) හඳුනාගැනීමෙන් ඉවත් කිරීම**

මූල්‍ය වගකීම් යටතේ ඇති බැඳීම් නිදහස් කළවිට, අවලංගු කළ විට හෝ කල්ඉකුත්වූ විට මූල්‍ය වගකීමක් ඉවත් කරනු ලබයි.

**(ඈ) ගෙවිය යුතු රක්ෂණ**

ගෙවිය යුතු රක්ෂණයන්ගේ වටිනාකම අදාළ වාරික ගෙවීමට බැඳීමත් සමග හඳුනා ගන්නා අතර එහි වටිනාකම මූලාරම්භයේ දී ඉදිරිපත් වී ඇති වටිනාකමෙහි සාධාරණ අගයෙන් එම ගණුදෙනුව සඳහා දරන ලද පිරිවැය අඩු කරන ලද අගයට තක්සේරු කර ඇත. පසු අවස්ථාවල දී සඵල පොළී අනුපාතය යොදා ගනිමින් ලියා හරින ලද වටිනාකමට අගය කරනු ලබයි. මෙම ගෙවිය යුතු රක්ෂණ වාරික කිසියම් විටෙක ඒ පිළිබඳ වගකීම නිරවුල් කිරීමක දී වගකීම අවලංගු කළ විට දී හෝ කල් ඉකුත්වීමක දී ඉවත් කරනු ලබයි.

### 2.6.4 මූල්‍ය උපකරණ හිලව් කිරීම

මූල්‍ය තත්ත්වය දැක්වෙන ප්‍රකාශනයේ මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් එකිනෙක හිලව් කර ශුද්ධ අගය පමණක් හඳුනා ගෙන දක්වා ඇත. එසේ කරනුයේ වර්තමානයේ බලාත්මක කළ හැකි නෛතික අයිතියක් පවත්නා විට හා එලෙස ශුද්ධ අගයට නිරවුල් කිරීමේ අරමුණක් ද පවතින විටෙකදීය. එසේ නොමැතිනම් වත්කම් උපලබ්ධිවීම සහ වගකීම් නිරවුල් කිරීම එකම අවස්ථාවක දී සිදුවන විටෙක දී ද මෙලෙස ශුද්ධ අගයට වාර්තා කිරීම කරනු ලබයි. විශේෂ වශයෙන් හෙළිදරව් කළ පරිදි මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට අනුව කිසියම් ගිණුම්කරණ ප්‍රමිතියක අවශ්‍යතාව පරිදි හෝ ඉඩ ලබාදී ඇති පරිදි හෝ නිර්වචනය කර ඇති පරිදි ආදායම් සහ වියදම් හිලව් කිරීම් කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම් කර ඇත.

### 2.6.5 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

මණ්ඩලය මගින් සෑම වාර්තා කරනු ලබන දිනක දීම කිසියම් වත්කමක හානිකරණය පිළිබඳ ලක්ෂණයන් තිබේද යන්න පිළිබඳව සලකා බලයි. එවැනි ලක්ෂණයක් තිබේ නම් හෝ කිසියම් වත්කමක වාර්ෂික අගය අඩුවීම/ හානිකරණය පිළිබඳ පරීක්‍ෂා කිරීමක් අවශ්‍ය වේ නම් මණ්ඩලය මගින් එම වත්කමෙහි අය කර ගත හැකි අගය ඇස්තමේන්තු කරනු ලබයි. වත්කමක අය කර ගත හැකි අගය වනුයේ මුදල් උත්පාදන ඒකකයේ සාධාරණ අගයෙන් විකිණීමට දරනු ලබන වියදම සහ එහි පරිහරණයට ඇති වටිනාකම අඩු කළ පසු ඉතිරි අගය වේ. අනෙක් වත්කම් හෝ වත්කම් කාණ්ඩයන්ගෙන් වැඩි වශයෙන් ස්වාධීනව කිසියම් වත්කමක් මුදල් ඉපයීමක් උත්පාදනය නොකරයි නම් එවිට දී වත්කමෙහි අය කර ගත හැකි වටිනාකම වෙන් වශයෙන් හඳුනා ගැනීමක් කරයි. වත්කමක ඉදිරියට ගෙන ආ අගය හෝ මුදල් උත්පාදන ඒකක වටිනාකම එහි අයකරගත හැකි වටිනාකම ඉක්මවයි නම් එම වත්කමේ අගය අඩුවීමක් ඇති බවට සලකයි. එවිට එම එහි අය කරගත හැකි වටිනාකම අඩු කිරීමක් කරනු ලබයි. වත්කමක පරිහරණයට ගත හැකි වටිනාකම තක්සේරු කිරීමේ දී ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහයන්. බද්දට පෙර වට්ටම් අනුපාතය යොදා ගනිමින් වර්තමාන වටිනාකම සොයා ගැනීම කරයි. සාධාරණ වටිනාකම තීරණය කිරීමේ දී විකිණීමට දැරීමට සිදුවන වියදම අඩු කරනු ලබන අතර තොරතුරු තිබේනම් මෑතකාලීන වෙළඳපොළ ගණුදෙනු විස්තර ද යොදා ගනු ලබයි. එවැනි වෙළඳපොළ තොරතුරු නොමැති විටක දී පවත්නා සුදුසු අගය කිරීමේ ක්‍රමවේදයක් යොදා ගැනීම සිදු කරයි.

අඛණ්ඩව ක්‍රියාත්මක වන ක්‍රියාකාරකම්වල අගය අඩුවීමේ අලාභයන් ආදායම් ප්‍රකාශනවල හඳුනා ගන්නා අතරම එම වියදම් කාණ්ඩය එම අගය අඩු වූ වත්කමෙහි ක්‍රියාකාරී ස්වභාවය අනුව වර්ගීකරණය කරනු ලබයි.

### 2.6.6 සාමාන්‍ය රක්‍ෂණ ගිවිසුම්ගත වගකීම්

සාමාන්‍ය රක්‍ෂණ ගිවිසුම්වලට අදාළ වගකීම්වලට හිඟව ඇති හානි ප්‍රතිපූර්ණ මුදල් සහ හිඟව ඇති රක්‍ෂණ වාරික සඳහා වන වෙන් කිරීම් හිඟව ඇති හානි ප්‍රතිපූර්ණ වෙන් කිරීම් ඇස්තමේන්තුගත අවසාන වශයෙන් දරන ලද එහෙත් වාර්තාගත කරන දිනට නිරවුල් නොවූ සියලුම හානි ප්‍රතිපූර්ණයන් පදනම් කරගෙන ඇති අතර ඊට හානි ප්‍රතිපූර්ණයන් සැකසීමට අදාළ වියදම්, වෙනත් ලැබීම් සහ සුන්බුන් විකිණීමේ ලැබීමට අපේක්ෂිත මුදල් අඩු කිරීම ද කරනු ලබයි.

සමහර අවස්ථාවල දී දැනුම්දීමේ ලිපිය හා සමහර වර්ගවල හානි ප්‍රතිපූර්ණයන් ප්‍රමාදවීමක් සිදු විය හැකිය. එම නිසා වාර්තා කරනු ලබන දිනට අවසාන වශයෙන් දරණ වියදම නිශ්චිත කිරීමක් නිශ්චිතවම නොහැකි වනු ඇත. තව ද මුදලේ අගය වෙනස්වීම සඳහා වගකීම්වලට අදාළව ගැලපීම් කර නොමැත. තව ද හානි පූර්ණ ගෙවීමට ඇති වගකීම කල් ඉකුත් වීම, වගකීම ඉවත්වීම හෝ අවලංගු වූ විටෙක දී අදාළ වගකීම ද හඳුනා නොගනියි. වෙන් කිරීම් ශුද්ධ උපයා නොගත් රක්‍ෂණ වාරික හිලව් කර නොගත් ශුද්ධ අත්පත් කර ගැනීම් පිරිවැය සඳහා වෙන් කිරීම් සහ දළ හිඟ වාරික ගෙවීම සඳහා කළ වෙන් කිරීම් ද ඇතුළත් වේ. උපයා නොගත් රක්‍ෂණ වාරික වටිනාකම හිලව් කර නොගත් වත්කම් අත්කර ගැනීමේ පිරිවැය සහ නිරවුල් නොකළ දළ හානි ප්‍රතිපූර්ණ සඳහා වෙන් කිරීම් යනාදිය රක්‍ෂණ කර්මාන්තයේ සහ යහපත් පරිහරණයන්ට අනුව සිදු කර ඇත.

සෑම වාර්තා කරනු ලබන දිනකදීම මණ්ඩලය මගින් එහි කල් ඉකුත් නොවූ අවදානම් ඇගයීමට ලක් කරන අතර ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කිරීමේ ප්‍රමිති අංක 4 අනුව වගකීම් හඳුනා ගැනීමේ පරීක්ෂාව ක්‍රියාත්මක කරනු ලබයි. එමගින් බලාපොරොත්තු වන හානි පූර්ණයන්ගේ සමස්ත අතිරික්තයක් තිබේද, උපයා නොගත් වාරික අත් කර ගැනීමේ වියදම් ලියා හැරීමේ වියදම් ආදිය සලකා බලයි. මෙම ගණනය කිරීම් සඳහා අනාගත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන ඇස්තමේන්තු සලකා බලන අතර ඒ සඳහා සාමාන්‍ය රක්‍ෂණ සඳහා වන ප්‍රතිපාදන වෙන් කිරීම් හා ඒ මත ඇතිව වත්කම්වල බලාපොරොත්තු වන ආයෝජන ප්‍රතිලාභය සැලකිල්ලට ගනු ලබයි. මෙහි දී උපයා නොගත් රක්‍ෂණ වාරිකයන්ගේ වාර්තාගත වටිනාකම (අත්කර ගැනීමේ ඉදිරියට ගෙන ආ අගය අඩු කළ පසු) ප්‍රමාණවත් නොවේ නම්, එම ඌණතාවය රක්‍ෂණ වාරික හිඟය ලෙසට හඳුනා ගෙන එය ආදායම් ප්‍රකාශනවල දැක්වීම කරයි.

### 2.6.7 ප්‍රතිරක්‍ෂණය කිරීම

මණ්ඩලය සිය සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල දී හට ගන්නා රක්‍ෂණ අවදානම සිය සියලුම ව්‍යාපාරික කටයුතු මඟින් උකහා ගැනීමට අවකාශ සලසා ඇත. ප්‍රතිරක්‍ෂණ වත්කම් ප්‍රතිරක්‍ෂණ සමාග ම්වලින් ලැබිය යුතු වටිනාකම් නිරූපනය කරයි. එම ප්‍රතිරක්‍ෂණයන්ගෙන් ලැබිය යුතු වටිනාකම තක්සේරු කිරීම හිඟව ඇති හානි ප්‍රතිපූර්ණයන් සඳහා වෙන් කිරීම් හෝ ප්‍රතිරක්‍ෂණ ගිවිසුම් අනුව ගෙවීම් කරන ලද ප්‍රතිලාභ අනුව සහ ප්‍රතිරක්‍ෂණ ගිවිසුම් ප්‍රකාරව වනු ඇත. හානිකරණ අලාභය ආදායම් ප්‍රකාශයේ සටහන් කරනු ලබයි. පවරාදුන් ප්‍රතිරක්‍ෂණ ගිවිසුම් මඟින්

රක්‍ෂණ ඔප්පුහිමියන් කෙරෙහි ඇති බැඳීමෙන් අධ්‍යක්‍ෂ මණ්ඩලය නිදහස් වීමක් සිදු නොවේ.

ප්‍රතිරක්‍ෂණ බැඳීම් මඟින් ප්‍රතිරක්‍ෂණ සමාගම්වලට ගෙවිය යුතු වටිනාකම් නිරූපනය වේ. එසේ ගෙවිය යුතු මුදල අදාළ ප්‍රතිරක්‍ෂණ ගිවිසුමට අනුකූලව තක්සේරු කරනු ලැබේ. පවරාදුන් සහ පවරාගත් ප්‍රතිරක්‍ෂණය සඳහා වාරික හා හිමිකම් දළ පදනමක් මත ඉදිරිපත් කර ඇත. ගිවිසුම්ගත අයිතිවාසිකම් කල්ඉකුත්වීම මඟින් නිරුද්ධ වූ විට හෝ ගිවිසුම වෙනත් පක්‍ෂයකට පවරාදුන් විට ප්‍රතිරක්‍ෂණ වත්කම් හෝ වගකීම් ඉවත් කිරීම කරනු ලැබේ.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ මණ්ඩලය විසින් 2012 සිට ක්‍රියාත්මක වන පරිදි සිය සියලුම ව්‍යාපාර සඳහා රක්ෂණ සහ අභ්‍යන්තර ප්‍රතිරක්ෂණ අවදානම් පවරා නොමැත.

### 2.6.8 ලැබිය යුතු රක්‍ෂණ වාරික

ලැබිය යුතු රක්‍ෂණ වාරිකයන් මූලාරම්භයේ දී ලැබිය යුතු හෝ ලැබීමට නියමිත වටිනාකම සාධාරණ අගයට තක්සේරු කර හඳුනා ගැනීම කරයි. කිසියම් රක්‍ෂණයක ඉදිරියට ගෙන එන ලද වටිනාකම කිසියම් සිදුවීමක් හෝ තත්ත්වයන්ගේ වෙනසක් නිසා අගය අඩුවීමක් සිදු වෙයි නම් එය තක්සේරුවට භාජනය කර හානිකරණය අලාභයන් ආදායම් ප්‍රකාශන වලට වාර්තා ගත කරනු ලබයි. ශ්‍රී ලංකා රක්‍ෂණ මණ්ඩලය විසින් නිකුත්කර ඇති රක්ෂණ වාරික ගෙවීම් පිළිබඳ සහතික කිරීමේ විධිවිධානවලට අනුව එයට යටත්ව නිකුත්කර ඇති රක්ෂණ ඔප්පු දින 60 ක කල්පිරීමේ කාලය මත බේරුම්කර නොතිබුණ හොත් අවලංගු කරනු ලබයි.

### 2.6.9 මුදල් සහ මුදල් හා සමාන වත්කම්

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යය සඳහා මුදල් සහ මුදල් හා සමාන වත්කම් වලට බැංකු ශේෂය, අතැති මුදල් ශේෂය සහ ශුද්ධ බැංකු අයිරා ශේෂය ද ඇතුළත් වෙයි.

### 2.6.10 විකුණුම් බදු සහ රක්‍ෂණ වාරික බදු

පහත අවස්ථාවන්හි දී හැර ආදායම්, වියදම් සහ වත්කම් හඳුනා ගැනීමේ දී විකුණුම් බදු සහ රක්‍ෂණ වාරික මත බදු මුදල් හැර ශුද්ධ අගයට හඳුනා ගෙන ඇත.

- වත්කමක් මිලට ගැනීමේ දී හෝ සේවාවක දී ඒ මත ගෙවනු ලබන බදු වටිනාකම ආපසු දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් හිලව් කර ගැනීම නොහැකි විටෙක දී එවැනි බදු අදාළ වත්කම් අත්කර ගැනීමේ වියදමෙහි හෝ අදාළ වියදමෙහි කොටස් ලෙස සුදුසු පරිදි හඳුනා ගනු ලබයි.
- ලැබිය යුතු හා ගෙවිය යුතු වටිනාකම් දැක්වීමේ දී විකුණුම් වටිනාකම හෝ රක්‍ෂණ වාරිකවල වටිනාකම අදාළ ගනුදෙනුව මත වන බදු මුදල් ද ඇතුළත් වේ.

විකුණුම් මත හෝ රක්‍ෂණ වාරික මත ගෙවීමට හෝ ලැබීමට ඇති ශුද්ධ බදු ප්‍රමාණය දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවීමට ඇති / ලැබීමට ඇති බදු ලෙස මූල්‍ය තත්ත්වය දැක්වෙන ප්‍රකාශවල දක්වා ඇත.

### 2.6.11 විදේශ මුදල් පරිවර්තන ගණුදෙනු සහ ශේෂයන්

විදේශ ව්‍යවහාර මුදලින් කරන ගණුදෙනු අදාළ ගණුදෙනුව සිදුවන දිනට පැවති කෘත්‍යාත්මක විනිමය අනුපාතය මත මූලිකව වාර්තා කරනු ලැබේ.

විදේශ ව්‍යවහාර මුදලින් නියෝජනය කෙරෙන මූල්‍ය වත්කම් සහ වගකීම් වාර්තා කරනු ලබන දිනට පවත්නා කෘත්‍යාත්මක විනිමය අනුපාතය පදනම්ව යළි තක්සේරු කරනු ලබයි.

### 2.6.12 විශ්‍රාම ප්‍රතිලාභ පිළිබඳ වගකීම

**(අ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිත**

පාරිතෝෂිත යනු නිශ්චිත ප්‍රතිලාභ සැලසුමකි. 1983 අංක 12 දරණ පාරිතෝෂිත මුදල් ගෙවීම පිළිබඳ පනතට අනුව මණ්ඩලය පාරිතෝෂිත ගෙවීමට බැඳී සිටින්නේ වසර 5ක අඛණ්ඩ සේවා කාලයක් සපුරා තිබීම මත පමණි. මෙම වගකීම යටතේ සේවය කළ එක් වර්ෂයක කාලයකට මාසික වැටුපෙන් අර්ධය බැගින් සම්පූර්ණ කළ සේවා කාලය මත ගණනය කිරීම කර මූල්‍ය ප්‍රකාශවල දක්වයි. මෙම පාරිතෝෂිත ගණනය කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 “සේවක ප්‍රතිලාභ” ආයුගණක ගණනය කිරීමේ ක්‍රමයට සිදු කර ඇත.

**(ආ) නිශ්චිත දායකත්ව සැලසුම - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල**

අදාළ නීති රෙගුලාසීන්ට අනුව කාර්ය මණ්ඩලය සේවක අර්ථසාදක අරමුදල සහ සේවක භාරකාර අරමුදලට දායකත්වය ලැබීමට හිමිකම් කියයි. අධ්‍යක්ෂ මණ්ඩලය කාර්ය මණ්ඩලයේ දළ වැටුපෙන් නිශ්චිත ප්‍රතිශතයක් සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදලට පිළිවෙලින් දායක වෙයි.

### 2.6.13 අසම්භාව්‍ය වගකීම් සඳහා වෙන් කිරීම්

අධ්‍යක්ෂක මණ්ඩලයට වගකීමෙන් බැඳෙන (නෛතික හෝ වෙනයම් ආකාරයට) අවස්ථාවල දී ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමක් කරන අතර එය පසුගිය සිද්ධියක ප්‍රතිඵලයක් සහ ඒ මත ආර්ථික ප්‍රතිලාභයන් හෝ මුදල් ගලා යාමක් ඇති වන අතර එය සාධාරණ ලෙස ඇස්තමේන්තුගත කර නිරවුල් කළ යුතු වේ. මණ්ඩලය මගින් සමහර හෝ සියලුම වෙන් කිරීම් පියවා ගැනීමට බලාපොරොත්තු වන විටදී එම පියවා ගැනීම වෙනමම වත්කමක් ලෙසට හඳුනා ගනු ලබයි. නමුත් ඒ සඳහා පියවා ගනු ලබන මුදල සෑම ආකාරයෙන්ම නිශ්චිත විය යුතු වේ. කිසියම් වෙන් කිරීමක් සඳහා වන වියදම ආදායම් ප්‍රකාශනවල පියවා ගත හැකි මුදල හිලව් කර ශුද්ධ අගයට දක්වා ඇත. මුදලෙහි වර්තමාන වටිනාකම එතරම් ප්‍රමාණාත්මක නොවන විටදී ප්‍රතිපාදන වෙන් කිරීම්

පවත්නා බද්දට පෙර අනුපාතය යොදා ගනිමින් වට්ටම් කර වටිනාකමට එළැඹී ඇත. කිසියම් අවස්ථාවක වට්ටම් කිරීම් යොදා ගන්නා විටෙක කාල පමාව නිසා ප්‍රතිපාදන වෙන් කිරීම් ඉහළ යාමක දී එය මූල්‍ය පිරිවැයක් ලෙසට හඳුනා ගනු ලබයි.

සම්පත් ගලා යාම හඳුනා ගැනීමට නොහැකි අවස්ථාවල දී හැර සියලුම අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශනවල සටහන් ලෙසට අනාවරණය කර ඇත.

## 2.7 ආදායම් හඳුනාගැනීම

### *2.7.1 දළ වාරික*

දළ ලිඛිත රක්ෂණ වාරික සමන්විත වනුයේ ගිණුම් කාලසීමාව තුල ඇතුලත් වූ ගිවිසුම් මගින් සපයන ලද සමස්ත ආවරණ කාල පරිච්ඡේදය සඳහා ලැබිය යුතු මුළු වාරිකයන්ගෙනි. ඒවා ඔප්පුව අනුමත කරන ලද දිනයේ දී හඳුනාගනු ලබයි. පෙර ගිණුම් කාල පරිච්ඡේදයේ සටහන් කරන ලද ව්‍යාපාර කටයුතු වලට අදාලව ලැබිය යුතු වාරික සඳහා වන ගිණුම් කාලපරිච්ඡේදය තුල පැන නැගුනු කවර ගැලපීමක් වුවත් වාරික තුළ ඇතුලත් වේ.

නොඉපයූ වාරික යනු වාර්තා කරන දිනයට පසුව අවදානම් කාලයට අදාලව වර්ෂය තුල සටහන් කරන ලද වාරිකවල කොටස්ය. පොදුවේ පිළිගන්නා රක්ෂණ හා ප්‍රතිරක්ෂණ පරිචයන් අනුව දින 365, 1/24 හෝ දළ වාරික පදනම මත 35% අනුපාතයට නොඉපයූ වාරික ගණනය කරයි. පසුකාලීන කාල පරිච්ඡේදයන්ට ආරෝපණය කෙරෙන අනුපාත නොඉපයූ වාරික සඳහා ප්‍රතිපාදනයක් ලෙස විලම්භනය කෙරේ.

### *2.7.2 ගාස්තු හා අනෙකුත් ආදායම්*

ඔප්පු පරිපාලන සේවා ගාස්තු, ඔප්පු ගාස්තු හා අනෙකුත් ගිවිසුම් ගාස්තු වශයෙන් රක්ෂණ ගිවිසුම් ඔප්පු ලාභීන්ගෙන් ගාස්තු අය කරයි. මෙම ගාස්තු ලිඛිත පදනම මත ආදායම (අනෙක් ආදායම්) ලෙස හඳුනා ගනු ලැබේ.

### *2.7.3 පොලී ආදායම*

පොලී ආදායම උපචිත වන අවස්ථාවේ දීම සඵල පොලී අනුපාත ක්‍රමය භාවිත කරමින් ගණනය කර ආදායම් ප්‍රකාශය තුළ සටහන් කෙරෙනු ලැබේ.

## 2.8 ප්‍රතිලාභ, හිමිකම් සහ වියදම් හඳුනාගැනීම

### *2.8.1 දළ ප්‍රතිලාභ හා හිමිකම්*

හිමිකම් ඉල්ලීම සම්බන්ධ ක්‍රියාවලිය හා පියවීමට අදාළ අභ්‍යන්තර හා බාහිර හිමිකම් මෙහෙයුම් වලට අදාළව වසර තුළ වාර්තා වන සියළු හිමිකම් ඉල්ලීම්, අඛලි වටිනාකම් සහ අනෙකුත් අයවීම් සඳහා වන අඩු කිරීමක් සහ පෙර වසර වල හිඟව ඇති හිමිකම් සඳහා වන කවර හෝ ගැලපීම් රක්ෂණ හිමිකම් ඉල්ලීම් හි ඇතුළත් වේ.

### *2.8.2 වියදම් හඳුනා ගැනීම*

කාර්යක්ෂම ලෙස මණ්ඩලය පවත්වාගෙන යෑම මෙන්ම දේපළ, පිරියත උපකරණ නඩත්තු කිරීම මගින් හට ගන්නා සියලු වියදම් ශුද්ධ අතිරික්තය මත ආදායමට අයකර ඇත.

